# වාර්ෂික වාර්තාව 2010

National Water Supply & Drainage Board







ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

## දැක්ම

ව්‍යාපාර හා සේවා විශිෂ්ටත්වය තුළින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගිතා සංවිධානය බවට පත්වීම.

## මෙහෙවර

සමස්ත පාරිභෝගික ජනතාව තෘප්තිමත් කිරීම සහතික කරමින් ද ජල හා සනීපාරක්ෂක අවශ්‍යතාවලට තිරසාර විසඳුම් ලබා දෙමින් ද ජනතාවට සේවය සැලසීම.

## අරමුණු

- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
- පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම.
- වාණිජමය ශක්‍යතාවය වර්ධනය කිරීම.
- වගකීම හා විනිවිදභාවය පිළිබඳව සහතික වීම.
- ආයතනික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම / ඉහළ නැංවීම.
- ග්‍රාමීය හා අඩු පහසුකම් සහිත ජන කොටස් සඳහා පහසුකම් හා සේවා ලබාදීම.

# පටුන


වාර්තාව පිළිබඳ නිවේදනය 01
සභාපතිතුමාගේ ප්‍රකාශය 02

**සාමූහික පාලනය සහ සංඛ්‍යාලේඛන සමාලෝචනය**

ප්‍රධාන කළමණාකාරිත්වය 06
දැනට ක්‍රියාත්මක ජල සම්පාදන යෝජනා ක්‍රම 09
සාමූහික සැලසුම්කරණය 10
ප්‍රධාන කාර්යසාධනය 13
මෙහෙයුම් කටයුතු පිළිබඳ සාරාංශය 15
ආයෝජනය පිළිබඳ සාරාංශය 19
සේවකයින් 22

**ප්‍රවර්තනීය වාර්තාව**

පාරිභෝගික පහසුතාවන් 28
සේවා 29
නව ආරම්භයන් 30
ආදායම් නොලබන ජලය අඩු කිරීම / අවකරණය 31
බලශක්ති කළමනාකරණය 34
ආයතනික සංවර්ධනය 34
පර්යේෂණ හා සංවර්ධන කටයුතු 36
ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂාව 37
භූගත ජලය 38
සමාජ විද්‍යාත්මක කටයුතු 38
ප්‍රතිපත්ති සම්පාදනය 38
තොරතුරු තාක්ෂණය 39

**යටිතල පහසුකම් සංවර්ධනය**

නිර්මාණ අදියරේ පවතින ව්‍යාපෘති 42
2011 වර්ෂයේදී ආරම්භ වීමට නියමිත වූ ව්‍යාපෘති 60
යෝජිත ව්‍යාපෘති 61
ක්‍රම සම්පාදනය හා සැලසුම් 63
ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන 66

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 70
මූල්‍ය ප්‍රකාශයන් 73
2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව 96

කෙටි යෙදුම් 102
මූලික තොරතුරු 103







## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

මහජනතාවට පානීය ජලය සැපයීමේ වගකීම ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව යටතේ පැවති අතර පසුව 1965 වසරේදී එය ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පරිවර්ථනය විය. ඉන්පසුව 1975 වසරේදී පාර්ලිමේන්තු පනතකින් එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය බවට පරිවර්ථනය විය.

ජල සම්පාදන හා මලාපවහන කටයුතු වෙනම විෂය පථයකට පත්කිරීම සඳහා 2007 වර්ෂයේදී ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ස්ථාපිත කරනු ලැබූ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහනය මණ්ඩලය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජනගහනයෙන් 81% කට පමණ සුරක්ෂිත පානීය ජලය ලබාගැනීමේ හැකියාව පවතින අතර 31.6% පමණ ප්‍රතිශතයකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල සම්පාදන ක්‍රමවල නළ මාර්ග ඔස්සේ ජලය සැපයේ.

## වාර්තාව පිළිබඳ නිවේදනය

ගරු ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය,
තකාපි ගොඩනැගිල්ල,
නො. 34,
නාරාහේන්පිට පාර,
නාවල.

ගරු ඇමතිතුමණි,
වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශයන් – 2010
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් 2010 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශයන් හා වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට,
විශ්වාසී,

කරුණාසේන හෙට්ටිආරච්චි,
සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

2011 මාර්තු 01.

# සභාපතිතුමාගේ ප්‍රකාශය



ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සපයන වැදගත් ආයතනයක් වශයෙන් 2010 වර්ෂය තුළ ද එහි සේවා අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. මීට අමතරව මණ්ඩලය මගින් තෝරාගත් නාගරික ප්‍රදේශ සඳහා මලාපවහන පද්ධතින් ඇති කිරීමට උනන්දු වී ඇත. එමගින් ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය, ආර්ථික තත්ත්වය සහ සමාජ ගෘහසාධනයන් ඔවුන්ගේ ජීවනෝපා මාර්ග වැඩි දියුණු කිරීම කෙරෙහිත් දායකත්වය ලබාදී ඇත.

නියමිත ඉලක්ක සපුරාගැනීම පිණිස ක්‍රමෝපාය වශයෙන් සකස් කරන ලද 2007 – 2011 දක්වා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම සිව්වන වසර සඳහා ද ක්‍රියාත්මක විය. සැලැස්ම තුළින් කටයුතු මෙහෙයවීම සඳහා වැදගත් තීරණ ගැනීමේ අදහසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය මණ්ඩලයේ සාමාජිකයන් විසින් ත්‍රෛමාසිකව සමාලෝචනය කර බලන ලදි. 2012 සිට 2016 දක්වා ඊළග සංයුක්ත සැලැස්ම සැකසීමට මූලික පියවරවල් ගෙන ඇත.

අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා සැපයීම කෙරෙහිත් දශක කිහිපයක් පීඩනයට ලක්වූ උතුරු හා නැගෙනහිර පළාත්වල ජනාවාස ප්‍රදේශවල නව ව්‍යාපෘති සකස් කිරීම කෙරෙහිත් වර්ෂයේ වැඩ කටයුතුවලින් වැඩි කොටසක් යොමු කිරීමට සිදු විය.

ඉදිකිරීම් අදියරේ පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් අවශ්‍ය ප්‍රදේශ සඳහා නව ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති යෝජනා සකස් කිරීමත් 2010 වර්ෂයේදී සිදු විය. ඩෙන්මාර්ක් රජයේ ණය ආධාර යටතේ නුවරඑළිය දිස්ත්‍රික් නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ද ස්පාඤ්ඤයේ ආධාර ඇතිව අඹතලේ සහ මීගමුවේ ජල පිරිපහදු ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ඔස්ට්‍රියානු ණය ආධාර යටතේ දකුණු කොළඹ මලාපවහන පෝෂක ප්‍රදේශය පුනරුත්තාපනය කිරීම ද 2010 වර්ෂයේදී නිම කරන ලදි. ජා.ජා.ස.නි.ආ. ණය ආධාර සපයනු ලබන මහකොළඹ ජල පුනරුත්තාපන ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියර උපරිමයට ළගාවූ අතර වර්ෂය තුළ නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය ද (ජා.ජා.ස.නි.ආ. ) ආරම්භ කරන ලදි.

පවතින මුදල් සහ අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගෙන ජල සම්පාදනය සහ සනීපාරක්ෂක සේවා ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රාග්ධන ව්‍යාපෘති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ප්‍රාග්ධන වැඩ කටයුතු සඳහා අරමුදල් සැපයූ බහු පාර්ශ්වික සහ ද්වි පාර්ශ්වික ණයදෙන ආයතන වෙත අපගේ විශේෂ ස්තූතිය හිමිවේ. ආරම්භයේදී වර්ෂය වෙනුවෙන් සම්පූර්ණයෙන් රු. බිලියන 25 ක ප්‍රාග්ධන අරමුදල් වෙන් කරන ලද අතර ඉටු කරන ලද වැඩ වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන

ඇතුළුව රු.බිලියන 26.4 ක අරමුදල් ප්‍රමාණයක් වියදම් දරන ලදි.

ජල ගාස්තුව සංශෝධනය කිරීමෙන් තොරව 2010 වර්ෂයේදී අපගේ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකිවීම මෙහිලා සඳහන් කිරීම වැදගත් ය. සේවකයන් 54 දෙනෙකුගේ හිගයක් පැවතියදී අපගේ කාර්යයන් ඉටු කිරීමට හැකිවීම ද මෙහිලා සඳහන් කළ යුතුය.

පාරිභෝගිකයන්ට තම බිල්පත් ගෙවීමට හැකිව තිබූ ක්‍රම තවදුරටත් වැඩි කරන ලදි. කලින් ප්‍රකාශයට පත්කළ අනෙකුත් ක්‍රමවලට අමතරව කාගිල්ස්, කීල්ස් සුපර් මාකට්ස්, අබාන්ස් සහ සිංගර් ප්‍රදර්ශනාගාර මගින් ගෙවීම් සිදුකිරීමට අමතරව පාරිභෝගික ජනතාවගේ පහසුව පිණිස ජංගම දුරකථන ඔස්සේ කෙටි පණිවිඩ සේවා (SMS) තාක්ෂණය මගින් ගෙවීම් සිදුකිරීමට කටයුතු සලසන ලදි.

පාරිභෝගිකයන්ගේ දෝෂ සහගත ජලමනු වෙනුවට ජල මනු විශාල ප්‍රමාණයක් සපයන ලද අතර එමගින් පාරිභෝගිකයන් වෙත හැකිතාක් දුරට සත්‍ය බිල්පත් ලබාදීමට හැකිවිය.

අධික වර්ෂාවෙන් පීඩාවට පත්වූවන්ගේ පරිභෝජන අවශ්‍යතා සඳහා ජල බවුසර මගින් ජලය සැපයීමෙන් වර්ෂයේ දෙවැනි භාගය තුළ ඔවුන් මුහුණ පෑ දුෂ්කරතා මගහැරීමට ජා.ජ. හා ජ.ම. විසින් එහි සේවා පුළුල් කරන ලදි. 2010 ජනවාරි සහ අප්‍රේල් මාසවලදී පවත්වන ලද මැතිවරණ 2 ක් සඳහා සේවයේ යොදවන ලද ආරක්ෂක හමුදා ඇතුළුව ජංගම කාර්ය මණ්ඩලය වෙනුවෙන් ජල සම්පාදන පහසුකම් සැලසීම සිදුකළ යුතු විය.

උතුරුමැද පළාතේ වර්ධනය වන වකුගඩු රෝග මර්ධනය කිරීමේ විශේෂ අවධානයෙන් යුතුව වකුගඩු රෝගයට ලක්විය හැකි ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස පානීය ජලය බෝතල්වල ඇසිරීමේ යන්ත්‍රාගාරයක් ඉදි කිරීමට නව පියවරක් ලෙස තීරණය කර ඇත.

ගිණුම්ගත නොවූ ජලය අඩුකර ගැනීම ජා.ජ. හා ජ.ම. ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන කරුණකි. මෙම පරමාර්ථය මුදුන්පත් කරගැනීම සඳහා වර්ෂය තුළ ව්‍යාපෘති සහ යෝජනා කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අවසානයේදී ගි.නො.ජ. දිප ව්‍යාප්තව 29% ක් ලෙස පැවතුණි. 2010 වර්ෂය අවසානයේදී කොළඹ නගරයේ ගි.නො.ජ. 42% ක් විය.

මෙහෙයුම් කටයුතුවල අධික බල ශක්ති පිරිවැය අඩුකර ගැනීමේ අභිලාශයෙන් බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව තීරණය කිරීම සඳහා බල ශක්ති විගණන සිදු කිරීමේ ක්‍රියා මාර්ග අනුගමනය කරන ලදි.

පද්ධති පුනරුත්තාපනය වෙනුවෙන් මුදල් අවශ්‍යතා සඳහා මහා භාණ්ඩාගාරය මත අඩුවෙන් යැපීමට පද්ධති පුනරුත්තාපනය සඳහා මුදල් ඉපයීමට නව ක්‍රමෝපායන් ආරම්භ කිරීම අපගේ පරමාර්ථය වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යභාරය ඉටුකර ගැනීම සඳහා වර්ෂය තුළ ජල සම්පාදන හා ජලාපවහන ගරු අමාත්‍යවරයාගේ කාලෝචිත මෙහෙයවීම් සහ මග පෙන්වීම් සම්බන්ධයෙන් අපගේ කෘතඥතාවය හිමිවේ. එසේම, අපගේ ප්‍රධාන කොටස්කරුවන් හට අමාත්‍යාංශයේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් දක්වන ලද සම්බන්ධීකරණය හා සහයෝගය වෙනුවෙන් ද අපි ස්තූතිවන්ත වෙමු. මණ්ඩලයේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම කෙරෙහි සාමාන්‍යාධිකාරිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය කැපවීමෙන් සේවය කිරීම සහ සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ස්තූතිය පළකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ සේවා වැඩි දියුණු කර ගැනීමෙහිලා හිටපු සභාපති වන වන්න අමරසිංහ මහතා දරන ලද ප්‍රයත්නය වෙනුවෙන් මගේ අවංක ස්තූතිය ද හිමිවේ.

අපගේ ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම සඳහා පානීය ජලය සහ මලාපවහන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් අපගේ සේවා වර්ධනය කරගැනීම උදෙසා අප විසින් ඵලදායී පියවරවල් ගනු ලැබේ. පාරිභෝගික ජනතාවගේ පහසුව තකා අප සමග කටයුතු කිරීමේදී සරල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සඳහා උත්සුක වන්නෙමු. අපගේ සේවා සැපයීමේදී අපගෙන් ප්‍රමාද දෝශයන් සිදුවී ඇතොත් ඒ පිළිබඳව අදාළ අයගෙන් සමාව අයැද සිටිමු. ඒ අතරම අපගේ සේවා ලබාගන්නා සියලුම දෙනාටම වඩා හොඳ හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග හැකිතාක් දුරට අනුගමනය කරන්නෙමු.

කරුණාසේන හෙට්ටිආරච්චි,
සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
2011 මාර්තු 01.



අතීතයේදී,
අපේ මුතුන්මිත්තන් විසින්
ජල සම්පත
ආරක්ෂා කරන ලදී.
අපි ද
පරිසරය ආරක්ෂා කරමින්
ප්‍රමාණවත්
පානීය ජල සම්පත
වෙනුවෙන් කටයුතු කරමු.

# සාමූහික පාලනය සහ සංඛ්‍යාලේඛන සමාලෝචනය



ජලය අගනේ ය.
එය සකසුරුවම් ලෙස
පාවිච්චි කරන්න.

# ප්‍රධාන කළමණාකාරිත්වය




## අධ්‍යක්ෂ මණ්ඩලය

- 01. සභාපති
- 02. උප සභාපති
- 03. ක්‍රියාකාරී අධ්‍යක්ෂ
- 04. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 05. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 06. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 07. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 08. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 09. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 10. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 11. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

- 12. සාමාන්‍යාධිකාරී
- 13. අතිරේක සාමාන්‍යාධිකාරීවරු
- 14. අංශභාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
- 15. පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
- 16. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් හා ව්‍යා. අධ්‍යක්ෂ

## අධ්‍යක්ෂ මණ්ඩලය

01. ඉංජිනේරු එස්. සී. අමරසිංහ මහතා
B.Sc. Eng., Dip. Business Mgt., C.Eng,
FIEE (Lond), FIE (SL)
සභාපති, ජා. ජ. ස. හා ජ. ම. (2010.05.12 තෙක්)

01. ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා
B.Sc. Eng.(Hons.), M.Sc.(Leuven), C.Eng,
MIE (SL)
සභාපති, ජා. ජ. ස. හා ජ. ම. (2010.05.12 සිට)

02. වෛද්‍ය ඒ. උතුමාලෙබ්බේ මහතා
DIMS(Cey), DFC(USA)
උප සභාපති, ජා. ජ. ස. හා ජ. ම. (2010.05.11 තෙක්)

02. කේ.ඩී. ගාමිණි ගුණරත්න මහතා
උප සභාපති, ජා. ජ. ස. හා ජ. ම. (2010.05.21 සිට)

03. ඉංජිනේරු එම්.එස්. නසීර් මහතා
B.Sc. Eng.(SL), M.Sc.Eng.(UK)
ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජා. ජ. ස. හා ජ. ම. (2010.05.07 තෙක්)

03. එන්.පී. තිබ්බුටුමුණුව මහතා
LLB, BA
ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජා. ජ. ස. හා ජ. ම. (2010.09.20 සිට)

04. එච්.පී.සී. හේරත් මහතා (2010.04.23 තෙක්)
B.Sc. (Economics), MBA(Colombo)
ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

05. වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක මහතා (2010.05.26 සිට)
MBBS(Colombo), M.Sc.(Medical Administration)
ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය

06. එච්. ඒ. අමරසේන මහතා (2010.02.12 තෙක්)
නීතිඥ

07. ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය (2010.04.27 තෙක්)
B.A.Hons.(Economics), Peradeniya
M.Sc.(Agricultural Development Economics) ANU(Australia)
M.A.(Economics) OSU,USA,
Ph.D.(Agricultural Economics) OSU, USA.
අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

08. වෛද්‍ය පී. ජී. මහිපාල මහතා(2010.05.26 සිට)
MBBS, M.Sc., MD, MBA, DBS, DED, DPM, D(Mgt.)
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය.

09. ජේ. එච්. ජේ. ජයමහ මහතා (2010.11.30 තෙක්)
B.Sc.(Hons.) Kelaniya, M.Phil (Glasgow)
අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

10. ඒ. කේ. සෙනෙවිරත්න මහතා (2010.05.16 සිට)
B.Sc.(Hons.), PGD (Business & Financial Administration)
අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

11. සනත් පනාවැන්නගේ මහතා (2010.12.29 සිට)
M.Sc, MBA, C.Eng. MIE (SL), MIET (UK)
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි,
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

කේ. කේ. චන්ද්‍රසිරි මහතා,
B.Sc.(Hons.) Business Administration
PGD (Foreign Affairs), MIM (SL)

2010 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 15ක් පවත්වන ලදි.

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

12. සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු කේ. එල්. එල්. ප්‍රේමනාත් මහතා
B.Sc. Eng.(Hon), DSE(Netherlands), M.Eng.
(Const.Management), C.Eng., FIE (SL)

13. අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්
ඉංජිනේරු එස්. කේ. විජේතුංග මහතා
(බටහිර)
B.Sc. Eng. C.Eng., MIE (SL)
P. G. Dip in Sanitary Eng. (Delft.)

ඉංජිනේරු බී.ඩබ්.ආර්. බාලසූරිය මහතා
(ජල සම්පාදන ව්‍යාපෘති)
B.Sc.Eng.(Hon), M.Sc.(UK), C.Eng. MIE (SL)

ඉංජිනේරු පී.ඒ. කුමාරරත්න මහතා
(මලාපවහන)
B.Sc. Eng.(Hon), M.Sc.(UK), C.Eng., FIE (SL)
MICE (Lond.), MIWEM (Lond.)

ඉංජිනේරු පී. එස්. මුණසිංහ මහත්මිය
(සාමූහික සේවා)
B.Sc. Hon.( Civil Eng.), DSE(Netherlands)
Dip.in Bus.& Fin. Admin.FIE (SL)
MICE (Lond)

ඉංජිනේරු ටී. පී. ලමාබදුසූරිය මහත්මිය
(දකුණු/නැගෙනහිර)
B.Sc. Eng., FIE (SL), M.Sc. in Water & Waste
Eng.(UK), C.Eng.

ඉංජිනේරු ඩී.එන්.ජේ. ෆර්ඩිනැන්ඩෝ මහතා
(ප්‍රතිපත්ති හා සැලසුම්)
Eng.(Hon), C.Eng., FIE (SL), MCIWEM (UK)
MICE(Lon.)

ඉංජිනේරු පී.එන්.එස්. යාපා මහත්මිය
(උතුරු/මධ්‍යම)
B.Sc. Eng. FIE (SL), C.Eng.M.Sc.(Struc.E.),UK

14. අංශභාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

ඉංජිනේරු කේ.ටී.පී. ප්‍රනාන්දු මහත්මිය
(ව්‍යාපෘති සම්බන්ධීකරණය)
B.Sc. Eng.(Hons.), MIE (SL), C.Eng.
M.Sc. in Water & Waste Eng.(UK)

ඩී. තොටවත්ත මහතා(බටහිර දකුණ)
(මුදල්)
B.Co.(Sp.), ACA, MA(Fin.Econ)

එච්. ආරියසේන මහතා
(පිරිස් හා පාලන)
B.Sc. (Business Administration) Sp.
Dip.in Personnel Management

ඉංජිනේරු ඒ.ඩබ්. ගුණසේකර මහතා
(වාණිජ)
B.Sc. Eng.(Hons.), M.Eng. C.Eng.
MICE(Lon.), MBA

ඉංජිනේරු එන්.එම්.එස්. කාලිංග මහතා
(යාන්ත්‍රික හා විදුලි)
B.Sc. Eng.(Hons.), MIE (SL), C.Eng.
Dip. Sanitary Eng.(Netherlands)

ඉංජිනේරු කේ.ටී. කරුණාදාස මහතා
(තොරතුරු තාක්ෂණය)
B.Sc. (Eng.), C.Eng., MIE (SL)
P.G.Dip. in Hydrology (Delft.)
P.G.Dip. in Computer Technology,
(University of Moratuwa- SL)
C.Eng., FIE(SL), Int. PE (SL)

ඉංජිනේරු පී.කේ. ශ්‍රීමාල් මහතා
(සංවර්ධන)
M.Sc. Mech.Eng.(USSR), M.E.Hyd.(India)
C.Eng., MIE (SL)
Exe. Dip. in Bus.Admin.(Colombo), Dip in HRM

ඉංජිනේරු ඩී.එස්.ඩී. ජයසිරිවර්ධන මහතා
(ක්‍රම සම්පාදන හා සැලසුම්)
B.Sc. (Eng.) Hons., C.Eng., FIE(SL)
M.PH.(Univ. of Hawaii)

ඉංජිනේරු ආර්.එස්.සී. ජෝර්ජ් මහතා
(සාමූහික සැලසුම්)
B.Sc. Eng.(Hon.), C.Eng., MIE (SL)
M.Sc.(Eng.), FRG, MICE (UK)

ඩබ්.ඒ.ජේ. වීරසිංහ මහතා
(අභ්‍යන්තර විගණන)
Fellow of the Institution of Public Finance & Development Accountancy

15. පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

ඉංජිනේරු ඩබ්ලිව්. බී. ජී. ප්‍රනාන්දු මහතා
(බටහිර - මධ්‍යම)
B.Sc. (Eng). P.G.Dip. (EWREM), FIE (SL),C.Eng.

ඉංජිනේරු කේ.ආර්. දේවසුරේන්ද්‍ර මහතා
(බටහිර - දකුණ)
B.Sc. Eng.(Hons.), FIE, C.Eng.
P.G.Dip. (Sanitary Eng.- Delft.)

ඉංජිනේරු එම්.කේ. බණ්ඩාර මහත්මිය
(බටහිර - උතුර)
B.Sc. Eng.(Hons.) MIE (SL)
M.Eng.(Sc) in Public Health Eng.(NSW),Australia

ඉංජිනේරු එම්.ඒ.එම්.එස්.එල්. අත්තනායක මහතා
(මධ්‍යම)
B.Sc. Eng. MIE (SL), C.Eng.
P.G.Dip.(Land & Water), MBA

ඉංජිනේරු ඩබ්.ඒ.එන්. වික්‍රමතුංග මහතා
(සබරගමුව/ඌව)
B.Sc. Eng. MIE (SL), C.Eng.

ඉංජිනේරු එල්.එල්.ඒ. පීරිස් මහතා
(උතුරු මැද)
M.Phil(IWRM),University of Peradeniya.SL
P.G.Dip.(Water & Wastewater Eng.) AIT Bangkok
B.Sc.(Eng.) Civil Eng.
MS Certified Professional, M.Sc.(IT)

ඉංජිනේරු ඩී.යූ. සුමනසේකර මහතා
(වයඹ)
B.Sc. Eng.(Hon.), M.Sc.(Netherlands), C.Eng.,
FIE(SL)

ඉංජිනේරු ටී.ඩබ්.එස්. පෙරේරා මහතා
(දකුණ) - වැඩබලන
B.Sc. Eng., MIE (SL), C.Eng.

ඉංජිනේරු එම්.කේ. හපුආරච්චි මහතා
(නැගෙනහිර)
C.Eng., MIE (SL)
P.G.Dip. in Environmental Eng. Mgt.

ඉංජිනේරු ඩී.එෆ්.එස්. ද එෆ්. ගුණවර්ධන මහතා
(උතුර)
B.Sc. Eng., C.Eng., MIE (SL), M.Eng.IHE.(Delft)

16. ඉංජිනේරු සී.ජේ.ඩී. පෙරේරා මහත්මිය
(ව්‍යා.අ. කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය
i පියවර ii අදියර )
B.Sc. Eng.(Hon.), MIE (SL), C.Eng.,
Dip.Sanitary Eng.(Netherlands),
Dip.Environmental Eng.(SL)

ඉංජිනේරු ජේ.ආර්.බී. නැදුරන මහතා
(ව්‍යා.අ.ආ.ස.බැ. 5වැනි ව්‍යාපෘතිය)
B.Sc. Eng.(Hon.),
P.G. Dip. in Environmental Seience & Technology
(Delft.), MIE (SL), C.Eng.

# දැනට ක්‍රියාත්මක ජල සම්පාදන යෝජනා ක්‍රම

| පළාත/ප්‍රා.ස.සේ.ම | ජ.ස.ක්‍ර සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 47 |
| නැගෙනහිර | 31 |
| උතුරු මැද | 22 |
| වයඹ | 31 |
| උතුර | 28 |
| සබරගමුව | 19 |
| දකුණ | 51 |
| ඌව | 34 |
| බස්නාහිර - මධ්‍යම | 13 |
| බස්නාහිර - උතුර | 22 |
| බස්නාහිර - දකුණ | 17 |
| එකතුව | 315 |



# සාමූහික සැලසුම්කරණය

“සංයුක්ත සැලැස්ම මගින් නියම කර ඇති අරමුණු සහ පරමාර්ථ සපුරාගැනීමෙහි ලා කටයුතු කිරීම මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කරන ලදි. ඉකුත් වර්ෂවල සිට පසු විපරමක් වශයෙන් සැලැස්මේ සිව්වන වසරට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය, කාර්ය පරිපාටි නියම කිරීම සහ සැලසුම්කරණය පිළිබඳව විශේෂ අවධාරණයකින් කටයුතු කරන ලදි.”

## 2007-2011 දක්වා සාමූහික සැලැස්මේ ක්‍රියාත්මකභාවය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සංයුක්ත සැලැස්මේ සිව්වැනි වසර ය. මෙම සංයුක්ත සැලැස්ම ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ජපන් බැංකුවේ සහය ලබාගෙන 2006 සැප්තැම්බර් මාසයේදී සකස් කරන ලදි.

සංයුක්ත සැලැස්ම මගින් නියම කර ඇති අරමුණු සහ පරමාර්ථ සපුරාගැනීමෙහිලා කටයුතු කිරීම මණ්ඩලය විසින් අඛණ්ඩව සිදු කරන ලදි. ඉකුත් වර්ෂවල සිට පසු විපරමක් වශයෙන් සැලැස්මේ සිව්වන වසරට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්පාදනය, කාර්ය පරිපාටි නියම කිරීම සහ සැලසුම්කරණය පිළිබඳව විශේෂ අවධාරණයකින් කටයුතු කරන ලදි.

නියමිත අරමුණු, පරමාර්ථ සහ ඉලක්ක සාර්ථක ලෙස සපුරාගැනීම සම්බන්ධයෙන් කාලීනව සමාලෝචනය කර බැලීම වැදගත්වන බව තීරණය කරන ලදී. අපගේ සංයුක්ත සැලැස්ම ලබා ඇති ප්‍රගතිය සමාලෝචනය කර බැලීම සඳහා කළමනාකාරීත්වය කාර්ය මණ්ඩලයේ සහ අනෙකුත් කොටස්කරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව 2009 වර්ෂයේ ජූනි මාසයේදී වැඩමුළුවක් පවත්වන ලදී. එය වූ කලී, 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඔබ්බට මිනුම් කළහැකි ඉලක්ක නියම කිරීමට ද හැකිව තිබූ තෙවැනි වසරේ පළමු කාර්තුව අවසානය විය. එසේ නමුත්, මෙම වසර, වර්තමාන පස් අවුරුදු සංයුක්ත සැලැස්මේ සිව්වන වසර බැවින් තවත් වසර 5 ක කාල පරිච්ඡේදයක් සඳහා නව සංයුක්ත සැලැස්මක් සැකසීමට කටයුතු කර ඇත. මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 15 දෙනෙකුගෙන් සමන්විත වන විශේෂ කමිටුවක් මේ සඳහා සාමාන්‍යාධිකාරීවරයා විසින් පත් කරන ලද අතර ඒ පිළිබඳව කටයුතු සිදු වෙමින් පවතී.

එක් තෝරාගත් කළමණාකරුවකු විසින් නිශ්චිත අරමුණු (එවැනි අරමුණු හතක් තිබෙන අතර නියමිත වගකිව යුතු කළමනාකරුවකු විසින් එක් එක් අරමුණ අධීක්ෂණය කරනු ලබයි.) සඳහා සංයුක්ත කාර්ය සැලසුම් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රගතිය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව, 2010 වර්ෂයේදී පැවති මණ්ඩල රැස්වීම්වලදී සංයුක්ත කාර්ය සැලසුම් පිළිබඳව පළමුවන, දෙවන සහ තුන්වැනි ත්‍රෛමාසික ප්‍රගති වාර්තා අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කරන ලදී.

ආයතනික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සංයුක්ත අරමුණකි. මෙම අගනා අරමුණ සපුරාගැනීමට සැලසුම් කරන ලද කටයුතු අතර සේවකයන්ගේ කාර්ය සාධනය පදනම් කරගෙන එම සේවකයන් වෙනුවෙන් “සේවක අභිනන්දන ප්‍රණාම උළෙල” මැයෙන් සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයක් මධ්‍යම ප්‍රා.ස.සේ.ම. විසින් පවත්වන ලදී.



මණ්ඩලයේ සභාපතිවරයා විසින් සේවක ප්‍රණාම බෙදාදීම

## නිශ්චිත අරමුණු සම්බන්ධව ප්‍රගතිය

| අරමුණ | | ප්‍රධාන පරමාර්ථ | 2010 වර්ෂයේ අවසන ඉලක්ක | 2010 වර්ෂයේ අරමුණු සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1. ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වර්ධනය කිරීම. | 1.1 | සම්පූර්ණ නළ ජල සම්පාදන සේවා ආවරණය | 38.2% | 39.2% |
| | 1.2 | නළ මගින් මලාපවහන සේවා ආවරණය | 2.7% | 2.5% |
| | 1.3 | සුරක්ෂිත පානීය ජල සම්පාදනය | 81.4% | 81.0%* |
| | 1.4 | සම්පූර්ණ සනීපාරක්ෂක ආවරණය | 86.5% | 85.7%* |
| 2. මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 2.1 | ආදායම් නොලබන ජලය (දිප ව්‍යාප්තව) | 31.0% | 31.6% |
| | 2.2 | ජල සම්බන්ධතා 1000 ක් සඳහා මුළු කාර්ය මණ්ඩලය | 7.1 % | 6.7% |
| | 2.3 | මුළු පුනරාවර්තන පිරිවැයට විදුලිබලය සඳහා වියදම | 22.0% | 20.8% |
| | 2.4 | මුළු පුනරාවර්තන පිරිවැයට නඩත්තු වියදම් | 7.0% | 4.7% |
| | 2.5 | මුළු පුනරාවර්තන පිරිවැයට ආයතන වියදම් | 10.0% | 10.7% |
| 3. පාරිභෝගික තෘප්තිය ඇති කිරීම | 3.1 | මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පාසැල්/වෙනත්) | 25 | 25 |
| 4. වාණිජ ශක්‍යතාව වර්ධනය කිරීම | 4.1 | මුල් බිල්පත් සංඛ්‍යාවට ඇස්තමේන්තු කළ බිල්පත් ප්‍රමාණය | 6.0% | 3.0% |
| | 4.2 | අය එකතු කිරීමේ කාර්යක්ෂමතාවය | 100.0% | 104.0% |
| | 4.3 | අයවිය යුතු ගිණුම් | | |
| | | (අ) ගෘහස්ත සහ වාණිජ ආයතන | දින 50 | දින55 |
| | | (ආ) රජයේ ආයතන | දින 60 | දින44 |
| 5. වැඩි වගකීම පිලිබඳ වගබලා ගැනීම | | මානව සම්පත් සංවර්ධනය කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ව්‍යාපාර සැලසුම පිලිබඳව ව්‍යාපාර කටයුතු සහ සමස්ත කළමනාකරණ පරාසය සංවර්ධනය සඳහා මූලික පියවරවල් ගන්නා ලදී.# <br>• මූල්‍ය බලය විමධ්‍යගත කිරීම <br>• අයවැය පාලනය සහ මුදල් රෙගුලාසි පිලිබඳ පුහුණුව <br>• වාණිජ මෙහෙයුම් පිලිබඳ විගණනය <br>• ගබඩා හා සැපයුම් පිලිබඳ විගණනය. <br>• මුදල් / චෙක්පත් ගෙවීම පිලිබඳ විගණනය <br>• ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිලිබඳ විගණනය <br>• වත්කම් තක්සේරු කිරීම <br>• වැඩිදියුණු කළ කළමනාකරණ තොරතුරු හා සම්බන්ධීකරණය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. | ආයතනික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම | 6.1 | අභ්‍යන්තර පුහුණු වැඩසටහන් | 160 | 166 |
| | | 6.2 | රට තුළ බාහිර පුහුණුව (පුද්ගලයන් සංඛ්‍යාව) | 250 | 132 |
| | | 6.3 | විදේශ පුහුණුව (පුද්ගලයන් සංඛ්‍යාව) | 80 | 69 |
| 7. | ග්‍රාමීය හා අඩු පහසුකම් සහිත ජනතාවට පහසුකම් හා සේවා ආධාර සැපයීම | 7.1 | ජා.ජ. හා ජ.ම. පසු විපරම යටතේ ප්‍රජා මූලික සංවිධාන මගින් පවත්වාගෙන යනු ලබන ග්‍රා.ජ.ස. ක්‍රම | 5.5% | 5.7% |

* යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක හැර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2006, 2007 වර්ෂවල සිදුකළ නියැදි සමීක්ෂණයකින් සනීපාරක්ෂාව සඳහා 96.7% ද ජල සම්පාදනය සඳහා 83.1% ක්ද වශයෙන් ඇස්තමේන්තු කරන ලදී.

# ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ සහාය ඇතිව ජා.ජ හා ජ.ම. සඳහා පස් අවුරුදු ව්‍යාපාර සැලැස්ම සංවර්ධනය කිරීම අවසන් කර කළමනාකාරිත්වය මගින් එය සමාලෝචනය කරමින් තිබේ.

# ප්‍රධාන කාර්ය සාධනය

"නළ ජල සම්පාදන ආවරණය සඳහා පැවති ඉලක්ක සම්පූර්ණයෙන්ම පාහේ සපුරාගෙන ජා.ජ. හා ජ.ම. විසින් පානීය නළ ජලය සපයන ලද ජනගහනය 31.6 % දක්වා ලඟා කර ගැනීමට නව ජල සේවා සම්බන්ධතා 87245 වර්ෂය තුළ සපයන ලදී."

නළ ජල සම්පාදන ආවරණය සඳහා පැවති ඉලක්ක සම්පූර්ණයෙන්ම පාහේ සපුරාගෙන ජා.ජ. හා ජ.ම. විසින් පානීය නළ ජලය සපයන ලද ජනගහනය 31.6 % දක්වා ලඟා කර ගැනීමට නව ජල සේවා සම්බන්ධතා 87245 ක් වර්ෂය තුළ සපයන ලදී.

රටේ විවිධ පළාත්වල මහා පරිමාණ සහ කුඩා ජල සම්පාදන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමෙන් දැනට පවතින පාරිභෝගික ජනතාව සඳහා සේවා මට්ටම් වැඩිදියුණු කරන ලදී. සුනාමි උවදුරේ බලපෑමට ලක්වූ වෙරළබඩ ප්‍රදේශවලත් උතුර සහ නැගෙනහිර ප්‍රදේශවලත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ජල සම්පාදන හා මලා-පවහන පහසුකම් පුනරුත්ථාපනය කර ප්‍රතිසංස්කරණය කිරීම තුළින් පීඩාවට පත්වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කරන ලදී. එම ව්‍යාපෘති හානියට පත්වූ උපයෝගිතා යථා තත්වයට පත් කිරීම සඳහා සීමා නොවූ අතර ජනතාව නැවත පදිංචි කළ ප්‍රදේශ සඳහා ජල සම්පාදන සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීමට ද උවදුරු බලපෑ ප්‍රදේශවල සේවා මට්ටම් වැඩිදියුණු කිරීම් ද ආසන්නයේ පිහිටි නව සංවර්ධන ප්‍රදේශ සඳහා සේවා ව්‍යාප්ත කිරීම ද ඇතුළත් විය.

කාර්ය මණ්ඩලය බඳවාගැනීම් පාලනය කරන ලද අතර ජල සේවා සම්බන්ධතා දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 6.7 දක්වා අඩු කරන ලදී. 2010 වර්ෂය තුළ ජා.ජ. හා ජ.ම. ආයතනික සංවර්ධන කටයුතුවල ක්‍රියාකාරි ලෙස නිරත විය. (වැඩි විස්තර සඳහා 34 පිටුව බලන්න)

වසර 4 කට පසු 2009 වර්ෂයේ පෙබරවාරි මැද සිට ජල ගාස්තු ප්‍රතිශෝධනයක් සිදු කරන ලදී. කෙසේ වුව ද මෙහෙයුම් වියදම්වල වැඩිවීමත්, ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට නියමිත ණය සේවා නිසාත්, වසර 4 කින් ජල ගාස්තු වැඩි නොකිරීමත් නිසා මුදල් හිගයක් සැලකිය යුතු ලෙස නිර්මාණයවීම හේතුවෙන් මණ්ඩලයේ මුදල් ප්‍රවේශමෙන් පාලනය කිරීමට සිදුවිය. 2009 සහ 2010 වර්ෂ සඳහා අදාල ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට නියමිත ණය සම්පූර්ණයෙන් පියවීමට නොහැකි විය.

ආදායම් නොලබන ජල සැපයුම සඳහා අනවසර වූ වතු ජනාවාස හා බිල්පත් නොමැති ජල සැපයුම ද කොළඹ ප්‍රදේශයේ මහජන සනීපාරක්ෂක පහසුකම් සැලසීම ද ඇතුළත් වේ. කලින් කොළඹ මහ නගර සභාව විසින් සපයන ලද මෙම සේවාවන් ජා.ජ. හා ජ. මණ්ඩලයට පවත්වාගෙන යෑමට බලපෑම් කෙරේ. අනවසර වූ ද බිල්පත් නොමැතිව කොළඹ නගරය තුළ ජල සැපයුම (ජල සම්පාදනයෙන් 11% ක් වශයෙන් තක්සේරු කර ඇති) බැහැර කළහොත් කොළඹ නගරයේ ගිණුම්ගත නොවන ජල ප්‍රමාණය 42% කි. අනවසර වූ ද බිල්පත් නොමැතිව කොළඹ නගරය තුළ ජල සැපයුම බැහැර කළහොත් බස්නාහිර පළාත තුළ ආදායම් නොලබන ජල සැපයුම 30% ක් සහ ජාතික මට්ටමින් 29% ක් වේ. සාමාන්‍යයෙන් 2009 වර්ෂය තුල පවත්වාගෙන යන ලද ආදායම් නොලබන ජල සැපයුම 2010 වර්ෂය තුළ ද එම මට්ටමින්ම පැවතුණි.

## සාමාන්‍ය කරුණු

ජා.ජ. හා ජ. මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ සහ කුඩා ජල සම්පාදන ක්‍රම 315 ක් පවතී. මෙම ජල සම්පාදන ක්‍රම අතරින් ජල සම්පාදන ක්‍රම 31 කින් ප්‍රධාන නගර ආවරණය වන අතර ජල සම්පාදන ක්‍රම 284 කින් කුඩා නගර සහ ගම්මාන ආවරණය වේ.

ජනගහණයෙන් 8% ක පිරිසකට අත් පොම්ප සහිත නළ ළිං මගින් ජලය සැපයේ. ප්‍රජා මූලික සංවිධාන මගින් ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම සම්බන්ධයෙන් ප්‍රජා කළමනාකරණය ප්‍රවර්ධනය කෙරේ. ප්‍රමිතියට ඉදි කරන ලද වැසි ජල ටැංකි ද විකල්ප පානීය ජල මූලාශ්‍රයක් ලෙස සලකනු ලැබේ.

| වැදගත් සංඛ්‍යාලේඛන- ජල සම්පාදනය | | 2009 | **2010** | වෙනස % |
|---|---|---|---|---|
| ජල සම්පාදන ක්‍රම | | 312 | **315** | 1.0 |
| නළ ජලය නිෂ්පාදනය (ඝ.මී. මිලියන) | | 449 | **469** | 4.5 |
| ගෘහස්ථ ජල සැපයුම් සම්බන්ධතා | | | | |
| | අ. බස්නාහිර පළාත | 575,852* | **599,846** | 4.2 |
| | ආ. අනෙකුත් පළාත් | 590,784* | **648,330** | 9.7 |
| **මුළු ගෘහස්ථ ජල සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව** | | 1,166,636 | **1,248,176** | 7.0 |
| පොදු ජල කරාම සංඛ්‍යාව | | | | |
| | අ. බස්නාහිර පළාත | 4,411# | **4,375** | (0.8) |
| | ආ. අනෙකුත් පළාත් | 2,757 | **2,541** | (7.8) |
| **මුළු පොදු ජල කරාම සංඛ්‍යාව** | | 7,168 | **6,916** | (3.5) |
| **මුළු ගෘහස්ථ නොවන ජල සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව** | | | | |
| | අ. බස්නාහිර පළාත | 47,592 | **50,087** | 5.2 |
| | ආ. අනෙකුත් පළාත් | 44,932 | **48,394** | 7.7 |
| **මුළු ගෘහස්ථ නොවන ජල සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව** | | 92,524 | **98,481** | 6.4 |
| **මුළු ජල සැපයුම් සේවා සම්බන්ධතා සංඛ්‍යාව** | | 1,266,328 | **1,353,573** | 6.9 |
| පවුලක සාමාන්‍ය මාසික ජල පරිභෝජනය | | | | |
| නිවාස සම්බන්ධතාව ඝ.මී. | අ. බස්නාහිර පළාත | 17.25 | **17.14** | (0.6) |
| | ආ. අනෙකුත් පළාත් | 13.53 | **13.18** | (2.6) |
| පවුලක මසක සාමාන්‍ය ගාස්තු ප්‍රමාණය (රු.) | | | | |
| | අ. බස්නාහිර පළාත | 530.92 | **566.17** | 6.6 |
| | ආ. අනෙකුත් පළාත් | 294.56 | **310.23** | 5.3 |
| මුළු ආදායම (රු. මිලියන) (එකතු කළ අගය මත බදු සමඟ) | | 11,116 | **12,409** | 11.6 |
| මුළු පුනරාවර්තන වියදම් (රු.මිලියන) | | 9,186 | **10,537** | 14.7 |
| ආදායම් නොලබන ජල සැපයුම ( % ) | | | | |
| | අ. බස්නාහිර පළාත | 34.38 | **34.82** | 1.3 |
| | ආ. අනෙකුත් පළාත් | 25.93 | **26.65** | 2.8 |
| | ඇ. දීප ව්‍යාප්ත | 31.07 | **31.55** | 1.5 |
| මෙ. හා. න. කාර්ය මණ්ඩලය / ජල සැපයුම් සම්බන්ධතා 1,000 | | 5.89 | **5.52** | (6.3) |
| මුළු කාර්ය මණ්ඩලය / ජල සැපයුම් සම්බන්ධතා 1,000 | | 7.16 | **6.66** | (7.0) |
| නිෂ්පාදනයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය (ඝ. මී. ට රු.) | | 20.48 | **22.42** | 9.5 |
| අය ලබාගැනීමේ කාර්යක්ෂමතාවය | | 0.94 | **1.00** | 6.4 |
| ගැඹුරු ළිං | අ. කණින ලද ළිං | 622 | **299** | (51.9) |
| | ආ. සාර්ථකවූ ළිං | 492 | **243** | (50.6) |
| සංවර්ධන වියදම (රු .මිලියන) | | 21,136 | **26,389** | 24.9 |

| වැදගත් සංඛ්‍යාලේඛන - මලාපවහනය | | | |
|---|---|---|---|
| දෙහිවල ගල්කිස්ස මලාපවහන පද්ධතියේ මලාපවහන සම්බන්ධතා | 2,168 | **2,221** | 2.4 |
| කොලොන්නාව මලාපවහන පද්ධතියේ මලාපවහන සම්බන්ධතා | 1,339 | **1,488** | 11.1 |
| ආයතනික මලාපවහන සම්බන්ධතා | 7 | **7** | - |
| මහ කොළඹ නිවාස යෝජනාක්‍රමවල මලාපවහන සම්බන්ධතා | 2,290 | **2,290** | - |
| මහ කොළඹ ප්‍රදේශයෙන් පිටත නිවාස යෝජනා ක්‍රමවල සහ මහ කොළඹ මලාපවහන අංශය මගින් පවත්වාගෙන යනු ලබන මලාපවහන සම්බන්ධතා | 4,631 | **4,631** | - |
| **මුළු මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව** | 10,435 | **10,637** | 1.9 |

සටහන:

★ මණ්ඩලයේ හා රජයේ නිවාස ඇතුළුව සංඛ්‍යාව යාවත්කාලීන කරන ලදි.

\# 2008 වර්ෂයේ අවසානයේදී සිදුකළ සමීක්ෂණයක් හේතුවෙන් 2009 වර්ෂයේ ජනවාරි මාසයේදී මෙම අගය නිවැරදි කරන ලදි.

# මෙහෙයුම් කටයුතු පිළිබඳ සාරාංශය

“අඹතලේ, ලබුගම, කලටුවාව සහ කලුතර කඳන යන මධ්‍යස්ථාන හතර මගින් නිෂ්පාදනය කරන ජල ධාරිතාවෙන් විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාතේ ජල සම්පාදන පද්ධතිය මගින් බෙදා හරින අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන සමස්ත ජල ප්‍රමාණයෙන් 60% කි.”

## ජල සම්පාදනය

### පානීය ජල නිෂ්පාදනය

2010 වර්ෂයේදී නිෂ්පාදනය කළ සමස්ත පානීය ජල ප්‍රමාණය ඝ.මී. මිලියන 470 කි. පසුගිය වසර 10 තුළ ප්‍රවනතාවය සටහනේ දැක්වේ. අඹතලේ, ලබුගම, කලටුවාව සහ කලුතර කඳන යන මධ්‍යස්ථාන හතර මගින් නිෂ්පාදනය කරන ජල ධාරිතාවෙන් විශාල ජල ප්‍රමාණයක් බස්නාහිර පළාතේ ජල සම්පාදන පද්ධතිය මගින් බෙදා හරින අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන සමස්ත ජල ප්‍රමාණයෙන් 60% කි. කලුතර කඳන පිහිටි සිව්වන ජල පවිත්‍රාගාරය 2006 වර්ෂය අවසානයේදී ජනතා අයිතියට පවරන ලදි.

### ජල නිෂ්පාදනය




### පළාත් අනුව ජල නිෂ්පාදනය



## නිෂ්පාදන පිරිවැය

**2009 වර්ෂය සමග නිෂ්පාදන පිරිවැය සංසන්දනය**

### නිෂ්පාදන පිරිවැය




### සේවා සම්බන්ධතා පිළිබඳ සැසඳීම

| පළාත / ප්‍රා. ස. සේ. ම. | සේවා සැපයුම් සංඛ්‍යාව 2009 දෙසැම්බර් මස අවසානයට | සේවා සැපයුම් සංඛ්‍යාව 2010 දෙසැම්බර් මස අවසානයට | වෙනස % | | සේවා සැපයුම් සංඛ්‍යාව 2009 දෙසැම්බර් මස අවසානයට | සේවා සැපයුම් සංඛ්‍යාව 2010 දෙසැම්බර් මස අවසානයට | වෙනස % |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර මධ්‍යම | 338,669 | **349,372** | 3.2 | ප්‍රමුඛතා සම්බන්ධන | 2,702 | **2,747** | 1.7 |
| | | | | කොළඹ නගරය | 125,529 | **126,613** | 0.9 |
| | | | | කො.උ.නැ. නගර | 124,934 | **128,862** | 3.1 |
| | | | | කො.ද.නැ. නගර | 85,504 | **91,150** | 6.6 |
| බස්නාහිර උතුර | 133,387 | **141,601** | 6.2 | කො.උ. නගර | 94,105 | **99,616** | 5.9 |
| | | | | ගම්පහ | 39,282 | **41,985** | 6.9 |
| බස්නාහිර දකුණ | 155,799 | **163,335** | 4.8 | කො.ද. නගර | 86,279 | **88,816** | 2.9 |
| | | | | කලුතර | 42,127 | **43,778** | 3.9 |
| | | | | පානදුර | 27,393 | **30,741** | 12.2 |
| මධ්‍යම | 148,470 | **164,259** | 10.6 | මහනුවර උතුර | | **64,230** | |
| | | | | මහනුවර නැගෙනහිර | 148,470 | **54,122** | 10.6 |
| | | | | මහනුවර දකුණ | | **45,907** | |
| වයඹ | 36,347 | **40,947** | 12.7 | කුරුණෑගල | 36,347 | **40,947** | 12.7 |
| උතුරු මැද | 55,669 | **62,579** | 12.4 | අනුරාධපුරය | 55,669 | **62,579** | 12.4 |
| සබරගමුව | 66,121 | **69,264** | 4.8 | රත්නපුර | 29,303 | **30,955** | 5.6 |
| | | | | කෑගල්ල | 36,818 | **38,309** | 4.0 |
| | 188,550 | **203,820** | 8.1 | හම්බන්තොට | 64,482 | **68,350** | 6.0 |
| දකුණ | | | | මාතර | 61,642 | **65,922** | 6.9 |
| | | | | ගාල්ල | 62,426 | **69,548** | 11.4 |
| ඌව | 52,624 | **56,771** | 7.9 | බණ්ඩාරවෙල | 32,686 | **35,217** | 7.7 |
| | | | | මොණරාගල | 19,938 | **21,554** | 8.1 |
| උතුර | 5,631 | **6,456** | 14.7 | යාපනය<br>මන්නාරම | 5,631 | **1,058**<br>**5,398** | 14.7 |
| නැගෙනහිර | 85,061 | **95,169** | 11.9 | අම්පාර | 23,732 | **25,371** | 6.9 |
| | | | | ත්‍රිකුණාමලය | 29,048 | **29,663** | 2.1 |
| | | | | අක්කරෙයිපත්තුව | 32,281 | **40,135** | 24.3 |
| එකතුව | 1,266,328 | **1,353,573** | 6.9 | එකතුව | 1,266,328 | **1,353,573** | 6.9 |

### ජල සම්බන්ධතාවල වර්ධනය




### වාර්ෂික බිල්ගත කිරීම හා අය එකතු කිරීම පිළිබඳ සැසඳීම




### පවුලක සාමාන්‍ය මාසික ජල පරිභෝජනය ජල සැපයුම් සම්බන්ධතාවයට (ඝ. මී.)




### පවුලක සාමාන්‍ය මාසික බිල්ගත කිරීම රු.




## බිල්ගත කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන විස්තරය

| | 2009 | 2010 |
|---|---|---|
| බිල්ගත කිරීමේ ඉලක්කය (රු. මි.) | 10,612 | 11,890 |
| තථ්‍ය බිල්ගත කිරීම (රු. මි.) | 11,119 | 12,409 |
| අය එකතු කිරීමේ ඉලක්කය (රු. මි.) | 10,925 | 12,658 |
| තථ්‍ය අය එකතු කිරීම (රු. මි.) | 10,502 | 12,453 |

## විකුණූ ජල ප්‍රමාණය සහ පාරිභෝගික වර්ගකිරීම් අනුව ආදායම (2010)

| **පාරිභෝගික වර්ගය** | **අලෙවි කරන ජල ප්‍රමාණය (ඝ. මී. දහස්)** | **%** | **ආදායම් (රු. මි.)** | **%** |
|---|---|---|---|---|
| සෘජුවම ගාස්තු අය කිරීම (ගෘහස්ථ ජා.ජ. හා ජ.ම. නිවාස රජයේ නිවාස) | 215,114 | 66.6 | 6,214 | 50.1 |
| පාසැල් | 4,260 | 1.3 | 96 | 0.8 |
| පේළි ගෙවල් පිහිටි වතු | 10,696 | 3.3 | 268 | 2.2 |
| පොදු ස්ථාන ජල කරාම මගින් ජල සැපයුම | 2,634 | 0.8 | 37 | 0.3 |
| රජයේ ආයතන ජා. ජ හා ජ. ම. පරිශ්‍රය | 33,107 | 10.3 | 2,153 | 17.4 |
| වෙළඳ හා කර්මාන්ත | 30,116 | 9.3 | 2,581 | 20.8 |
| සංචාරක හෝටල් | 2,197 | 0.7 | 173 | 1.4 |
| නාවික කටයුතු | 180 | 0.1 | 81 | 0.7 |
| ආයෝජන මණ්ඩලය | 7,380 | 2.3 | 436 | 3.5 |
| ආගමික පරිශ්‍ර | 4,160 | 1.3 | 94 | 0.8 |
| උප එකතුව | **309,844** | **96.0** | **12,133** | **97.8** |
| තොග ජල සැපයුම් සඳහා ගාස්තු අය කිරීම | 10,449 | 3.2 | 187 | 1.5 |
| වෙනත් * | 2,540 | 0.8 | 89 | 0.7 |
| මුළු එකතුව | **322,833** | **100.0** | **12,409** | **100.0** |

* අනෙකුත් සියලුම ගාස්තු අයකිරීම් "වෙනත්" යටතේ වර්ගකර දක්වා ඇත. ප්‍රතිදාන හිලව් කිරීම මෙම කාණ්ඩයට ඇතුළත් කර ඇත.

**පාරිභෝගික වර්ගීකරණය අනුව**
**ප්‍රයෝජනයට ගෙන ඇති ජල ප්‍රමාණයේ ප්‍රතිශතය**




**පාරිභෝගික වර්ගීකරණය අනුව ආදායම් ප්‍රතිශතය**




# මලාපවහනය

පහත දැක්වෙන ස්ථාන හා ප්‍රදේශවල පිහිටි මලාපවහන පද්ධති ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් මහ කොළඹ මලාපවහන අංශය වගකීම දරයි.

- දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශය
- කොලොන්නාව නගර සභා ප්‍රදේශය සහ
- මහකොළඹ ප්‍රදේශය තුළ පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඇතැම් නිවාස සංකීර්ණවල හා රජයේ ආයතන කිහිපයකට අයත් මලාපවහන පොම්පාගාර හා පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ග.

2008 වර්ෂයේ ජනවාරි මාසයේ සිට මලාපවහන සම්බන්ධතා සඳහා මලාපවහන ගාස්තු පැනවීමට කටයුතු කරමින් ඇත. 2009 වර්ෂය අවසානයේදී මලාපවහන ගාස්තු අය කිරීම සඳහා කොළඹ මහ නගර සභා ප්‍රදේශයෙන් පිටත පිහිටි සියලුම මලාපවහන සම්බන්ධතා පාහේ ඇතුළත් කර ඇත.

**දෙහිවල ගල්කිස්ස මලාපවහන යෝජනා ක්‍රමය**
**(ලිපිනය: 480, රොක්සි උද්‍යානය, වැල්ලවත්ත)**

1980 සහ 1987 අතර කාලය තුළ ඉදිකරන ලද මෙම මලාපවහන පද්ධතිය පොම්පාගාර දෙකකින් සහ කි.මී. 32 ක් දිග මලාපවහන නළ පද්ධතියකින් සමන්විත වේ. මලාපවහන සම්බන්ධතා 5000 කට මෙම පද්ධති සැලසුම්කර ඇත. දැනට මලාපවහන සම්බන්ධතා 2221 ක් පමණ ලබා දී ඇත.

**කොලොන්නාව මලාපවහන යෝජනා ක්‍රමය**
**(400, අවිස්සාවෙල්ල පාර, වැල්ලම්පිටිය)**

පොම්පාගාර 04 කින් සමන්විත වන මෙම පද්ධතිය ද ඉදි කරනු ලැබුවේ 1980 – 1987 කාලයේදීය. මලාපවහන නළ පද්ධතිය කි.මී. 20 ක් පමණ දිග ය. මලාපවහන සම්බන්ධතා 3,900 කට මෙම පද්ධතිය සැලසුම්කර ඇති අතර දැනට සම්බන්ධතා 1,488 ක් පමණ ලබාදී ඇත.

**ඇතැම් නිවාස යෝජනා ක්‍රම සහ රජයේ ආයතනයන්ට අනුබද්ධ මලාපවහන පද්ධති"**

ඉහත සඳහන් ප්‍රධාන මලාපවහන යෝජනා ක්‍රමවලට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මහකොළඹ ප්‍රදේශය තුළ ඉදි කරන ලද විශාල නිවාස යෝජනා ක්‍රම කිහිපයකට මලාපවහන සේවා සැපයීම මෙන්ම කොළඹ නගරසභා සීමාවෙන් පිටත වුවද මහ කොළඹ ප්‍රදේශයට අයත් ඇතැම් රජයේ ආයතන සඳහා එකී සේවා සැපයීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වගකීම දරයි. පහත සඳහන් එවැනි නිවාස යෝජනා ක්‍රමවල මලාපවහන සම්බන්ධතා 6921 ක් පමණ ඇත.

(අ) නිවාස යෝජනා ක්‍රම
1. සොයිසාපුර නිවාස යෝජනා ක්‍රමය.
2. මාලිගාවත්ත නිවාස යෝජනා ක්‍රමය.
3. මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමය.
4. ජයවඩනගම නිවාස යෝජනා ක්‍රමය.
5. කාක දූපතේ නිවාස යෝජනා ක්‍රමය.
6. මද්දුමගෙවත්ත නිවාස යෝජනා ක්‍රමය.
7. ස්ටේස් පාර නිවාස යෝජනා ක්‍රමය.

(ආ) රජයේ ආයතන
1. ජනාධිපති ලේකම් කාර්යාලය
2. කථානායක නිල නිවාසය
3. පාර්ලිමේන්තුව (ජලය හා මලාපවහනය)
4. සෙත්සිරිපාය (ජලය හා මලාපවහනය)
5. ඉසුරුපාය (ජලය හා මලාපවහනය)
6. ජයවඩනගම රෝහල
7. මාලිගාවත්ත රෝහල

අපජල පිරිපහදු යන්ත්‍රාගාර 3 ක් සීතාවක, සොයිසාපුර සහ මත්තේගොඩ පිහිටා ඇත. දෙහිවල, ගල්කිස්ස සහ කොලොන්නාව පිහිටි සියලුම මලාපවහන පොම්පාගාරවලින් එකතුකර ගන්නා අපජලය වැල්ලවත්තේ පිහිටි එක් මුහුදු මෝයකින් ද, මෝදර පිහිටි අනෙක් මුහුදු මෝයකින් ද මුහුදට බැහැර කරනු ලබයි.

# ආයෝජනයන් පිළිබඳ සාරාංශය

"රු. බිලියන 3.85 ක අමතර ප්‍රතිපාදන ද සහිතව 2009 වර්ෂයේදී 69% ක් ලෙස සටහන්වූ ප්‍රාග්ධන අරමුදලේ උපයෝගීතාවය 2010 වර්ෂයේදී අනුමත වීමට නියමිත අමතර වැය ශීර්ෂ දෙකක්ද ඇතුළුව 98% ක් ලෙස සටහන් විය."

## මූල්‍ය ප්‍රභවයන්

මලාපවහන සහ ජල සම්පාදන ව්‍යාපෘතිවල ප්‍රාග්ධන වියදම් සඳහා ජා.ජ. හා ජ.ම. වෙත රු. මිලියන 15,892 ක විදේශීය අරමුදල් ලබාදී ඇත. ප්‍රතිරූප අරමුදල් ලෙස ශ්‍රී ලංකා රජය විසින් රු.මිලියන 5,157 ක මුදලක් ද ලබාදී ඇත. මීට අමතරව කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති සඳහා රු. මිලියන 1,300 ක දේශීය අරමුදල් වෙන් කරන ලදි. සුනාමිය බලපෑ ජල සම්පාදන පද්ධති නැවත ඉදි කිරීම සඳහා රු.මිලියන 2,100 ක මුදලක් විදේශීය අරමුදල් ලෙස ද රු. මිලියන 546 ක මුදලක් දේශීය ප්‍රතිරූප අරමුදල් ලෙස ද ලබාදී ඇත.

## ප්‍රාග්ධන අය වෙන් කිරීම්




ජල සම්පාදන හා මලාපවහන යටිතල පහසුකම් සඳහා වාර්ෂික ප්‍රාග්ධන වෙන් කිරීම වර්ෂ 2006 සිට 2009 දක්වා රු. බිලියන 25.6 සිට රු. බිලියන 30.9 දක්වා ස්ථිර ලෙස වැඩිවිය. එනමුත් වර්ෂ 2010 වෙනුවෙන් වෙන්කළ ප්‍රාග්ධන අරමුදල රු. බිලියන 22.91 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.

## ප්‍රාග්ධන අරමුදල් උපයෝගීතාව

සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධව පැන නගින වැය පියවීම සඳහා 2010 වර්ෂයේදී රු.මිලියන 2090, 1667, හා 350 ක් වූ අතිරේක ප්‍රතිපාදනයන් 03 අපේක්ෂා කළ නමුත්, එයින් පළමු මුදල පමණක් ලැබුණු අතර අනිත් මුදල් ප්‍රතිපාදනයන් දෙකම, 2010 අවසානයේදී අනුමත නොවී තිබිණ. එම නිසා සමහර වැය, මූල්‍යමය වෙන් කිරීම් පවා අභිබවා ඇත. මෙම මූල්‍යමය වෙන් කිරීම් ලබා දී තිබුණි නම් ව්‍යාපෘති වැය, එම අයවැය තුළටම සීමා කිරීමට හැකියාව තිබිණ.

### ප්‍රාග්ධන අරමුදලේ උපයෝගීතාවය




### 2009/2010 වර්ෂවල ප්‍රාග්ධන අරමුදල් උපයෝගීතාව පිළිබඳ සැසඳීම

| විස්තරය | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| විදේශීය අරමුදල් ප්‍රමාණය (රු. මිලියන) | 13,838 | 62.2% | 18,602 | 103.3% |
| විදේශීය ආධාර හා අනුබද්ධ දේශීය අරමුදල් ප්‍රමාණය (රු. මිලියන) | 6,348 | 82.7% | 6,410 | 112.4% |
| දේශීය ව්‍යාපෘති සඳහා ඒකාබද්ධ අරමුදල් (රු. මිලියන) | 950 | 103.3% | 1,377 | 105.9% |
| එකතුව | 21,136 | 68.5% | 26,389 | 105.6% |

රු.බිලියන 3.85 අමතර ප්‍රතිපාදන සහිතව 2009 වර්ෂයේදී 69% ක් ලෙස සටහන් වූ ප්‍රාග්ධන අරමුදලේ උපයෝගිතාවය 2010 වර්ෂයේදී අනුමත වීමට නියමිත අමතර වැය ශීර්ෂ දෙකක්ද සහිතව 98% ක් ලෙස සටහන් විය.

මුදල් හා ක්‍රම සම්පාදන ගරු නියෝජ්‍ය ඇමතිතුමා, බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතියට (දැයට කිරුළ ප්‍රදර්ශනය) අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමක් තහවුරු කර ඇත.

මෙම මූල්‍යමය වෙන්කිරීම අපේක්ෂාවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රු. මිලියන 70 ක් බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතියට වැය කෙරිණි. නමුත්, අපේක්ෂා කළ අමතර මුදල් නියමිත වේලාවට නොලැබුණ නිසා අතිරේක වැයවීමක් සිදුවිණ.

### විදේශ ආයතන විසින් ලබාදුන් විදේශාධාර මුදල් සහ ශ්‍රී ලංකා රජයේ අදාළ අරමුදල්




## දැනට පවතින ජල සම්පාදන ක්‍රම වැඩිදියුණු කිරීම සහ පුනරුත්තාපනය කිරීම

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී මණ්ඩලීය අරමුදල් රු.මිලියන 510 ක් උපයෝගී කරගෙන දැනට පවත්නා ජල සම්පාදන ක්‍රම පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදුකරගෙන යන ලදී. ජල සැලසුම්වල ගුණාත්මකභාවය සහ ප්‍රමාණාත්මක බව වැඩි දියුණු කිරීමටත් මණ්ඩලයේ වත්කම පවත්වාගෙන යාමටත් මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සහය සේවා ආරම්භ කිරීමටත් මෙම මුදල් යොදා ගන්නා ලදි. ආධාර මුදල් හෝ ප්‍රධාන වශයෙන් රජයේ අරමුදල් නොලැබුණු ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන ලදි.

**කුඩා පරිමාණයේ යටිතල පහසුකම් පුනරුත්තාපනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකා රජයෙන් සැපයූ අරමුදල්**

මෙම ව්‍යාපෘති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රම සම්පාදනය හා සැලසුම්කර, ඉන් අනතුරුව ඇස්තමේන්තුකර ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අදාළ පළාත් කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද අතර එම ව්‍යාපෘති අවසන් කළ විට පළාත් ක්‍රි.හා.න. කාර්ය මණ්ඩලය විසින් භාර ගනු ලැබේ.

දේශීය අරමුදල් සපයන ලද ප්‍රාග්ධන වැඩ සටහන් යටතේ 2010 වසරේදී නව ජල සම්පාදන ව්‍යාපෘති 14ක් සහ තවත් ජල සම්පාදන ක්‍රම 31ක පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් සිදු කරන ලදි.

**දිස්ත්‍රික්ක අනුව 2010 වර්ෂයේදී ප්‍රාග්ධන වැඩසටහන්**

| දිස්ත්‍රික්කය | 2010 සඳහා මුදල් වෙන් කිරීම (රු .මිලියන) | ප්‍රතිපාදන සහිත ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| අම්පාර | 97.0 | 1 | 17,500 |
| අනුරාධපුරය | 120.0 | 2 | 8,000 |
| බදුල්ල | 25.0 | 2 | 37,150 |
| කොළඹ | 100.0 | 3 | 62,273 |
| ගාල්ල | 13.0 | 2 | 8,000 |
| ගම්පහ | 32.0 | 2 | 20,000 |
| කළුතර | 115.0 | 1 | 142,000 |
| මහනුවර | 70.0 | 2 | 142,300 |
| කෑගල්ල | 159.0 | 5 | 122,300 |
| කුරුණෑගල | 80.0 | 1 | 12,000 |
| මාතලේ | 30.0 | 2 | 25,800 |
| මාතර | 108.0 | 5 | 192,000 |
| මොණරාගල | 31.0 | 3 | 37,800 |
| නුවරඑළිය | 13.0 | 1 | 10,500 |
| පොළොන්නරුව | 159.0 | 3 | 80,200 |
| පුත්තලම | 10.0 | 1 | 2,500 |
| රත්නපුර | 75.0 | 5 | 165,600 |
| ත්‍රිකුණාමලය | 33.0 | 3 | 60,000 |
| එකතුව | 1,300.0 | 44 | 1,145,923 |

වර්ෂය තුළදී වෙන්කළ සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය එම ව්‍යාපෘති සඳහා උපයෝගී කරගන්නා ලදි.

දේශීය වශයෙන් අරමුදල් සැපයූ සියළුම ව්‍යාපෘති පාහේ වසර 6 කට හෝ 8 කට පෙර ආරම්භ කරන ලද ඒවාය. වාර්ෂිකව ඉතා අඩු ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කල් ගතවී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මිල ඉහළයාම් හේතුවෙන් එම ව්‍යාපෘතිවල මුළු පිරිවැය ඇස්තමේන්තු වැඩිවී ඇත. තව ද ඉටු කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලා සිටි මුදල් නිසි වේලාවට පියවීමට දේශීය අරමුදල් මුදාහැර නොමැත. එමගින් මාස කිහිපයක ප්‍රමාදවීමක් සිදුවී ඇති අතර එය කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය ප්‍රවාහයට බලපාන ලදි. 2009 වර්ෂයේ දී ජා.ජ.ස. හා ජ.ම. විසින් කෙරෙමින් පවතින සියලුම දේශීය ජල ව්‍යාපෘතිවල තත්වය තක්සේරු කරනලද අතර සලකා බලන ලද ව්‍යාපෘති 40 ක් නිමාකිරීම සඳහා රු. මිලියන 7365 ක් අවශ්‍ය වන බව නිගමනය කරන ලදි. නමුත් 2010 වසරේදී ලද වෙන්කිරීම් ප්‍රමාණය රු. මිලියන 1300 ක් පමණි. මේ හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභීන්ට ජල සැපයීමේ පහසුකම් අහිමි වී ඇත.

## වැඩ අවසන් වූ ව්‍යාපෘති

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පහත සඳහන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

| | |
|---|---|
| නැගෙනහිර | අම්පාර ජ.ස.ක්‍ර. (ජර්මානු රජයේ ණය ආධාර ව්‍යාපෘතිය) |
| දකුණ | අකුරැස්ස ජ.ස.ක්‍ර. රදම්පොල ජ.ස.ක්‍ර. ජර්මානු රජයේ ආධාර සපයන ලද සුනාමි ව්‍යාපෘති |
| මධ්‍යම | නුවරඑළිය දිස්ත්‍රික්කය සමූහ නගර ජ.ස.ක්‍ර |
| බස්නාහිර | දකුණු කොළඹ මලාපවහන පෝෂක ප්‍රදේශය පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම සහ ස්පාඤ්ඤ ණය ආධාර යටතේ අඹතලේ නව ජල පවිත්‍රාගාරය ඉදි කිරීම. |
| දකුණු හා නැගෙනහිර | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් මුදල් සපයන සුනාමි ව්‍යාපෘති (තිරුක්කෝවිල්) |
| සබරගමුව | ගොඩකවෙල ජ.ස.ක්‍ර. |




ගොඩකවෙල ජ.ස.ක්‍ර (2010-12-18 දින ක්‍රියාත්මක කරන ලදි)

## ආරම්භ කරන ලද ව්‍යාපෘති

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පහත සඳහන් නව ව්‍යාපෘති ආරම්භ කරන ලදි.

| | |
|---|---|
| නැගෙනහිර | නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය. අම්පාර දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළබඩ නගර ජල සම්පාදන ව්‍යාපෘති III වන අදියර |
| බස්නාහිර | කොළඹ නගරය තුළ ආ.නො.ජ.ස. අඩු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය |
| දකුණ | බොනවිස්ටා කන්ද ජ.ස.ක්‍ර |
| උතුරුමැද | මහනෙලුබැව ජ.ස.ක්‍ර |

# සේවකයින්

“කලින් වර්ෂවලදී මෙන්ම 2010 වර්ෂය තුළද සේවකයන් සඳහා පුහුණුවීමේ අවස්ථා ලබාදීමට ජා.ජ.ස. හා ජ. මණ්ඩලයේ මිනිස්බල සංවර්ධනය හා පුහුණු අංශය පුහුණු කිරීම් දියත් කරන ලදි.”

### කාර්ය මණ්ඩල සංඛ්‍යාව

| | කාර්ය මණ්ඩලය | 2009 | 2010 | වෙනස(%) |
|---|---|---|---|---|
| (අ) | ස්ථිර* | 8,569 | 8,627 | 0.7 |
| (ආ) | අනියම් | 308 | 202 | (34.4) |
| (ඇ) | කොන්ත්‍රාත් | 137 | 119 | (13.1) |
| (ඈ) | අභ්‍යාසලාභී | 49 | 70 | 42.9 |
| | එකතුව | 9,063 | 9,018 | (0.5) |

* විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා බඳවාගන්නා ලද කාර්ය මණ්ඩලය මෙයට ඇතුළත් නොවේ.

2010 වර්ෂය අවසානයේදී 8627 ක්වූ ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව කොන්ත්‍රාත් සේවකයෝ 119 ක්ද, අනියම් සේවකයෝ 202 ක්ද, අභ්‍යාසලාභී සේවකයෝ 70 ක්ද සිටියහ. විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල වැඩ සඳහා කොන්ත්‍රාත් සේවකයින් වැඩි පිරිසක් බඳවා ගන්නා ලදි.

2010 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩවලට අයත් බඳවා ගන්නා ලද ස්ථිර සේවකයෝ 491 ක්ද අනියම් සේවකයෝ 139 ක්ද, කොන්ත්‍රාත් සේවකයෝ 78 ක්ද අභ්‍යාසලාභී සේවකයෝ 22 ක්ද සිටියහ. එම කාල සීමාව තුළදීම විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩවලට අයත් බඳවාගත්, ඉල්ලා අස්වූ, සේවය හැරගිය සහ මියගිය සේවකයන් ඇතුළුව ස්ථිර සේවකයින් 433 කගේ ද, අනියම් සේවකයින් 245 කගේ ද, කොන්ත්‍රාත් සේවකයින් 96 කගේ ද, අභ්‍යාසලාභියකුගේ ද සේවය අවසන් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයෝ 45 ක් වැඩි වූහ. යන්ත්‍රාගාර කාර්මික අභ්‍යාසලාභීන් 70 දෙනෙකු පසුව ස්ථිර කිරීමට යෝජිතව ඇත.

### ප්‍රධාන කාර්යයන් අනුව සේවක ව්‍යාප්තිය



### ප්‍රධාන කාර්යයන් අනුව කාර්ය මණ්ඩල ව්‍යාප්තිය




### ප්‍රධාන කාර්යයන් අනුව කාර්ය මණ්ඩල ව්‍යාප්තිය




### පිහිටීම අනුව කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය




### පිහිටීම අනුව කාර්ය මණ්ඩලයේ ව්‍යාප්තිය







## කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

- වාර්ෂික පාරිතෝෂිකය රු. 23,000 කි. මීට අමතරව සුදුසුකම් ඇති සේවකයන්ට ඵලදායී දිරිගැන්වීමේ දීමනාවක් ගෙවන ලදි.
- ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම් සිදුකරන ලදි.
- සේවකයන් අතර සහන ණය 1728 ක් (දස මාසයේ ණය 1542 ක් ද 12 මාසයේ ණය 186 ක් ද දළ වශයෙන් රු.මිලියන 751,409,430 ක්) ගෙවන ලදි.
- 2010 වර්ෂයේදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ලෝක ජල දින උත්සවයේදී නිකැළැල් සේවා සඳහා සේවකයන් 325 දෙනෙකුට උපහාර පිරිනමන ලදි.
- තෝරාගත් මාර්ග සඳහා වන ප්‍රවාහන පහසුකම්වලට අමතරව සහනදායී මිලකට නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සපයන ලදි.
- 2010 වර්ෂයේ සිට (පවුලේ සාමාජිකයින් ඇතුළුව) බාහිර හා අභ්‍යන්තර ප්‍රතිකාර සඳහා සේවකයන්ගේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් රු. 6,944,036 (දළවශයෙන්) මුදලක් වියදම් කර ඇත.
- අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් 338 ක් 2010 වසරේදී ස්ථිර කරන ලදි.
- ස්ථිර සේවකයන් සඳහා මරණාධාර පරිත්‍යාග මුදල් ලබාදීම.
- සේවකයන්ට දේශීය/ විදේශීය පුහුණු පහසුකම් ලබාදීම.
- සේවකයන් සඳහා රු. 500 ක තේ පැන් සංග්‍රහ දීමනාව ලබා දීම.
- රජයේ බැංකු මගින් ණය පහසුකම් (මහජන බැංකුවෙන් නිවාස ණය ද ලංකා බැංකුවෙන් වාහන ණය ද ) ලබාදීම.
- සේවකයන්ට රු. 5000 ක උත්සව අත්තිකාරම අඛණ්ඩව ලබාදීම.
- සේවක පුරප්පාඩු පිරවීමේදී සේවකයින්ගේ සුදුසුකම් සහිත දරුවන්ට මුල්තැන දීම.

## කාර්ය මණ්ඩල පාරිශ්‍රමිකය සහ ප්‍රතිලාභ

### 2010 සහ 2009 වර්ෂවල කාර්ය මණ්ඩල පාරිශ්‍රමිකය පිළිබඳ සැසඳීම.

| විස්තරය | 2009 රු. මිලියන | 2010 රු. මිලියන |
|---|---|---|
| වැටුප් | 4,347 | 5,258 |
| සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල | 390 | 480 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල | 98 | 120 |
| එකතුව | 4,835 | 5,858 |

## මිනිස්බල සංවර්ධනය හා පුහුණුව




ජ්‍යෙෂ්ඨ හා රේඛීය කළමනාකරුවන් හා විවිධ සේවා ඛණ්ඩවලට අයත් සේවකයන් මගින් පුහුණු අවශ්‍යතා සහ ප්‍රමුඛතා හඳුනාගෙන එය පදනම් කරගෙන පහත සඳහන් ප්‍රවේශයන් මගින් එම අයට පුහුණුව ලබාදෙන ලදි.

### 2010 වර්ෂය තුළදී පහත සඳහන් පුහුණු වැඩසටහන් හඳුන්වාදී ඇත.

ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ සූත්‍රය උපයෝගී කර ගනිමින් ඉංජිනේරුවරුන් සහ ඉංජිනේරු සහායකවරුන් සඳහා මිල විචලනය ගණනය කිරීම ද, පරීක්ෂණාගාර සහායකයන් සඳහා ජලයේ ගුණාත්මක බව පිළිබඳ දර්ශකය ගණනය කිරීම ද, රසඥයන් සඳහා ජලය විශ්ලේෂණය කිරීම පිළිබඳව නව ක්‍රම වේදයන් ද, ජල වැද්දුම්කරුවන් සඳහා පොලිඑතිලින් නළ භාවිතයෙන් ජල සම්බන්ධතා ලබාදීම ද, ගණකාධිකාරිවරුන් සඳහා ගිණුම් ප්‍රමිතීන් පිළිබඳ දැනුවත් කිරීම ද, ඉංජිනේරුවරුන්, ඉංජිනේරු සහායකවරුන් සහ සැලසුම් නිලධාරීන් සඳහා ජී.අයි.එස් පැකේජය පිළිබඳ මූලික පුහුණුව ද, ඉංජිනේරු සහායකවරුන් සහ සැලසුම් නිලධාරීන් සඳහා ජී.අයි.එස් ආර්ක් විව් යොදාගෙන සිතියම් කරණය පිළිබඳව ද පුහුණු වැඩසටහන් හඳුන්වාදෙන ලදි.

### විධිමත් සේවාස්ථ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

2010 වර්ෂයේදී පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මිනිස් බල සංවර්ධන හා පුහුණු අංශය විසින් සේවාස්ථ පුහුණු වැඩසටහන් 166 ක් පවත්වන ලද අතර එම වැඩසටහන් සඳහා කළමනාකරණ කාර්ය මණ්ඩලය 460 දෙනෙකු ද, අධීක්ෂණ නිලධාරීන් 1605 දෙනෙකු ද, ලිපිකාර සහ ආශ්‍රිත ශ්‍රේණිවල 931 දෙනෙකු ද, ක්‍රියාකරුවන් 821 දෙනෙකු ද ඇතුළත් විය. ඇතැම් පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය කාර්යාලවල පැවැත්වීමට සැලසුම් කිරීම ද සිදුකරන ලද අතර කළමනාකරණ සහ මූල්‍ය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් බාහිර විශේෂඥයින්ගේ සේවාවන් ලබා ගන්නා ලදි.

ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම, ජලය හා මලාපවහන පවිත්‍රකරණය, ඉදිකිරීම් කළමනාකරණය, ටෙන්ඩර් පරිපාටි සහ කොන්ත්‍රාත්තු පිළිබඳ ගෙවීම්, නායකත්වය, ජල හානි අනාවරණය කර ගැනීම, ජී.අයි.එස්., විනය කාර්ය පරිපාටි, පරිපාලන කාර්ය පරිපාටි, මූල්‍ය කාර්ය පරිපාටි, ද්‍රව්‍ය කළමනාකරණය, වාණිජ කටයුතු, පාරිභෝගික සබඳතා, ලිපිකරු පුහුණුවීම්, පරිගණක යෙදවුම්, කළමනාකරණ පුහුණු, අළුතින් බඳවාගත් අය සඳහා හඳුන්වාදීමේ වැඩසටහන්, සංස්කරණ වැඩ සටහන්, ජල සම්පාදන යෝජනා ක්‍රමවල මාර්ග ආරක්ෂාව සහ ජල සම්පාදන යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබඳ පුහුණුව ද ලබා දී ඇත.

### රටේ අනෙකුත් පුහුණු ආයතනවලදී පුහුණුව ලබාදීම

බාහිර පුහුණුව සඳහා වෙන් කරන ලද මුදල්වලින් 98% ක් උපයෝගී කරගෙන බාහිර ආයතන මගින් පුහුණුව ලබාදෙන ලදි. දේශීය පුහුණු ආයතන මගින් සේවකයන් 132 දෙනෙකු සඳහා බාහිර පුහුණුව ලබා ගන්නා ලදි. මෙරට විශ්ව විද්‍යාල මගින් පවත්වන ලද ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි වැඩසටහන් සහ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, පිරිස් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය, නිවාස, සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය වැනි ආයතන මගින් පවත්වන ලද ඩිප්ලෝමා සහතිකපත්‍ර පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා මෙයට ඇතුළත් විය. මානව සම්පත් පිළිබඳව ද සැපයුම්, ඉදිකිරීම්, කළමනාකරණය සහ යාන්ත්‍රික සහ විදුලි ක්ෂේත්‍ර පිළිබඳව කෙටි පාඨමාලා ද මෙයට ඇතුළත් විය.

### 2010 වර්ෂය තුළදී පහත සඳහන් නව පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කර ඇත.

අයි.ටි.අයි. ආයතනයේ ජල පවිත්‍රාගාර පිළිබඳ නිපුණතා සංවර්ධන පාඨමාලා, විජය ග්‍රැෆික්ස් හරහා කොරල්ඩ්‍රෝ පුහුණුව, එස්. එල්. එෆ්. අයි. ආයතනයේ පාරිභෝගික විශිෂ්ඨත්ව සේවාව පිළිබඳ පුහුණුව, ශ්‍රී.ප.ස.ආ. පුහුණුකරුවන් පුහුණු කිරීම, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ උපදේශක-වරුන් තේරීම හා සේවයේ යෙදවීම, මහ බැංකුවේ ටෙන්ඩර් පරිපාටිය සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ පුහුණුව, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ප්‍රසම්පාදන වැඩ කටයුතු හා සම්බන්ධන කොන්ත්‍රාත්තු නිකුත් කිරීම පිළිබඳ පුහුණුව.

### විදේශ පුහුණුව / නිල සංචාර

ආ.ස.බැ, ජා.ජ.ස.නි.ආ, ස්.ජා.ස.නි.ආ, ඩෙ.ජ.ස.නි.ආ, නෙදර්ලන්ත අධි ශිෂ්‍යත්ව වැඩ සටහන සහ ජේ.අයි.සී.ඒ. ආයතනය යන ආයතනවල මූල්‍යාධාර ඇතිව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් 69 දෙනෙකුට විදේශ පුහුණුව ලබාදෙන ලදි, මීට අමතරව කම්හල් හා නිෂ්පා-දනාගාර ආශ්‍රිතව සැපයුම් පරීක්ෂාකර බැලීම්, රැස්වීම්, සම්මන්ත්‍රණ ආදිය සඳහා නිලධාරීන් 75 දෙනෙකු සහභාගී වී ඇත.

### කාර්යස්ථ පුහුණුව

ආධුනිකයන් 169 දෙනෙකුට කාර්යස්ථ පුහුණුව ලබාදෙන ලදී. (උපාධි අපේක්ෂකයන්ට, විශේෂ ආධුනිකයන්ට තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව / ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව. අභ්‍යාසලාභීන්ට, ශිල්පීය ආධුනිකයන්ට, කාර්මික විද්‍යාල අභ්‍යාස ලාභීන්ට, වරලත් ගණකාධිකාරී ආයතනයේ ආධුනිකයන්ට, ගිණුම් කාර්මික ශිල්පී ආයතනය, වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකයන්ට සහ කාර්මික පුහුණු අධිකාරියේ අභ්‍යාසලාභීන්ට කාර්යස්ථ පුහුණුව ලබාදෙන ලදී.)


මානව ක්‍රියාකාරකම්වල නොසැලකිල්ල හේතුවෙන් නියං තත්වයන් ඇති විය හැක. එබැවින් අප පරිසරය සුරැකිම තුලින් බීමට අවශ්‍ය ජල සම්පත ආරක්ෂා කරගමු.


ප්‍රවර්තනීය වාර්තාව
ජලය ඉතා අගනේය.
එය අරපරිස්සමින් භාවිතා කරන්න.

# පාරිභෝගික පහසුතාවන්

> “පාරිභෝගිකයන් වෙත සුහදශීලී සේවාවක් සැපයීම සඳහා, නව ජල සම්බන්ධන ස්ථානගත ඇස්තමේන්තු කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම, නව ජල සම්බන්ධන මුදල් ගෙවා දින 07 ක් ඇතුළත ලබාගැනීමේ පහසුව සැලසීම, ජලකාන්දු අලුත්වැඩියා කරන කණ්ඩායම් ප්‍රමාණය වැඩි කිරීම, අන්තර්ජාලය හරහා පාරිභෝගිකයන්ට සේවා සැපයීමටත් කටයුතු කර ඇත.”

ජා.ජ. හා ජ. මණ්ඩලයේ පාරිභෝගිකයන් සඳහා කටයුතු පහසු කිරීම පිණිස මණ්ඩලය ප්‍රයත්න කිහිපයක යෙදී සිටී.

## ඇමතුම් මධ්‍යස්ථාන

ජා.ජ. හා ජ. මණ්ඩලයේ දීප ව්‍යාප්ත 1939 ඇමතුම් මධ්‍යස්ථානය, ගාස්තු අය කිරීමකින් තොරව භාෂා තුනෙන්ම පැය 24 පුරාම ක්‍රියාත්මක වන අතර එම අංකය ඇමතීමෙන් සේවාවන් පිළිබඳ තොරතුරු ලබාගැනීම හෝ සේවා බිඳවැටීම්, අවහිරතා සහ ජල කාන්දුවීම් පිළිබඳව කවර හෝ පැමිණිලි දැනුම්දීම හෝ කළ හැකිය. ඇමතුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් තිබෙන අතර ඇමතුම් පද්ධතියේ වැඩි දියුණු කිරීම් ද සිදු කරන ලදි. දැනට මෙම ඇමතුම් පද්ධතිය මගින් පාරිභෝගික පැමිණිලි 12000 ක් (ප්‍රධාන වශයෙන් ජල කාන්දු අලුත්වැඩියා කිරීම) පිළිබඳව ක්‍රියාත්මක වී ඇත. ඇමතුම් මධ්‍යස්ථානයට එස්.එම්.එස්. තාක්ෂණය පිළිබඳ පහසුකම ද සලසා ඇත. නළවල ජල කාන්දුවීම් හෝ සේවා බිඳවැටීම් පිළිබඳව ඇමතුම් මධ්‍යස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ විට එස්.එම්.එස්. පණිවුඩයකින් අදාළ ප්‍රාදේශීය ඉංජිනේරුවරයා/ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයා වෙතට යවනු ලැබේ.

## පාරිභෝගික ප්‍රඥප්තිය

පාරිභෝගික ප්‍රඥප්තියේ සඳහන් වන උපදෙස් අනුව ජල සම්පාදන ක්‍රමවල වර්තමාන තත්වය වැඩි දියුණු කිරීමෙන් ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සහ විශ්වාස කටයුතු සේවයක් ලබාදීම සඳහා වගබලා ගැනීමට ජා.ජ.ස. හා ජ.ම. ඇපකැපවී ක්‍රියා කරයි. තෝරගාගත් කාර්යාලවලදී නව සම්බන්ධා ලබාදීම පිළිබඳව ස්ථානීය ඇස්තමේන්තු සකස් කිරීම ද, අදාළ සම්බන්ධතා ලබාදීම ද, ජල කාන්දු අලුත්වැඩියා කණ්ඩායම් යෙදවීම ද, උපරිම වශයෙන් වැඩ කරන දින 7ක් ඇතුළත නව සම්බන්ධතා ලබා දීම ද, වෙබ් අඩවිය මගින් පාරිභෝගික දුක්ගැනවිලි අනාවරණය කර ගැනීම ද, පිළිබඳව යම් ක්‍රියාමාර්ග ගැනීම ද, මිත්‍රශීලී පාරිභෝගික සේවාවක් ලබාදීමට ගත් ක්‍රියාමාර්ග කිහිපයකි.

## බිල්පත් ගෙවීමේ පහසුකම්

සියලුම රාජ්‍ය බැංකු ජල බිල්පත් ගෙවීම භාරගනී. මේ හැරුණු විට සම්පත් බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, එච්.එස්.බී.සී. බැංකුව, සිටි බැංකුව, කොමර්ෂල් බැංකුව, ඩච් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, යූනියන් බැංකුව, ස්ටැන්ඩර්ඩ් චාටඩ් බැංකුව, සෙලාන් බැංකුව සහ පැන් ඒෂියා බැංකුව ද ජල බිල්පත් ගෙවීම් භාර ගනී. තම ගණුදෙනුකරුවන් සම්බන්ධයෙන් ස්ටැන්ඩර්ඩ් චාටඩ් බැංකුව සහ යූනියන් බැංකුව දුරකථන බැංකු සේවා පවත්වා ගෙන යයි. ජල බිල්පත් ගෙවීම් භාරගැනීමට සම්පත් බැංකුවට සීමාවූ සම්පත් බැංකු ජාලයක් ඇත. ජා.ජ.ස. හා ජ. මණ්ඩලය විසින් විවිධ කාර්යාලවලදී මුදල් අයකැමි මධ්‍යස්ථාන පිහිටුවා ඇත. තව ද, අය එකතු කිරීමේ ලියාපදිංචි නියෝජිත ආයතන, නියෝජිත තැපැල් කාර්යාල ද, ජල බිල්පත් ගෙවීම් අයකරන ලෙකෝ නියෝජිත ආයතන ද ඇත. ජල බිල්පත් ගෙවීම් අයකර ගැනීම සඳහා කාගිල්ස් ෆුඩ්සිටි සහ කීල්ස් සුපර් මාකට්, අබාන්ස් ප්‍රදර්ශනාගාර සහ සිංගර් ප්‍රදර්ශනාගාර ද ඇත

පාරිභෝගිකයන් ජා.ජ. හා ජ. මණ්ඩලයේ www.waterboard.lk වෙබ් අඩවියේ ලියාපදිංචි වී එච්.එස්.බී.සී. කාඩ්පත් මගින් මාසිකව ගෙවීම් කළ හැකිය. මාර්ගස්ථ ගෙවීම් ක්‍රමය ද ක්‍රියාත්මක වන අතර මණ්ඩලයේ පාරිභෝගික ජනතාව එමගින් තම ජල බිල්පත් ගෙවීම් සිදු කරති.

## කෙටි පණිවුඩ ක්‍රමය (එස්.එම්.එස්.) මගින් ජල බිල්පත් ගෙවීමේ තාක්ෂණය

2010 නොවැම්බර් මාසයේදී දියත් කරන ලද නවතම ක්‍රමය මෙය වේ. පාරිභෝගිකයෙකුට ජංගම දුරකථනය භාවිත කර ජල බිල්පත් ගෙවිය හැකිය. මුල් අවස්ථාවේදී, ජංගම දුරකථන අංකය සහ ජා.ජ. හා ජ.ම. ගිණුම් අංකය සමග පාරිභෝගිකයාගේ ගිණුම් අංකය ලියාපදිංචි කරනු ලැබේ. අනතුරුව ජංගම දුරකථන අංකය යොදාගෙන පාරිභෝගිකයා ජා.ජ. හා ජ. මණ්ඩලයේ ලියාපදිංචි කරගනී. මෙම සේවාව සැපයීම සඳහා ඔරික් ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. මුදල් ගෙන යෑම, පෝලිම්වල සිටගෙන සිටීම, අදාළ ආකෘති පත්‍ර පිරවීම ආදී අපහසුතාවලින් තොරව නොමිලේ සේවා පාරිභෝගික ජනතාවට ලබා ගැනීමට මෙම ජංගම ඉන්වොයිස් සේවාව මගින් පහසුකම් ඇති කෙරේ. පාරිභෝගිකයාගේ පහසුව වැඩි කිරීම පිණිස එවැනි නව ක්‍රම ආරම්භ කර ඇත.

මාසික බිල්පත්වල වටිනාකම් පාරිභෝගිකයාගේ ජංගම දුරකථන මගින් ඔවුන්ට දැනුම් දෙනු ලැබේ. තමන් කැමති පරිදි තම බැංකු මගින් බිල්පත් ගෙවීම පිළිබඳ කැමැත්ත පාරිභෝගික ජනතාවට ලබාදිය හැකි ය. මෙම ගෙවීම් පිළිබඳ උපදේශය පාරිභෝගිකයාගේ බැංකුව විසින් ලබාගෙන මණ්ඩලය වෙත ගෙවීම් ප්‍රේෂණය කරනු ලබයි. මණ්ඩලය විසින් බැංකුව මගින් සිදුකරන පාරිභෝගිකයාගේ ගෙවීම හඳුනාගෙන පාරිභෝගකයාගෙන් ලැබිය යුතු මුදල්වලට එම ගෙවීම බැර කරයි. පාරිභෝගිකයාගේ ගිණුම යාවත්කාලීන කිරීම දෛනික පදනමක් මත සිදු වේ.

බිල්පත් ඉදිරිපත් කර දින 14 ක් ඇතුළත ගෙවීම් සිදුකරන විට සාමාන්‍යයෙන් 2% ක වට්ටමක් දෙනු ලැබේ. පාරිභෝගිකයා විසින් දැනටමත් සම්පූර්ණ බිල්පත් අගය ගෙවීමට මණ්ඩලය වෙත වැඩිපුර මුදල් තැන්පත්කර ඇත්නම් 4% ක වට්ටමක් පාරිභෝගිකයාට දෙනු ලැබේ.

### ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

ජල සංරක්ෂණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම, පිරිසිදු ජලය ඉතිරිකර ගැනීම සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන දූෂණය මගින් ජලාශ අපිරිසිදුවීම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීම් ද අඛණ්ඩව සිදු කරන ලදි. ඉලක්ක කණ්ඩායමක් ලෙස පාසැල් ළමයින් පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදි. පොළොන්නරුව, අම්පාර, ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පාසැල් වැඩසටහන් 23 ක් මෙන් ම අනුරාධපුර මහ රෝහලේදී සහ නාරාහේන්පිට ජාතික මධ්‍යම ලේ බැංකුවේදී තවත් වැඩසටහන් 2 ක් ද 2010 වර්ෂයේදී මණ්ඩලයේ මහජන සම්බන්ධතා ඒකකය මගින් පවත්වන ලදි. මෙම වැඩසටහන් හැරුණු විට මේ හා සමාන වැඩසටහන් ප්‍රා.ස.ම. සහ ග්‍රා.ජ.ස. නිලධාරීන් ගේ සහභාගීත්වය ඇතිව පවත්වන ලදි.

ආංශීය පාර්ශවකරුවන් පෙළඹවීම මගින් ජල සම්පාදන ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් මාර්තු 22 දින ලෝක ජල දින උත්සවය පවත්වන ලදි. "ජලය" මැයෙන් නිකුත් කෙරෙන ත්‍රෛමාසික පුවත්පත තව දුරටත් ප්‍රකාශයට පත් කිරීම සිදුකරන ලදි.

# සේවා

### ප්‍ර.මූ.ස. මගින් ක්‍රියාත්මක ග්‍රාමීය සම්පාදනය පවත්වාගෙන යාම සඳහා සහාය වීම.

විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් ඉදි කරන ලද කුඩා පරිමාණයේ ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 3,000 කට අධික සංඛ්‍යාවක් රට තුළ පවතී. ශ්‍රී ලංකාවේ සම්පූර්ණ ජනගහනයෙන් 8% කට පමණ මෙම ජල සම්පාදන ක්‍රම මගින් ජලය සපයනු ලබයි. දැනට මෙම ජල සම්පාදන ක්‍රම පවත්වාගෙන යාම සඳහා සහාය ලබාදීමට පැහැදිලි ක්‍රමවේදයක් නොමැත. ජල සම්පාදනය පිළිබඳ නව සහශ්‍ර අරමුණු ඉටුකර ගැනීමේදී මෙම ජල සම්පාදන ක්‍රම පවත්වා ගැනීම වැදගත්වන හෙයින් එම ජල සම්පාදන ක්‍රම වෙනුවෙන් සහාය සේවා සැපයීමට මණ්ඩලය විසින් නිශ්චිත පියවරක් ගෙන ඇත. ඒ අනුව ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම අයත් ප්‍රජාවට අවශ්‍ය සහාය සේවා ලබාදීම සඳහා දිප ව්‍යාප්තව පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට ග්‍රාමීය ජල සම්පාදන ඒකක ස්ථාපිත කිරීමට මණ්ඩලය විසින් තීරණය කර ඇත. 2009 වර්ෂය අවසානයේදී එවැනි ග්‍රාමීය ජල සම්පාදන ඒකක 12 ක් ද, 2010 වර්ෂයේදී තවත් ඒකක 5 ක්ද පිහිටුවන ලදි. අම්පාර, වව්නියාව, බදුල්ල, පොළොන්නරුව සහ මාතලේ යන ප්‍රදේශවල එම ඒකක පිහිටුවා ඇත. මන්නාරම, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන ප්‍රදේශවල මෙම ග්‍රා.ජ.ස. ඒකක පිහිටුවීම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීමට අරමුදල් එ.ජා.ළ.අ. වෙතින් ලබාගෙන ඇත. දිස්ත්‍රික්ක මට්ටමින් පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය අරමුදල් ද ඔවුන්ගෙන් ලබාගෙන ඇත.

### ජලයේ ගුණාත්මක බව ඇගයීමේ වැඩසටහන

සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශයේ ආධාර ඇතිව දිස්ත්‍රික් ග්‍රා.ජ.ක්‍ර. ඒකක මගින් මණ්ඩලය විසින් ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම සඳහා ජලයේ ගුණාත්මක බව පරීක්ෂා කර බැලීමේ වැඩසටහන 2009 අගෝස්තු මාසයේ සිට ආරම්භ කරන ලදි. ඉහත සඳහන් වැඩසටහන යටතේ සෑම වර්ෂයකටම එක් එක් ග්‍රාමීය ප්‍රජා ජ.ස.ක්‍ර.වල සුරක්ෂිත පානීය ජලය සැපයීම පරීක්ෂා කිරීම සඳහා අවම වශයෙන් ජල නියැදි 2 ක් ක්ෂුද්‍ර ජීවීන් සඳහා පරීක්ෂාකර බලනු ලබයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ජල නියැදි එක්රැස් කර මණ්ඩලයේ අදාළ පරීක්ෂණාගාර වෙත භාරදෙනු ලබයි. ජල නියැදි පරීක්ෂාකර බැලීමේ පිරිවැය මණ්ඩලයේ මෙ.හා.න. අයවැය මගින් දරනු ලබයි.

ඉහත සඳහන් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් දැනටමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණ පිහිටුවා ඇත. ඉහත සඳහන් වැඩසටහන සමාලෝචනය කර බැලීම සඳහා ජාතික මට්ටමින් මෙහෙයුම් කමිටුව පිහිටුවා ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, ජා.ජ.ස. හා ජ.ම. සහ අනෙකුත් ආංශික හවුල්කරුවන් ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් ය. දිස්ත්‍රික් මට්ටමේදී, දිස්ත්‍රික් ලේකම් විසින් ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමේ කමිටුවේ මුලසුන දරන අතර අනෙකුත් ආංශික හවුල්කරුවෝ ද සහභාගී වෙති. මෙම රැස්වීමේදී ප්‍රජාව පාලනය කරන ජා.ස.ක්‍ර. වල ජල නියැදි පරීක්ෂණ ප්‍රථිඵල ඇගයීමක් කර අවශ්‍ය පිළියම් ද, එවැනි ගැටලු වළක්වා ගැනීම සඳහා උපදෙස් ද ප්‍ර.මූ.ස. වෙත දන්වනු ලැබේ.

ප්‍ර.මූ.ස. මගින් පාලනය කරනු ලබන ජ.ස.ක්‍ර වල ජලයේ ගුණාත්මක බව පිළිබඳ ගැටලු වැළැක්වීම සඳහා එ.ජා.ජ.ළ.අ. මුදල් ආධාර ඇතිව ජලය සුරක්ෂිත කිරීමේ සැලසුම් සකස් කිරීම හඳුන්වාදෙන ලදි. ග්‍රාමීය හා නාගරික ජ.ස.ක්‍ර. සඳහා ජලය සුරක්ෂිත කිරීමේ සැලසුම් සැකසීම සඳහා ජා.ජ. හා ජ. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය පුහුණු කරන ලදි. ජලය සුරක්ෂිත කිරීමේ සැලසුම් සැකසීම සඳහා ප්‍රා.ස.සේ.ම. වල තෝරා ගත් ප්‍රධාන කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට පුහුණුකරුවන් පුහුණුකිරීමේ ජාතික මට්ටමේ වැඩසටහන පවත්වන ලදි. ප්‍රා.ස.සේ.ම. වල අනෙකුත් අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සඳහා ප්‍රා.ස.සේ. මණ්ඩලවලට අවශ්‍ය අරමුදල් යුනිසෙෆ් ආයතනය මගින් ලබා දුනි.

දකුණු පළාතේ පිහිටි ක්‍රියාත්මක හා නඩත්තු අවදියේ පවතින ග්‍රාමීය සහ කුඩා නගර, ප්‍රජා ජල සම්පාදන ක්‍රම 330 ක්ද, පළාත් පාලන ආයතනවලින් පාලනය වන ජල සම්පාදන ක්‍රම 17 ක්ද සඳහා දකුණ ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ ග්‍රාමීය ජල සම්පාදන ඒකකවලින් තාක්ෂණික සහාය ලබා දී ඇත. මීට අමතරව ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමේ දකුණු පළාත් කමිටුව ද, ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් කමිටු ද ස්ථාපිත කර ඇත.

## ජලයේ සහ අපජලයේ ගුණාත්මක බව පරීක්ෂා කිරීම

පිරිසිදු කළ සහ පිරිසිදු නොකළ ජල නියැදියන් සඳහා මූලික රසායන, භෞතික සහ ක්ෂුද්‍රජීවී පරාමිතියන් සඳහා පරීක්ෂා කරනු ලබයි. විශේෂ අවස්ථාවලදී, සුදුසු පරිදි ටී.ඕ.සී. ලෝහ / බැර ලෝහ සහ ඇල්ගී පිළිබඳව ජල නියැදි පරීක්ෂා කරනු ලබයි. අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ අනෙකුත් අංශ ප්‍රධානීන් විසින් එම ජල නියැදි පරීක්ෂා ප්‍රතිඵල සමාලෝචනය කර බලා පිළියම් යෙදීම සඳහා මාසිකව මෙම පරීක්ෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට නියමිත ය. මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අපජල පවිත්‍රාගාර සඳහා ද, පෞද්ගලික අංශ සඳහා ගෙවීම් පදනම් මත ද අපජල තත්ව විශ්ලේෂණය කරනු ලබයි.

අධික ලෙස පළිබෝධ නාශක භාවිතය නිසා ජලයට එකතු වන අතිරික්ත රසායනික ද්‍රව්‍යයන් හේතුවෙන් ජල ප්‍රභවයන්හි සිදුවන රසායනික සංයුතියේ වෙනස්කම් ද, ඇල්ගී වර්ධනය නිසා සිදුවන බලපෑම් ද, ජලයේ දියවී ඇති සම්පූර්ණ ටී.ඕ.සී. විශ්ලේෂණය කිරීම් ද, ජලයේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමේ වැඩසටහනට සමගාමී ව සිදුකරමින් පවතී. වැව්වල ඇති අවසාදිතවලට බැරලෝහ එකතුවීම නිසා ඇතිවන ජල දූෂණය පරීක්ෂාකර බැලීම සඳහා උතුරු මැද පළාතේ නුවර වැවේ අධ්‍යයන කටයුතු සිදුකරන ලද අතර ඉවතට යවන අවලම්බිත මඩ පරීක්ෂා කර බැලීම අඹතලේ ජල පවිත්‍රාගාරයේදී සිදුකරන ලදි. ශ්‍රී ලංකාවේ ජලය පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියේ අවලම්බනය සඳහා භාවිතා වන රසායනික ද්‍රව්‍යයන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් මේ වනවිටත් සිදුකර ඇත.



ඇල්ගී ප්‍රමාණය ගණනය කිරීම සඳහා යොදාගනු ලබන අංකන (ඩිජිටල්) අන්වීක්ෂය

## නව ආරම්භයන්

ජල සම්පාදන හා මලාපවහන සේවා වැඩිදියුණු කිරීම සඳහා හඳුන්වා දුන් නව ආරම්භයන් අතර 2010 වර්ෂයේදී පහත සඳහන් කරුණු ප්‍රධාන විය.

- රජයේ සහ පෞද්ගලික හවුල් ව්‍යාපාර මගින් ආයෝජන ලබාගැනීම සඳහා විකල්ප ව්‍යාපාර ආදර්ශක සකස් කිරීම. (ගොඩනගා ක්‍රියාත්මක කර අයිතිකර ගැනීම (බූ)/ගොඩනගා ක්‍රියාත්මක කර අයිති කරගෙන පැවරීම (බොට්) වර්ගයන් )
- ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල ජීවත්වන ජනතාව නිදන්ගත වකුගඩු අක්‍රියවීමේ රෝගවලින් පෙළෙති. එයට හේතුව ඔවුන් පානය කරන ජලය වන බවට සැක පහළ වී ඇත. පූර්වෝපාය මාර්ගයක් වශයෙන් පානය කිරීම් සහ පිසීමේ අවශ්‍යතා සඳහා විශේෂයෙන් පිරිසිදු කරන ලද ජලය ලීටර් 10 ක ධාරිතාව ඇති ප්ලාස්ටික් බඳුන්වල සැපයීමට විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරනු ඇත.
- ජල සම්පාදනය සහ ජලාපවහනය සඳහා ශ්‍රී ලංකා රජය මගින් සිදු කෙරෙන ආයෝජනයට අමතරව, තොග වශයෙන් ජලය සැපයීම සඳහා ජල පවිත්‍රාගාර ඉදිකිරීමට ආයෝජනයන් දිරිමත් කරනු ලැබේ.
- යටිතල පහසුකම් සැලසීමට දේශීය සංවර්ධන බැංකුවලින් ණය ලබාගැනීමේ හැකියාව පිළිබඳවද අධ්‍යයනය කරනු ලැබේ.
- වැසි ජලය රැස්කර ගැනීම සහ ගෘහස්ථ අපජලය පිරියම් කර පානය සහ පිසීමේ අවශ්‍යතා හැර අනෙකුත් අවශ්‍යතා

සඳහා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ “නව ජල” සංකල්පය ප්‍රවර්ධනය කරනු ලැබේ.

- වැසි ජලය සහ අප ජලය ලබාගෙන ස්ථානිය ජල පවිත්‍ර කිරීම සිදුකර එය ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් ඇතිකිරීම සඳහා විශාල ආයතන සහ වාණිජ සමාගම් උනන්දු කරවීම. එම ආයතන විසින් එම කටයුතු සිදු නොකළහොත් ඔවුන්ට ජලය සැපයීමේ සම්බන්ධතාවයක් ලබා නොදීමට සලකා බැලීම තුලින් ඔවුන් දිරිමත් කිරීමට ද යෝජනා වී ඇත.
- ජල මනු එකලස් කර පසුව නිෂ්පාදනය කිරීමට හැකියාව පිළිබඳව සොයා බලනු ලැබේ.
- ජා.ජ. හා ජ. මණ්ඩලයේ දැනට බලවත් ශ්‍රම පිරිස් 9,000 ක් පමණ රටපුරා තිබෙන ජල සම්පාදන ක්‍රම 300 කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කර නඩත්තු කිරීමේ කටයුතුවල යෙදී ඇත. මෙහෙයුම් පිරිවැය අරපිරිමැසීම සඳහා පාරිභෝගික ජනතාව වෙත නිශ්චිත ජල සැපයුම හා මලාපවහනය සම්බන්ධයෙන් සේවා සැපයීමට මණ්ඩලයේ සම්පූර්ණ අයිතිය ඇති අතිරේක සමාගම් පිහිටුවීමට යෝජනා කර ඇත.
- හැකි අවස්ථාවලදී, නළ මාර්ගය එළීම සඳහා මාර්ග පද්ධතියේ සිදුවන පලුදු කිරීම, කැනීම් හේතුවෙන් මහජන-තාවට සිදුවන අපහසුතා මග හැරීම සඳහා කාණු කැනීමෙන් තොර (Trenchless Technology) තාක්ෂණය යොදා ගැනීමේ හැකියාව සොයා බලනු ලැබේ.

## ආදායම් නොලබන ජලය අඩුකිරීම

ආදායම් නොලබන ජලය කොටස් 4 කින් සමන්විත වේ. ඒවා පහත පරිදි වර්ගීකරණය කළ හැක. භෞතික වශයෙන් හානි සිදුවීම, පරිපාලනමය වශයෙන් හානි සිදුවීම, අනවසරයෙන් ජල පරිභෝජනය සහ නොමිලේ ජල පරිභෝජනය. (බිල්පත් නොමැති නමුදු නිත්‍යානුකූලව ජල පරිභෝජනය.) අනවසර-යෙන් ජල පරිභෝජනය අඩුකර ගැනීමට ගෙන ඇති පියවරවල් සහ සාමාන්‍යයෙන් වැඩිම අලාභහානි ප්‍රතිශතයක් ඇති ප්‍රධාන නගරය වන කොළඹ ප්‍රදේශයේ ආ.නො.ජ. සැපයුම අඩුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සැකසීම පහත විස්තර කරනු ලැබේ.

### නොමිලේ ජල සපයන ස්ථානවල සිදුවන ජල හානිය අඩුකර ගැනීම

කොළඹ නගරයේ වතු ජනාවාස 1,500 ක් පමණ තිබේ. මෙම ජනාවාසවල වෙසෙන බොහෝ ජනතාව පොදු ජල කණු මගින් ජලය ලබා ගනී. මේ නිසා අධික ජල නාස්තියක් සිදුවන අතර ආදායම් නොලබන ජලය ද ඉහළ යයි. මෙයට පිළියමක් ලෙස විශේෂ “රන්දිය වැඩ සටහන” ක්‍රියාත්මක කර ඇත. එමගින් සහනදායී ක්‍රමවේදයක් තුලින් පෞද්ගලික ජල සම්බන්ධතා ලබාදීමෙන් පොදු ජල කණු අවම කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩ සටහන 2000 වර්ෂයේදී ආරම්භ කළ අතර, 2009 දක්වා ප්‍රතිලාභීන් 20,500 ක් මේ සඳහා දායක වී ඇත. 2010 වර්ෂය තුළ ප්‍රතිලාභී පවුල් 828 ක් පෞද්ගලික ජල සම්බන්ධතා ලබාගැනීමට මනාපය පළකර ඇති අතර පොදු ජල කණු 126 ක් විසන්ධි කරන ලදි.



කොළඹ ජනතාව පදිංචි වත්තක නොමිලේ ජලය සපයන ස්ථානයක්

මෙම ජනාවාසවල වෙසෙන පදිංචිකරුවන් වැඩි පිරිසක් දෛනික වැටුප් උපයන්නන් වන අතර ජල සම්බන්ධතාවය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට පහසුකම් සැපයීමත්, ජනාවාස ප්‍රදේශය තුළ ජංගම කාර්යාල මගින් අවශ්‍ය ගෙවීම සිදුකිරීමටත්, එම සියලුම ප්‍රතිලාභීන් ජල සම්බන්ධතාවය ලබාගැනීමට අදාළ අයදුම්පත් ඉදිරිපත්කර ගෙවීම් සිදුකළ පසු පෞද්ගලික ජල සම්බන්ධතා සැපයීමටත් කටයුතු සලසන ලදි. 2010 වසර තුළ මෙවැනි ජංගම කාර්යාල වතු ජනාවාස 5 ක පවත්වා ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කාලයක් ගතවන අතර සාකච්ඡා මගින් තීරණවලට එළඹීමේ ක්‍රියාවලියකින් සමන්විත ය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට දේශපාලනමය වශයෙන් කැමැත්තක් ඇත. එහෙත්, රජයේ නැවත පදිංචි කිරීමේ සැලසුම ගැන මෙම ජනාවාසවල යම් අවුල් සහගත තත්වයක් පවතී.

ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, ජලාපවහන පහසුකම් නොමැති වීම වැනි පෞද්ගලික ජල සැපයුම් සම්බන්ධතාවයන් පවුල් වලට ලබාදීමට දුෂ්කරතා පවතින විට, පොදු ජල කරාම භාවිත කරන්නන්ගෙන් සමන්විත පොදු ජල කණු පාරිභෝගික කමිටුවක් පිහිටුවා ඔවුන්ගේ ජල පරිභෝජනය මනුගත කරනු ලැබේ. අනතුරුව පරිභෝජනය කරන ලද ජලය වෙනුවෙන් ඔවුන් විසින් ගෙවීම් සිදුකිරීම පොදුවේ සිදුකළ යුතුව ඇත.

### අනවසර ජල පරිභෝජනය අවම කිරීම

අනවසර ජල සම්බන්ධතා හඳුනාගැනීම සඳහා ඉංජිනේරු සහකාරවරයෙකුගේ මූලිකත්වය යටතේ කණ්ඩායම් 5 ක් යොදවන ලදි. විවිධ ක්‍රමෝපායන් ඒ සඳහා අනුගමනය කෙරුණි. ඉන් සමහරක් නම්, මහජන පැමිණිලි ඔස්සේ ක්‍රියාත්මක වීම, වාණිජ පරිශ්‍රයක් තුළ අනවසර සම්බන්ධතා පරීක්ෂා කිරීම් මගින් හඳුනාගැනීම, ජල සැපයුම විසන්ධි කරන ලද පරිශ්‍ර තුල සිදුවිය හැකි ජල පරිභෝජනය සොයා බැලීම, හඳුනාගත් ප්‍රදේශ තුල ඡන්ද හිමි නාමලේඛණය අනුව සැලසුම් සහගත සොයා බැලීම මගින් කොළඹ නගරය ආවරණය කිරීම වේ.

ඉතා දිළිඳු නිවාසවල, එසේ නැතහොත් ප්‍රසිද්ධ වාණිජ පරිශ්‍රවල, ඉතාමත් ප්‍රභූවරයෙකුගේ පරිශ්‍රය තුළ හෝ විදේශීය ගරු කටයුතු පුද්ගලයෙකුගේ පරිශ්‍ර ආදී ස්ථානයක අනවසර ජල පරිභෝජනයන් සිදුවිය හැකිය. රටේ නීතිය අනුව සියලු දෙනාට එක සේ සලකනු ලබයි. අනවසර ජල පරිභෝජනයක් අනාවරණය වූ විට, වසර දෙකක කාලයක් තුළ මණ්ඩලයට සිදුවූ අලාභය නැවත අයකර ගනු ලබන අතර ජල සම්බන්ධතාවය විධිමත් කර අනාගතයේ සිදුවන අලාභහානි ද වළක්වනු ලැබේ.



අනවසර ජල පරිභෝජනය සම්බන්ධයෙන් උදාහරණයක්
(සවිකර ඇති නළයකින් අතුරු මගකින් පොම්පයක් මගින් ජලය ලබා ගැනීම)

2010 වර්ෂය තුළදී පමණක් අනවසර ජල පරිභෝජනය අනාවරණය කරගැනීම් 1,669 ක් සිදුකළ අතර රු.මිලියන 55.07 ක මුදලක් ආපසු අයකර ගෙන ඇත. අනවසර පාරිභෝගිකයන් 78 දෙනෙකු අනාවරණය කරගෙන එක් අයකුගෙන් රු.ලක්ෂය ඉක්මවන මුදල් ප්‍රමාණයක් ලබාගෙන ඇත. පසුගිය වාර්තා සමග සසඳා බැලීමේදී, පසුගිය වසර දෙක ඇතුළත නීති විරෝධී ජල අනාවණය කර ගැනීම් සැලකිය යුතු ලෙස පහත වැටීමක් සිදු වී ඇත. ගාස්තු අය නොකරන 1939 යනුවෙන් ඇති ඇමතුම් අංකය මගින් ජනතාවගෙන් නීති විරෝධී ජල පරිභෝජනය පිළිබඳ තොරතුරු ලබාගැනීම අනුමත කරන ලද අතර මෙම අංකය ඉතා ඉක්මණින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

## භෞතික වශයෙන් සිදුවන ජල හානි අඩු කිරීම

කොළඹ නගරය තුළ අධික ජල හානියට ප්‍රධාන හේතුව වී ඇත්තේ දැනට භාවිතා වන ඉතා පැරණි හා අබලන් තත්වයේ පවතින ජල නළ පද්ධතිය යි. පාරිභෝගිකයින් විසින් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට හෝ ගාස්තු අය නොකරන 1939 දුරකථනයට ජල කාන්දු දැනුම් දේ. ජල කාන්දු ප්‍රධාන ජල නළවලින් හෝ ජල සම්බන්ධන ලබාදෙන සේවා නළවලින් සිදුවිය හැක. 2010 වර්ෂය තුළදී, ස්ථාන 2059 ක ප්‍රධාන ජල නළවල ජල කාන්දු සහ ස්ථාන 4289 ක ජල සම්බන්ධන සේවා නළවල කාන්දු ද අළුත් වැඩියා කර ඇත.

## පරිපාලනමය ජල හානි අඩු කිරීම

ජා.ජ.ස. හා ජ.ම. විසින් අක්‍රිය ජල මනු ප්‍රමාණය සම්පූර්ණ ජල සම්බන්ධතාවලින් 1% කට අඩුවෙන් පවත්වාගෙන යාමට ඉලක්ක කර ඇත. 2010 වර්ෂයේදී ප්‍රථම වතාවට බටහිර මධ්‍යම ප්‍රදේශය තුළ මෙම ප්‍රතිශතය ලගාකර ගත හැකි විය. 2009 වර්ෂයේදී, 1307 ක්වූ ජල මනු සවි නොකළ සම්බන්ධතා ගණන 2010 දී, 587 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. ජල පාරිභෝගිකයන් හා මනු කියවන්නන් අතර සිදුවිය හැකි අක්‍රමිකතා වැළැක්වීම පිණිස මණු කියවන්නන් හුවමාරු කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. මෙමගින් ජල මණු කියවීමේ නිරවද්‍යතාවය ද පවත්වාගෙන යා හැක. මෙම ක්‍රමවේදය අනෙකුත් ස්ථානවල ද ආරම්භ කිරීමට නියමිත ය.

## ආදායම් නොලබන ජලය අඩු කිරීමට යොදාගත් වෙනත් පියවරයන්

(අ) ගිණුම්ගත නොවන ජලය අඩු කිරීම පිණිස පාරිභෝගික පරිශ්‍ර සමීක්ෂණය

ගිණුම්ගත නොවන ජලය සඳහා දායක වන සියලුම සාධක හඳුනාගෙන ඒවා ඉවත් කිරීමේ අදහසින් පාරිභෝගිකයන්ගේ පරිශ්‍රවල සමීක්ෂණයක් 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදි. මෙම ක්‍රියා මාර්ගයේ ප්‍රතිඵලයක් වශයෙන් ජල නළ පද්ධතියේ පීඩනය වැඩි දියුණු වීම, තෝරාගත් ප්‍රදේශවල ආ.නො.ජ. අඩුවීම සහ ජල පරිභෝජනය වැඩිවීම සිදුවන ලදි. 2010 වර්ෂයේ ප්‍රතිපාදන අඩුවීම නොතකා යාබද ප්‍රදේශවල ද මෙම ක්‍රියාමාර්ගය දියත් කරන ලදි. මෙය කාලය ගතවන කටයුත්තකි. ඉංජිනේරු සහකාරවරයකුගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමකින් දිනකට පරිශ්‍ර 8 ක් 10 ක් පමණක් සම්පූර්ණ කළ හැකිය. දැනට පරිශ්‍ර 6186 ක් ආවරණය කර ඇත. සාමාන්‍ය වශයෙන් නිරීක්ෂණය වූයේ උසස් තත්වයේ නිවාස ඇති ප්‍රදේශවල ද මනුගත නොකර හා අනවසර ජල පරිභෝජනයන් දැකිය හැකිවීම යි.

(ආ) ආදායම් නොලබන ජලය අඩු කිරීමට ක්‍රියාත්මක හා නඩත්තු කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම.

ආදායම් නොලබන ජලය අඩු කිරීම කාර්යක්ෂමව කිරීමට නම්, ඒ සඳහා බලපාන කරුණු හතරම සමගාමීව සමථයට පත් කර යුතුය. මෙම ක්‍රියාවලිය ජ.ජ.ස.නි. ආයතනයේ ආධාර මගින් ක්‍රියාත්මක වන "කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය" මගින් සිදුකරන ලදි. ව්‍යාපෘතියේ විෂය පථය මගින් කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වන කලාප දෙකක් පමණක් තෝරා ගන්නා ලදි. අනෙකුත් කලාපවල නිලධාරීන්ට මෙම තාක්ෂණය හා දැනුම බෙදා ගැනීම පිණිස ව්‍යාපෘතිය මගින් සතිපතා රැස්වීම් හා සාකච්ඡා පවත්වන ලදි.

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී මාර්ගවලට යටවී ඇති කපාට හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම හෝ අවශ්‍ය පරිදි නව කපාට සවි කිරීම කරන ලදි. මෙම නව විස්තර අනුව ජල නළ පද්ධතිවල සිතියම් නවීකරණය කිරීම ද, දැනට භාවිතා වන ජල නළවල තත්වය පිළිබඳ දත්තයන් ලබා ගැනීමට සිදු කරන ලදි. තෝරාගත් ප්‍රදේශ තුළට ජලය සපයන සන්ධිස්ථාන ප්‍රමාණය අවම කර ජලය බෙදා හැරීමේ පද්ධතිය නැවත සකස් කිරීම තුලින් මාර්ග කිහිපයකින් ජල නළ සම්බන්ධතා ලබා දී ඇති ස්ථාන පිළිබඳ විස්තර ද සොයා ගැනීමට හැකි විය.

2010 වර්ෂය තුළදී ජල සම්බන්ධතා 2,330 ක් අඩංගු තෝරාගත් උප කලාප පහක මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. තව ද, ව්‍යාපෘතියට තෝරාගත් ප්‍රදේශවලට අමතරව ප්‍රාදේශීය ඉංජිනේරු / වැඩ භාර නිලධාරී විසින් නව උප කලාප තුනක ජල නල සම්බන්ධතා 963 ක් සඳහා ද මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදි.

මෙම ව්‍යාපෘති ක්‍රමවේදය තුලින්, ආදායම් නොලබන ජලය අඩු කිරීම පිණිස ඒකාබද්ධ වැඩ සටහනක අවශ්‍යතාවය ක්‍රියාත්මක හා නඩත්තු කාර්යය මණ්ඩලයට හොඳින් වැටහිණි.

## ආදායම් නොලබන ජල අංශය මගින් සපයන වෙනත් සේවාවන්

(අ) ජල බෙදාහැරීමේ පද්ධතිවල ජල කාන්දු හඳුනා ගැනීම

අනෙකුත් පළාත් හා ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශිකවලින් ලැබෙන ඉල්ලීම් අනුව ජල කාන්දු හඳුනා ගැනීමට හා හඳුනාගත් කාන්දුව නියමිතව ස්ථානගත කිරීමට උපදෙස් හා සහයෝගය ලබා දේ. වාහන ගමනාගමනය අවම රාත්‍රී කාලයේ ද, ජල කාන්දු සොයාගැනීම සිදු කළ යුතුව ඇත. 2010 වර්ෂයේදී, මෙම අංශය මගින් ජල කාන්දු 76 ක් හඳුනාගෙන ඇති අතර එයින් 32 ක්ම බස්නාහිර මධ්‍යම ප්‍රාදේශිකයෙන් පිටපළාත්වල විය.

(ආ) පෞද්ගලික පරිශ්‍රයන් තුල ජල කාන්දු හඳුනා ගැනීම

ගෘහස්ථ පාරිභෝගිකයන්ට සහ අනෙකුත් පාරිභෝගිකයන්ට පරිශ්‍රය තුල පිහිටි ජල බෙදුම් පද්ධතියේ ජල කාන්දුව පිළිබඳව දැනගැනීමට ඉල්ලීම මත මුදල් ගෙවා විශේෂඥ දැනුම සපයනු ලැබේ. මෙම සේවාව අපගේ පාරිභෝගිකයින් නොවන අයටද ලබාගත හැක. අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයට ඉල්ලීමක් කර මුදල් ගෙවීමෙන් සේවාව ලබාගත හැක. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පරිශ්‍ර 441 ක් පරික්ෂා කරන ලද අතර එය පසුගිය වර්ෂයේ පරීක්ෂණ කළ පරිශ්‍රයන් සංඛ්‍යාවට වඩා පරිශ්‍ර 294 කි. මේ හැරුණු විට, වාණිජ පරිශ්‍රයන් 4 ක් පරීක්ෂා කර බලන ලදි.

(ඇ) ජල ගලායාම සහ ජල පීඩනය මැන බැලීම

ජංගම උපකරණ භාවිත කර ජල ගලායාම සහ ජල පීඩන මැන බැලීම සාමාන්‍යයෙන් සිදුකරන කාර්යයක් වන අතර ජල පද්ධති නිරීක්ෂණය කිරීම සඳහා එය සිදුකිරීම අවශ්‍ය වෙයි. වෙනත් ප්‍රාදේශියවලින් ලැබෙන ඉල්ලීම් මත මෙම මැන බැලීම් සිදුකළ හැකිය. 2010 වර්ෂය තුළ සාමාන්‍යයෙන් මැන බැලීම් 17 ක් මාසිකව සිදුකරන ලදි. පිට පළාත් වලින් ලැබුණු ඉල්ලීම් මත සිදුකළ මැන බැලීම් 119 ට අමතරව නෛතික වශයෙන් ආදායම් නොලබන ජලය ගණනය කිරීමට අවශ්‍ය මැන බැලීම් 50 ක් සිදු කරන ලදි.

(ඈ) කපාට හඳුනා ගැනීම

අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ජලය නැවැත්වීම, ජලය බෙදාහරින පද්ධති පාලනය කිරීම, ප්‍රදේශයෙන් හුදෙකලා කිරීම ආදී ඇතැම් මෙහෙයුම් කටයුතු සිදුකළ යුතු විට කපාටයක වැදගත්කම වැඩි වශයෙන් දැනේ. කපාටයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ඇති වන්නේ කලාතුරකිනි. අනෙකුත් ආයතන විසින් මාර්ග වැඩි දියුණු කිරීම් අප්‍රවේසම්කාරීව සිදු කරන විට මෙම කපාට නිතරම වැසේ. 2010 වර්ෂය තුළ වැළලී ගිය කපාට 250 ක් හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇත.

(ඉ) නව ගම්පුර ව්‍යාපෘතිය අදියර I හා II

කොළඹ ඌන සේවා ලබන ජනාවාස 300 ක තත්වය වැඩි දියුණු කිරීම සඳහා නව ගම්පුර වැඩ වැඩසටහන කො.ම.න, ජා.නි.ස.අ. ලං.වි.ම, ජා.ජ. හා ජ.ම. සහ අනෙකුත් අදාළ රජයේ සංවිධාන හවුලේ ක්‍රියාත්මක කරන ලදි. ජලය නිකුත් වන කාන්දුවීම් සහ පොදු ජල සැපයුම් ස්ථානවලින් ජලය අපතේයාම අඩුකර ගැනීම සම්බන්ධයෙන් ජා.ජ. හා ජ. මණ්ඩලයේ අවධානය යොමු විය. ඌන සේවා ලබන තවත් ජනාවාස 143 ක ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

## ආදායම් නොලබන ජලය සඳහා අනෙකුත් ප්‍රදේශවල සිදුකරන ප්‍රධාන ක්‍රියාකාරකම්

බස්නාහිර / උතුර ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ අ.නො.ජ. අඩුකර ගැනීම සම්බන්ධයෙන් විශේෂ වැඩසටහන් වූයේ දෝෂ සහගත වූ මනු 16,652 ක් සහ කි.මී. 4.5 ක් දුර ඒ.සී. නල ප්‍රතිසම්පාදනය කිරීම, දොම්පෙ, මල්වාන, මහර, රාගම, ඇල්පිටිය සහ ජා-ඇල යන ප්‍රදේශවල ජල ස්ථම්භවල වැඩි වතුර පිටවීම සම්බන්ධයෙන් අනතුරු ඇඟවීමේ උපකරණ සවි කිරීම, වේයන්ගොඩ, ගම්පහ සහ නිට්ටඹුව ජ.ස. ක්‍රම සඳහා ජල මට්ටම් දර්ශක ක්‍රමයන් ඇති කිරීම සහ ගම්පහ ප්‍රදේශය සඳහා ජල කාන්දු අනාවරණය කර ගැනීමේ උපකරණ මිලදී ගැනීම ය.

බස්නාහිර- දකුණ ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ අ.නො.ජ. අඩුකර ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් සිදුකළ විශේෂ වැඩසටහන් වූයේ පානදුර - හොරණ ප්‍රදේශයේ පොදු ස්ථානීය ජල කරාම 27 සිට 18 දක්වා අඩු කිරීම, පානදුර ප්‍රදේශයේ ගාලුපාර ඔස්සේ කි.මී. 5 ක් දුරටත්, වාද්දුවේ ජල බෙදා හරින පද්ධතියේ කි.මී. 4 ක් පමණ දුරටත් ඒ.සී. නල ප්‍රතිසම්පාදනය කිරීම සහ දෙහිවල ජලස්ථම්භයේ ජලය පිටවන නළයට ජල තොග පිටතට ගලායෑමේ ජල මනුව සවි කිරීමට කටයුතු කිරීම ය.

මධ්‍යම පළාතේ ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ අ.නො.ජ. අඩුකර ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් සිදුකළ වැඩසටහන් වූයේ දෝශ සහගත මනු අලුත්වැඩියා කර එවැනි මනු 10,500 ක් ප්‍රතිසම්පාදනය කිරීම, අලුතින් කපාට 38 ක් සවි කිරීම සහ දැනට පවතින කපාට අලුත්වැඩියා කිරීම, දිස්ත්‍රික් තොග මනු සවි කිරීම, රාත්‍රී කාලයේ සිදුකළ සමීක්ෂණවලින් පසු ජල කාන්දු 118 ක් අනාවරණය කර ගැනීම ය. මීට අමතරව, එක පොදියට සේවා නල කිහිපයක් ලබා දී ඇති ජල නල සම්බන්ධතා සමූහයක් වෙනුවට එක් ප්‍රමාණයෙන් විශාල නලයක් යෙදීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක විය. නාවලපිටිය ජ.ස. ක්‍රමයේ 2010 ජනවාරි මාසයේ 36% ක් වූ අ.නො.ජ. 2010 සැප්තැම්බර් මාසයේදී 10.6% ක් දක්වා අඩුකර ගැනීම ය. මේ

නිසා 2010 වර්ෂයේදී එය හොඳම ජල සම්පාදන යෝජනා ක්‍රමය විය. තිවසින් තිවසට සමීක්ෂණ 400 ක් සිදු කරන ලදි. ජලය ගලායන මිනුම් පරීක්ෂණ 31 ක් සහ පීඩනය අඩුකර පියවර පරීක්ෂණ ද පවත්වන ලදි.

උතුරුමැද (උ.මැ.) සහ වයඹ ප්‍රදේශවල ප්‍රා.ස.සේ.ම. විසින් අ.නො.ජ. අඩුකර ගැනීම පිණිස එක් එක් ප්‍රදේශය සඳහා රු. මිලියන 16 ක් පමණ වැය කරන ලදි. පළාත් දෙකේම පැරණි ජල නළ ප්‍රතිසම්පාදනය සහ කපාට ප්‍රතිසම්පාදනය සඳහා ද උ.මැ. පළාතේ ජල පද්ධතිය කළාපවලට වෙන්කර වැඩි දියුණු කිරීම සඳහා නව කපාට සවි කිරීම සහ වයඹ පළාතේ ජලස්ථම්භ සඳහා ස්වයංක්‍රීය විසන්ධි සංඥා පද්ධති සවි කිරීමද මෙයට ඇතුළත් ය.

සබරගමුව සහ ඌව ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානවල අ.නො.ජ. අඩුකර ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් සිදුකළ විශේෂ කටයුතු වූයේ පිළිවෙලින් සබරගමුව සහ ඌව ප්‍රදේශවල දෝෂ සහගත මනු 6,482 ක් සහ 9,525 ක් ප්‍රතිසම්පාදනය කිරීම, මොණරාගල ජ.ස.ක්‍ර. සඳහා කි.මී. 5 ක් දුරට නළ සමූහයක් ප්‍රතිසම්පාදනය කිරීම, හාලි ඇළ ජ.ස.ක්‍ර. සඳහා කි.මී. 4 ක් දුරට එක පොදියට සේවා නළ කිහිපයක් ලබා දී ඇති සම්බන්ධන ප්‍රතිසම්පාදනය කිරීම, වැල්ලවාය ජ.ස.ක්‍ර සඳහා පීඩනය අඩු කරන කපාටයක් සවි කිරීම, හපුතලේ ජ.ස.ක්‍ර. සඳහා ගැඹුරින් අඩු ජල නළ සහ නළ පොදු සේවා නළ පොදි කිහිපයක් ප්‍රතිසම්පාදනය කිරීමය. ඉහත සඳහන් සියලුම ජ.ස. ක්‍රමවල අ.නො.ජ. සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ඇත.

## බලශක්ති කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බල ශක්ති කළමනාකරණ වැඩසටහන මගින් සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇති අතර එහි අදාළ කටයුතු ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ඉහළ මට්ටමකට වැඩි දියුණු කරන ලදි.

ගාස්තු ප්‍රභේද නිවැරදි කිරීමෙන් හා ඉකුත් වර්ෂවල යා.හා.වි. ප්‍රාග්ධන කටයුතු ආදිය අවසන් කිරීම ද නිසා ඉතිරි වූ මුදල් මෙම වසර තුල ද 100% කින්ම ක්‍රියාත්මක විය. මෙම මුදල් ප්‍රමාණයේ ඉතිරි කිරීම 2010 වර්ෂයේදී, අඛණ්ඩව සමුච්චිත විය. මෙම ඉතිරිකිරීම් වාර්ෂිකව රු.මිලියන 15 ක් පමණ ය. බලශක්ති ප්‍රයෝජනයට ගැනීමෙන් මුදල් ඉතිරිකිරීම් වැඩි කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම නිසා 2010 වර්ෂයේදී බලශක්ති විගණන 32 ක් අවසන් කර ඇත. මෙම බලශක්ති විගණනවල නිර්දේශයන් 2011 සහ 2012 යන වර්ෂවල ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම විගණන අවසන් කිරීමෙන් පසුව මුළු ඇස්තමේන්තු ඉතිරිකිරීම් රු.මිලියන 35 ක අතිරේක මුදල් ප්‍රමාණයක් වනු ඇත.

මේ හැරුණු විට, රු.මිලියන 22 ක වියදමින් වක්වැල්ල පැරණි තුළුමං පොම්පාගාරයේ වැඩ ආරම්භ කරන ලදි. එමගින්, රු. මිලියන 12 ක මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව ඉතිරි වන අතර 2011 අප්‍රේල් මාසයේදී වැඩ අවසන් කිරීමට නියමිතය. රු. මිලියන 05 ක වියදමකින් සබරගමුව ප්‍රාදේශිය සහය සේවා මධ්‍යස්ථානයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 3 ක යාන්ත්‍රික හා විදුලි දියුණු කිරීම් වැඩ කටයුතු සිදුවෙමින් පවතින අතර එහි වැඩ අවසන්වූ පසු වසරකට රු. 960,000 ක මුදලක් ඉතිරිවනු ඇත. 2011 ජනවාරි මාසයේදී එහි වැඩ කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තුලින් ජ.ජා.ස.නි.ආ. විසින් මුදල් සැපයීමට යෝජිත ජා. ජ. හා ජ. මණ්ඩලයේ බලශක්ති සංරක්ෂණ වැඩසටහන 2010 වර්ෂයේදී සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

ජා.ජ.ස.නි.ආ. සහ සුනිත්‍ය බ.අ. විසින් සිදුකළ ජ. ජ. හා ජ. මණ්ඩලයේ බලශක්ති තත්වය පිළිබඳ දීර්ඝ ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසානයේදී රු. මිලියන 4 ක නියමු ව්‍යාපෘතියක් සඳහා ජා.ජ.ස.නි.ආ. මගින් මුදල් සපයනු ලැබීය. ජුබිලි පොම්පාගාරය සඳහා මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. සුනිත්‍ය බ.අ. මගින් ජා.ජ.ස.නි. ආයතනයේ අනුමැතියන් 2011 වර්ෂයේදී ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය යාවත්කාලව ආරම්භ කිරීම 2012 වර්ෂයේදී සිදුවේ.

දේශගුණික විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ ව්‍යුහ රාමුවේ සම්මුතියේ සඳහන් පවිත්‍ර යාන්ත්‍රණ කාර්ය පටිපාටිය ශ්‍රී ලංකාව තුල ඉදිරියට ගෙන යාම සඳහා නම් කර ඇති ජාතික අධිකාරිය වන පාරිසරික අමාත්‍යාංශය සමග ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමස්ථ බලශක්ති වැඩ සටහන ආවරණය වන ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇත. පරිසර අමාත්‍යාංශයේ නියාමනය පිළිබඳ හැකියාවේ වර්ධනය සඳහා ජයිකා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ කණ්ඩායමක් විසින් මේ පිළිබඳව මග පෙන්වීම සිදු කරනු ලබයි. මේ සඳහා වන මූලික වාර්තාවන් මණ්ඩලය විසින් ඉහත කණ්ඩායම වෙත මේ වන විටත් භාර දී ඇත. මේ සඳහා වන කාර්යය පටිපාටියේ ස්වභාවය දුෂ්කර වුවද, මණ්ඩලයේ අධික බලශක්ති පරිභෝජන මට්ටම නිසා එය නියාමනය කිරීමෙන් මූල්‍ය, පාරිසරික හා අනිකුත් නිශ්චිත නොවන ප්‍රතිලාභ ඉතා ඉහළ අගයක පවතිනු ලබයි.

## ආයතනික සංවර්ධනය

මණ්ඩලයේ සම්පූර්ණ සංවර්ධන හැකියාව වර්ධනය කිරීම සඳහා ආයතනික සංවර්ධනයේ වැදගත්කම මණ්ඩලයේ පූර්ව අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇත. අවශ්‍යතා පිළිබඳ තක්සේරුකර බැලීමක් සිදුකර අවශ්‍යතා සපුරාලීමට වැඩ සටහනක් සකසා ඇති අතර එය ක්‍රියාත්මක කරමින් තිබේ. වැඩසටහනේ අභිප්‍රායයන් පහත දැක්වේ.

- වැඩිදියුණු කළ ඵලදායිතාව අත්පත්කර ගැනීම සහ පාරිභෝගිකයා කෙරෙහි සැලකිල්ල යොමු කිරීම පිළිබඳව සියලුම මට්ටම්වල සිටින සේවකයන්ගේ ආකල්ප වෙනස් කිරීම.
- සාමූහික අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- අරමුණු ළගාකර ගැනීම සඳහා දැක්මකින් යුතුව සියලුම සේවකයන් ක්‍රියා කිරීම.
- සහභාගීත්ව ප්‍රවේශය මගින් සෑම සේවකයෙකුගේ දායකත්වය හඳුනා ගැනීම.

පුහුණුකිරීම්, නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්‍ෂණය, සාක්ෂරතාවය, මිත්‍රශීලී සහ වැඩ කිරීම සඳහා යොමු වූ කාර්යාල පරිසරයක් පවත්වාගැනීම සහ එස් 5 ප්‍රතිපත්ති ප්‍රගුණ කිරීම, ඵලදායිතා සම්මාන පිරිනැමීමේ තරගවලට සහභාගී වී එම සම්මාන කිහිපයක් දිනාගැනීම යන කටයුතු සාමාන්‍යයෙන් සිදු කරන ලදි. 2010 වර්ෂය තුළ ආයතනික සංවර්ධන වැඩසටහනේ කටයුතු පිළිබඳ විශේෂ අවස්ථා සහ ඉටු කරගත් අරමුණු පහත විස්තර කර දැක්වේ.

ජා.ජ. හා ජ. මණ්ඩලයේ දීප ව්‍යාප්ත කාර්යාලවල “දැයට සෙවන” මැයෙන් ජාතික රුක් රෝපණ ව්‍යාපාරය පවත්වන ලදි.

බස්නාහිර - මධ්‍යම ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානවල කාර්යාල 3 ක ඵලදායිතා සම්මාන පිරිනැමීමේ තරගය සඳහා සහභාගී වී කෝට්ටේ කළමනාකරණ කාර්යාලය විසින් විශේෂ කුසලතා සහතිකයක් දිනාගෙන ඇත. දිළිඳු ජනතාවට අත්‍යාවශ්‍ය සිල්ලර භාණ්ඩ ත්‍යාග ඇසුරුම් බෙදාහැරීම, කැරොල් ගී ගායනය සහ අවසානයේදී එකට එකතුවීමේ සාදයක් පැවැත්වීම ඇතුළුව බස්නාහිර - මධ්‍යම ප්‍රා.ස.සේ.ම කාර්යාලයේ නත්තල් උත්සවයක් පැවැත්වීම දැක්විය හැක.

සේවකයන්ගේ ආකල්ප වෙනස් කිරීමේ වැඩසටහනක් ද, බස්නාහිර - දකුණ ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කළුගඟ කඳන ජල පවිත්‍රාගාරය නැරඹීමේ ක්ෂේත්‍ර පරීක්ෂාව ද පවත්වන ලදි. පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ සහ පානදුර - හොරණ කාර්යාලයේ ජල පාරිභෝගිකයන්ගේ පහසුව තකා කාර්යාල සැලසුමක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදන ලදි. කොළඹින් දකුණු නගර ප්‍රදේශවල සහ පානදුර - හොරණ පිහිටි ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ පාරිභෝගික සම්බන්ධතා අංශයේ පහසුකම් සහ එය පිහිටි ප්‍රදේශය විශාලත්වය වැඩි කිරීම. වාද්දුව, කළුතර, පයාගල සහ අළුත්ගම කාර්යභාර නිලධාරී කාර්යාලවල ඵලදායීතාව වැඩිදියුණු කිරීම පිළිබඳ දේශන පැවැත්වීම ඒ අතර වේ.

මධ්‍යම ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානයේ ජ.ස.ක්‍රි. ඇති සියලුම වැඩ බිම්වල ජල පෝෂක ප්‍රදේශවල කාබනික පොහොරවලින් ගොවිතැන් කිරීම සහ රුක් රෝපණ වැඩසටහන් සංවිධාන කරන ලද අතර ඒවා ගුණාත්මකව පවත්වන ලදි. මහනුවර උතුරු කාර්යාලය, විසල් මහනුවර ජල පවිත්‍රාගාරය සහ පාතදුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා ඵලදායීතා සම්මාන දිනා ගැනීමට හැකිවිය. කාර්මික සංවර්ධන හා ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීමේ දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ තරගයෙන් මහනුවර නැගෙනහිර කළමනාකරුගේ කාර්යාලය මධ්‍යම පළාතේ තුන්වැනි ස්ථානය දිනාගෙන ඇත.

ජාතික ඵලදායි ඇගයීමේ ව්‍යාපෘතිය යටතේ සේවා අංශය සඳහා විශේෂ කුසලතා සහතිකයක් ලබා ගැනීමට දකුණ ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානය මාලිම්බඩ ජල පවිත්‍රාගාරය හා මාතර කළමණාකරු (ක්‍රි.හා.න.) කාර්යාලය සමත් විය.

#### ආ.ස.බැ. තාක්ෂණ සහය (තාක්ෂණික සහාය)

ජල අංශයේ උපයෝගීතා, කළමනාකරණය සහ මෙහෙයවීම වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ සහ ජා.ජ. හා ජ. මණ්ඩලයේ පරිශ්‍රමයන්ට සහය දීම වැනි ආයතනික ශක්තිමත් කිරීම වෙනුවෙන් 2009 ජුනි මාසයේදී ආ.ස.බැ. තා.ස. (අංක 7078) සකසා ඇත. තා.ස. සඳහා පහත සඳහන් නිශ්චිත කොටස් 4 ඇතුළත් විය.

#### ප්‍රාදේශීය ඇගයීම් ප්‍රමිතිය

පළාතේ ප්‍රධාන කාර්යසාධන දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය හා සැසඳීම සඳහා ප්‍රාදේශීය ඇගයීම් ප්‍රමිතිය හේතු වේ. ප්‍රාදේශීය වශයෙන් ඇති ගැටලු පිළිබඳව අවධානය යොමුකර සමස්ථ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට ඵලදායී කළමනාකරණය, නිරීක්ෂණය හා සැලසුම්කරණය පිළිබඳව තොරතුරු තාක්‍ෂණය මෙවලමක් ලෙස ඉවහල් වේ.

#### ප්‍රාදේශීය ව්‍යාපාර සැලැස්ම

පානීය ජලය සැපයීම වඩා හොඳ සේවාවන් පවත්වා ගැනීම වශයෙන් පරමාර්ථය ඉටු කිරීමෙන් ද, මණ්ඩලයේ සේවා මට්ටම වැඩි දියුණු කිරීමෙන් ද, ප්‍රාදේශීය මට්ටමෙන් විමධ්‍යගතව ඇති වෙනම ව්‍යාපාර සැලසුම සකස් කරන ලදි. මණ්ඩලය වෙනුවෙන් සාමූහික ව්‍යාපාර සැලැස්මක් ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් සකසමින් තිබේ. ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම තුළින් ප්‍රාදේශීය ගාස්තුවක අවශ්‍යතාව පැන නැගී ඇත.

#### වත්කම් කළමනාකරණ සැලසුම්කරණය

වත්කම් කළමනාකරණය හා වත්කම් කළමනාකරණ සැලසුම් සැකසීම සාමාන්‍යයෙන් ප්‍රා.ස.සේ.ම. කාර්යභාරයක් වේ. ඉදිරි අවුරුදු 05 සඳහා එම සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා නිපුණතාවයන් ලබාදීමේ අරමුණින් ප්‍රාදේශීය වශයෙන් විමධ්‍යගත වැඩ කරන කණ්ඩායමක අවශ්‍යතාවය තා.ස. මගින් අවධාරණය කර ඇත.

#### අභ්‍යන්තර නිරීක්ෂණය සහ නියාමනය

තාක්ෂණ සහ ආර්ථික නියාමන මෙන් ම අභ්‍යන්තර නිරීක්ෂණය ක්‍රියාත්මක කිරීම උත්ප්‍රේරණය කිරීම. කාර්ය සැලසුම් සහ උපලේඛන ඇතුළත් න්‍යාය පත්‍රයක් සකසා ක්‍රියාත්මක කිරීමේදී තො.ස. මගින් ජා.ජ. හා ජ.ම. සඳහා සහය ලබාදෙන ලදි. පැවරුම් බලය, කාර්යයන් සහ බලය ඇතුළත් අභ්‍යන්තර නිරීක්ෂණ සහ නියාමන ඒකකයක් පිහිටුවීම සඳහා පරමාර්ථ සහ බැඳීම් ඇතුළත් වන ලෙස ජ.ජ. හා ජ.ම විසින් ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කළ යුතු ලෙස යෝජනා කර ඇත.

2010 මැයි මාසයේදී අ.ස.බැ. අංක 7078 දරන තා.ස. සාර්ථක ලෙස අවසන් විය.

# පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

ප්‍රධාන වශයෙන් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පානීය ජලයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම පිණිස කාර්යක්ෂම පානීය ජල සම්පාදනය අරමුණු කරගත් පහත සඳහන් පර්යේෂණ කටයුතු සිදු කරන ලදි.

### පුත්තලම ජල සම්පාදන ක්‍රමයේ ඇති මැංගනීස් ද්‍රව්‍ය සහ කඨිනත්වය ඉවත් කිරීම

දීර්ඝ කාලයක් තිස්සේ ජලයේ පවතින කඨිනත්වය හේතුවෙන් පුත්තලම ජල පිරිපහදුවේ නිෂ්පාදනය කළ ජලයේ ගුණාත්මක බවෙහි අඩුවක් දක්නට ලැබිණි. අදාළ ජල පෙරණයන් මගින් නිසි පරිදි ජලය පෙරීමක් සිදු නොවුන අතර වැලි පෙරහන් මාධ්‍යය සීඝ්‍ර ලෙස ඝණ බවට පත්වීම එයට හේතුව ලෙස හඳුනා ගන්නා ලදි. ජලයේ ගුණාත්මක බව දැක්වෙන වාර්තා වලට අනුව මූලාශ්‍ර ජලයේ මැංගනීස් මට්ටම සහ කඨිනත්වය අධික ලෙස පවතින අතර මෙම ගැටලුවට එය හේතුවන බව සැක කරන ලදි. එසේම, දැනට පවතින ජල පවිත්‍රාගාරයේ වායු කැවීම සහ ජල පෙරීම අසතුටුදායක බව ප්‍රකටව පෙනෙන කරුණකි.

මෙම ගැටලුව විසඳීමට කරන ලද ප්‍රයත්නයක් වශයෙන් සුදුසු විසඳුමකට එළඹීම සඳහා පරීක්ෂණාගාර අනුකාරකයක් සමග නියමු ජල පවිත්‍රාගාරයක් මගින් ජලය පෙරීම සිදු කරන ලදි. ආරම්භයේදී හුණු සෝඩා ක්‍රියාවලිය මගින් පී.එච්. නිවැරදි අගයට සැකසීම අත්හදා බලන ලදි. රසායනික ද්‍රව්‍යයන් එකතු කිරීමේ සීඝ්‍රතාවයේ සංවේදීතාවයේ ගැටලු සහ ආදර්ශ පවිත්‍රාගාරයේ නළ මාර්ගය හිරවීමේ ගැටලු ඇති වීමෙන් ද මෙම ක්‍රමය අවසන් විය. පිරිසිදු නළ ජලයේ පිළිගත නොහැකි සන්නායකතාව සහ අධික නිෂ්පාදන පිරිවැය හේතුවෙන් අවසාන ප්‍රතිඵලය අසතුටුදායක විය.

අනතුරුව පරීක්ෂණාගාර පරීක්ෂණවලින් පවිත්‍රකරණ ක්‍රියාවලියක් සකස්කර ගන්නා ලදි. පී. එච්. අගය ඉහළ නැංවීමට මෙම ක්‍රමය මගින් හුණු හා සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් යොදාගෙන අනතුරුව මණ්ඩි අවලම්බනය කිරීමට මැටි සහ සීනක්කාරම් භාවිත කරනු ලැබේ. මෙම ක්‍රමයේ වාසිය වන්නේ පවිත්‍රීකරණ ක්‍රියාවලිය අවසානයේදී විශේෂ පී.එච්. සැකසීම අවශ්‍ය නොවන අතර, පිරිසිදු කළ ජලයේ සන්නායකතාව මයික්‍රො සීමනස් / සෙ.මී 1500 සිට 1800 දක්වා පරාසයකට අඩුවීම යි. මේ හැරුණු විට, ඇමෝනියා සහ ක්ෂාරතාවය අඩුවීම වාසිදායක ය. අවසානයේදී ජලය පවිත්‍ර කිරීමේ පිරිවැය ඝ.මී. රු. 13 ක පරාසයක පැවතුණි. පාඨක පොත්වල හුණුවලින් ජලය මෘදු කිරීමේ ක්‍රියාවලිය සඳහන් ව ඇතත්, එම ක්‍රියාවලියම ක්‍රියාත්මක කිරීම සඳහා මෙය ශ්‍රී ලංකාවේ පළමු ප්‍රයත්නය වී ඇත.

### කොණ්ඩුවටුවාන ජල පවිත්‍රාගාරයේ ඒකක පිරිපහදු ක්‍රියාවලියන්වල පරාමිතිය සැලැස්මට එරෙහිව කාර්යසාධන ඇගයීම

අම්පාර දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළබඩ නගර සඳහා ඇති ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. දිනකට ඝ.මී. 17,500 ක් පළමු අදියරට ද, දිනකට ඝ.මී. 72,,000ක් දෙවන අදියරට ද, පිළිවෙලින් 2001 වර්ෂයේදී සහ 2007 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. අදියර දෙකේදී ම ඇල්ගී ඉවත් කිරීම සඳහා ජලයේ දියවූ වාතය මගින් ඉපලීම ක්‍රියාවලිය භාවිත කරනු ලැබීය. ජල පවිත්‍රාගාරය ක්‍රියාත්මක කිරීමෙන් පසුව පාරිභෝගික-යන්ට ලැබුණු ජලයේ වර්ණය, ගඳ සුවඳ සහ රසය පිළිබඳව ඔවුන්ගෙන් විටින් විට පැමිණිලි ලැබුණි. පිරිපහදු කළ ජලයේ ගුණාත්මක ගැටලු විසඳා වඩා හොඳ විසඳුම ලබාදීමට විවිධ ජල පිරිපහදු ක්‍රම උපයෝගී කර ගනිමින් යන්ත්‍රාගාරය ක්‍රියාත්මක කිරීම මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කරන ලදි.

ජල පවිත්‍රීකරණ ක්‍රියාවලියේ බොහෝ අඩුපාඩු හඳුනා ගැනීමට අධ්‍යයනය ඉවහල් විය. රසායන ද්‍රව්‍ය භාවිතයෙන් උපරිම වාසි ලබා ගැනීම පිළිබඳව වැඩිදුර අධ්‍යයන කටයුතු සිදු කිරීමටත් ජල පවිත්‍රාගාරය මගින් මැංගනීස් ද්‍රව්‍ය ඉවත් කිරීමේ කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීමටත් තීරණය කරන ලදි.

### නුවරඑළියේ බෝමුරුඇල්ල ජලාශයේ දූෂිත ද්‍රව්‍ය

නුවරඑළිය ප්‍රදේශයේ ජනතාවට වැදගත් වූ ජල මූලාශ්‍රයක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් බෝමුරුඇල්ල ජලාශය ඉදිකර ක්‍රියාත්මක කරන ලදි. බෝමුරුඇල්ල ජලාශයේ පහළ කොටසේ ජලය උපයෝගී කරගෙන අඹගස්දූව, ලුනුවත්ත, වැලිමඩ, ඌව පරණගම සහ කැප්පෙටිපොළ ගම්මාන සඳහා පානීය ජලය සපයන ලදි. එබැවින් දූෂිත ද්‍රව්‍ය බොහොමයක් හඳුනාගෙන තිබෙන නිසා බෝමුරුඇල්ල ජලාශයේ ජල දූෂණය පිළිබඳව මෙම අධ්‍යයනය වැදගත් වේ. ඉඩම් ගොඩකිරීම නිසා සෝදා පාලුව, එළවළු සෝදන ජලය, මහ නගර සභාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම, වගාකිරීම් නිසා ඇතිවන මතුපිට ජලය සහ නිවාස ප්‍රදේශවලින් ඉවත්වන අපජලය දූෂිත ද්‍රව්‍ය කිහිපයක් ලෙස නම් කළ හැකිය. වර්ෂයේ ඇතැම් කාලවලදී මි.ග්‍රෑ./ලී 225 ක් ලෙස සී.ඕ.ඩී. ඉහළ අගයක් සහිතව ඓන්ද්‍රීය අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ජලාශය වෙත ගලායන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. ඉහළ බී.ඕ.ඩී. මට්ටම, කැලැත්භාවය සහ ඇමෝනියා මට්ටම් ද නිරීක්ෂණය කරන ලදි. සාමාන්‍ය ජල පවිත්‍රීකරණ ක්‍රියාවලියෙන් පසුව පවා ජලාශයේ ජලය පානය කිරීමට සුදුසු නැති බව නිගමනය වී ඇත. කෙසේ වුව ද, මෙම අධ්‍යයනයේදී බැර ලෝහ ද්‍රව්‍ය නිසා ජල දූෂණය ඇතිවීම ඉතා සුළු වශයෙන් සිදුවන බව පෙනී ගියේය. ජලාශයෙන් පහළ ජල ධාරාවේ පිහිටි තුළුමං කෙරෙහි දැඩි බලපෑමක් ඇතිවිය හැකි බැවින් ජලාශය තව දුරටත් දූෂණය වීම පාලනය කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලැබේ. පළිබෝධනාශක සහ ඇල්ගී වැනි පරාමිතියන් පිළිබඳව තව දුරටත් අධ්‍යයන කටයුතු පුළුල් කිරීමට නිර්දේශ කරනු ලැබේ.

**මාතලේ දිස්ත්‍රික්කයේ ස්වාභාවික උල්පත් පිළිබඳව ජල භූ විද්‍යාත්මක සහ භූ රසායන විද්‍යාත්මක අධ්‍යයනය**

ජලය සැපයීමේදී මාතලේ ස්වාභාවික උල්පත්වලින් වැදගත් මෙහෙයක් ඉටු වේ. ජලයේ ගුණාත්මක පරාමිතීන් පිළිබඳව භූ විද්‍යාවල ව්‍යුහය, භූ ලක්ෂණය, ජලාපවහනය, ජීර්ණයට ලක් වූ පාෂාණවල ස්වාභාවය සහ කාල හා අවකාශ වර්යාව සම්බන්ධයෙන් උල්පත්වල ජල භූ විද්‍යාත්මක සහ භූ රසායන විද්‍යාත්මක ලක්ෂණ ඇගයීම සලකා මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

සවිස්තර ක්ෂේත්‍ර සිතියම් සැකසීම, තෙත් සහ වියළි කාලවලදී ජල ප්‍රභවයේ ජල ධාරිතාවය සහ ලක්ෂණ භූ විද්‍යාව හා භූ විද්‍යාත්මක ලක්ෂණ සහ ප්‍රදේශයේ ජලාපවහන රටාව සමග සංසන්දනය කරන ලදි. උල්පතින් ගලන ජල ප්‍රමාණයන් මැන බලන ලද අතර ඉහත සඳහන් ලක්ෂණ සමග සම්බන්ධතා-වයක් සොයා බැලීමට විශ්ලේෂණය කරන ලදි. මාසික වර්ෂාපතනය සහ මතුපිට ජලය වාෂ්පවීම පිළිබඳ දත්තයන් වල සාමාන්‍ය ගණන් බලා සසඳන ලදි. උල්පත් 27 ක් සම්පූර්ණයෙන් විශ්ලේෂණය කරන ලදි. පී.එච්. අගය, සන්නායකත්වය, කඨිනත්වය ප්‍රධාන කැටායන හා සෘණ ආරෝපිත පරාමිතිකයන් විශ්ලේෂණය කරන ලදි. හුණුගල් වර්ග, කුස්තුර, බිඳීම් හා කුඩා ප්‍රමාණයේ අංශු වලින් සමන්විත කිරිගරුඬවලින් මාතලේ දිස්ත්‍රික්කයේ උල්පත් සැකසී ඇත. නැ.බ. සහ උ.ද. දිශාවන්වල ප්‍රධාන කැපී පෙනෙන පාෂාණ ලක්ෂණ ඇත. කැපී පෙනෙන පාෂාණ ලක්ෂණ සහ පහත් ආරෝපණ නිම්න ප්‍රදේශ ආශ්‍රිතව උල්පත් වර්ගය තිබෙන බව පෙනී ගියේය.

උතුරු ප්‍රදේශයට පවතින උල්පත්වල ජල සක්‍රියතාවයේ සාමාන්‍යයෙන් වැඩිවීමක් ඇත. උල්පත් ජල සක්‍රියතාවය සඳහා සැලකිය යුතු සෘතු බලපෑමක් නොපෙනේ. පැහැදිලි චක්‍රියත්වය සහිත වෙනසක් පෙන්නුම් කළ ප්‍රධාන ප්‍රතිආරෝපණ මූලාශ්‍රය වන්නේ වර්ෂාපතනය යි. විධිමත් නළ ළිං වාර්තා විශ්ලේෂණය මගින් අනාවරණය වූයේ නොගැඹුරු ජල මට්ටම් සහ නොගැඹුරු පාෂාණ පැලීම් ඇති ප්‍රදේශවල උල්පත් එලදාව ඉහළ මට්ටමක පවතින බව ය.

කිරිගරුඬවලින් ලැබෙන උල්පත් ජලය කැල්සියම්, මැග්නීසියම්, බයිකාබනේට් වර්ගයේ ජලය වේ. විදුලි සන්නායකත්වය හැර අනෙකුත් අයන සාන්ද්‍රණයන් වැඩිවීමක් තෙත් සෘතුව සමග සසඳන විට වියළි සෘතුවේදී දක්නට ලැබේ. ව්‍යාප්ති රටාවේ සාමාන්‍ය ස්වරූපය සම්බන්ධයෙන් ප්‍රදේශය පරාමිති ව්‍යාප්තියේ කැපී පෙනෙන සමානත්වයක් පෙනේ. කඨිනත්වය, සන්නායකත්වය බයිකාබනේට් සහ ද්‍රාවණ ඝන ද්‍රව්‍යවලින් නිරිත දිශාවෙන් වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙනෙන අතර එම දිශාවෙන් ක්ලෝරයිඩ්, පොටැසියම් සහ සල්ෆේට් ද්‍රව්‍ය අඩුවීමේ රටාව පෙනේ.

ප්‍රදේශයේ පිහිටි උල්පත්වල භූගත ජලය වාරිමාර්ග සහ පානීය අවශ්‍යතා සඳහා සුදුසු බව ජලයේ ගුණාත්මක පරාමිතිවලින් පෙනේ. ජල සම්පාදන මූලාශ්‍රය වශයෙන් උල්පත් ජලය සංවර්ධනය කිරීමෙන් ප්‍රදේශයේ ජනතාවගේ සැලකිය යුතු කොටසක් සඳහා සේවා සැපයීමට හැකි වේ.

# ග්‍රාමීය ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව

දැනට ක්‍රියාත්මක වන ද්විතිය නගර සහ ග්‍රාමීය ප්‍රජා මූලික ජල සම්පාදනය හා සනීපාරක්ෂක ව්‍යාපෘතියට ප්‍රජාව සහභාගිත්ව ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ඇතුලත් වේ. (45 වැනි පිටුවේ වැඩි විස්තර දැක්වේ.)

මණ්ඩලයේ ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් පොළොන්නරුව, මාතලේ සහ කුරුණෑගල දිස්ත්‍රික්ක සහ ඌව පළාත සඳහා ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් අනුමැතිය ලබාගෙන ඇත. දකුණු සහ නැගෙනහිර පළාත් සඳහා යෝජනා සකස් කර ඇති අතර ඇගයීම් කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

උතුරු වසන්තය වැඩසටහන සඳහා ග්‍රාමීය ජල සම්පාදන යෝජනාව වව්නියාව, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය වන ලෙස නැවත පදිංචි කරවීමේ සහ ආපදා සහන සේවා අමාත්‍යංශය වෙත යවා ඇත.

ලෝක බැංකුව වෙතින් අරමුදල් ලබාගැනීම සඳහා කුරුණෑගල, බදුල්ල, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක සඳහා ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂාව සඳහා සවිස්තර ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇත.

උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ සඳහා ග්‍රාමීය ජල සම්පාදනය වෙනුවෙන් ලෝක බැංකුව මගින් මුදල් සපයන නියමු ව්‍යාපෘතිය සාකච්ඡා මගින් නිගමනයකට එළඹීමේ අවස්ථාවේ තිබුණු අතර එය 2011 පළමු කාර්තුව තුළ ආරම්භ කරනු ලැබේ.

2011 ලෝක ජල දිනය වෙනුවෙන් ප්‍රජා මූල සංවිධාන අතර තරගයක් පැවැත්වීමට සැලසුම් කර ඇත. තරගය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන වෙනුවෙන් අවශ්‍ය මුදල් එ.ජ.ළ.අ, ජා.ර.කු.ස සහ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධානවලින් ලබා ගැනීමට කටයුතු යෙදිය යුතුව ඇත.

ග්‍රාමීය ජල සම්පාදනය සඳහා දත්ත ජාලයක් පිහිටුවීම සඳහා එ.ජ.ළ.අ. අවශ්‍ය අරමුදල් ලබාගන්නා ලදි. ඉහත සඳහන් වැඩ සටහන යටතේ දිස්ත්‍රික් මට්ටමේ ග්‍රා.ජ.ස. ඒකක සඳහා පරිගණක පහසුකම් සලසන ලද අතර දත්ත සමුදාය පිහිටුවීම සඳහා මෘදුකාංග වැඩසටහන් පරිගණකවලට ඇතුලත් කර ඇත. ප්‍රා.ස.සේ.ම. වල දැනට පවත්නා දත්ත තබා ගැනීමේ ක්‍රම මගින් ග්‍රා.ජ.ස. ක්‍රමයට දිස්ත්‍රික්ක මට්ටමේ දත්ත සමුදායක් සම්බන්ධ කර ඇත. දිස්ත්‍රික්ක ග්‍රා.ජ.ස. ඒකක මගින් ඉහත කී දත්ත සමුදායට ද.ජා. දත්ත වශයෙන් දත්ත ඇතුළත් කරනු ලබන අතර එම දත්ත සටහන් ඇතුළත් කිරීම 2011 වර්ෂය තුළ නිම කරනු ලැබේ.

**ජා.ජ. හා ජ.ම. විසින් සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු ජාත්‍යන්තර සමුළුව සඳහා කටයුතු සූදානම් කිරීම.**

ජා.ජ. හා ජ.ම විසින් සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු ජාත්‍යන්තර සමුළුවේ ජාතික මෙහෙයුම් කමිටුව මගින් ජාත්‍යන්තර සමුළුව සඳහා සූදානම් වීමට ප්‍රධාන කොටස්කරු වන අතර ජාතික මෙන්ම ප්‍රාදේශීය වැඩමුළු සංවිධානය කිරීමේදී ඊට අවශ්‍ය සහය ලබාදෙන ලදි. කොළඹදී ජාතික වැඩමුළුව පවත්වන ලද අතර මාතර සහ බණ්ඩාරවෙලදී දැනුවත් කිරීමේ පළාත් වැඩසටහන් 2 ක් පවත්වන ලදි. 2011 ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලය තුළ මහනුවර, අනුරාධපුරය, වව්නියාව සහ අම්පාර යන ස්ථානවල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නියමිත ය. මේ හැරුණු විට, 2011 අප්‍රේල් මාසයේදී, සනීපාරක්ෂාව පිළිබඳ IV වැනි දකුණු ආසියානු ජාත්‍යන්තර සමුළුව පැවැත්වීමට සහය ලබාදෙමින් ඇත.

## භූගත ජලය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ භූගත ජලය හා සම්බන්ධව අදාළ කටයුතු වෙනුවෙන් අත් පොම්ප හා ඵලදායී නළ ළිං පිළිබඳ ජල භූ විද්‍යාත්මක සහ භූ භෞතික විද්‍යාත්මක විමර්ශන සිදු කිරීම, ගැඹුරු හා නොගැඹුරු නළ ළිං කැණීම, නව අත් පොම්ප සවි කිරීම, ඵලදායී නළ ළිං සඳහා පොම්ප කිරීමේ පරීක්ෂණ සිදු කිරීම, ජලය ගලායාම මැන බැලීම, ජල පිහිරීම් කටයුතු සහ උතුරු නැගෙනහිර ප්‍රදේශවල කණින ලද ළිං පිරිසිදු කිරීම යන කටයුතු සිදු කරන ලදි. ජල භූ විද්‍යාත්මක විමර්ශන 478 ක් නිම කිරීම, නළ ළිං 276 ක් (ගැඹුරු සහ නොගැඹුරු) ඉදි කිරීම, පොම්ප කිරීමේ පරීක්ෂණ 82 ක් සිදු කිරීම, අත්පොම්ප 448 ක් අලුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම, අත් පොම්ප 114 ක් සවි කිරීම, ළිං 105 ක් සංවර්ධනය කිරීම, ජල පිහිරීම් කටයුතු 4 ක් සිදු කිරීම, මතු පිට ජලය ගලායාම මැන බැලීම් 2 ක් හා කැණූ ළිං පිරිසිදු කිරීමේ කටයුතු 646 ක් සිදු කිරීම ලැබූ ප්‍රගතිය විය.

## සමාජ විද්‍යාත්මක කටයුතු

2010 වර්ෂය තුළ සිදුකළ සමාජ විද්‍යාත්මක කටයුතුවල විශේෂයෙන් සිදු වූ වැඩකටයුතු පහත දැක්වේ.

- කොළඹ විශ්ව විද්‍යාලය මගින් සිදු කරන ලද ජ.ස.ක්‍ර. පිළිබඳව සමාජ විද්‍යාත්මක පරීක්ෂණය සඳහා පහසුකම් සලසන ලදි.
- ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳව කාර්ය පරිපාටි සංග්‍රහයට (පි 1) අදාළ ශක්‍යතාව වාර්තා සැකසීමට අවශ්‍යවන, සමාජ විද්‍යාත්මක කරුණු පිළිබඳව පුහුණු වැඩසටහන් ඉංජිනේරුවරුන්, සමාජ විද්‍යාඥයන්, රසඥයන් සහ කාර්මික නිලධාරීන් සඳහා පැවැත්වීම.
- ජල සම්පාදනය ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව ආරක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය සමාජ විද්‍යාඥයා විසින් මහනුවර ප්‍රදේශයේ පාරිභෝගික සෝදිසි කමිටු පිහිටුවීම.
- අගුලාන, රත්මලාන යන ප්‍රදේශවල යෝජිත අපජලය බැහැරලන මුහුදු පිට දොර ඉදි කිරීම නිසා බලපෑමට ලක්වන ධීවර ජනතාවට වන්දි ගෙවීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම, අපජලය පවිත්‍ර කිරීමේ පහසුකම පිළිබඳව වාසි සම්බන්ධයෙන් ධීවර ජනතාව දැනුවත් කිරීමට උපදෙස් රැස්වීම් ද පවත්වන ලදි.
- ප්‍රජාව සහභාගි කර ගැනීම පිළිබඳව අත් පොම්ප නළ ළිං පිළිබඳව නඩත්තු ප්‍රතිපත්තිය (නෙවැදැරුම් ප්‍රතිපත්තිය) සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම, අත් පොම්ප ළිං පිළිබඳව නෙවැදැරුම් නඩත්තු ක්‍රමය කෙරෙහි විශේෂ අවධානය ඇතිව ජල සම්පාදන හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රජා සහභාගිත්වය පිළිබඳව පර්යේෂණ කටයුතුවලට පහසුකම් සැපයීම.
- ජල සංරක්ෂණය සහ ග්‍රා.ජ.ස. හා ප්‍රචාරය කිරීමේ ඒකක සහභාගි කරගෙන අ.නො.ජ. අඩුකර ගැනීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීම.
- ප්‍රාදේශීය සමාජ විද්‍යාඥයා විසින් මොරටුව ප්‍රදේශයේ බිල්පත් නොගෙවීම පිළිබඳව විශේෂ අධ්‍යයනයක් සිදු කිරීම.
- කුඩා පරිමාණයේ ජ.ස.ක්‍ර. සඳහා සැලසුම්කරණය මාර්ගෝපදේශ සැකසීම.
- මහජනතාව වෙත නිසි සනීපාරක්ෂක සේවා ලබාදීමට දේශපාලන නායකත්වය සංවේදීකරණය කිරීම සඳහා සනීපාරක්ෂාව පිළිබඳව දකුණු ආසියානු ජාත්‍යන්තර සමුළුව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීම.

## ප්‍රතිපත්ති සම්පාදනය

බීමට ජලය සඳහා ජාතික ප්‍රතිපත්තිය හා සනීපාරක්ෂාව සඳහා ජාතික ප්‍රතිපත්තිය යන ජාතික ප්‍රකාශන දෙක ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා පාර්ශවකරුවන්ගේ සහ මහජනතාවගේ අදහස් ලබාගැනීම පිණිස මාධ්‍ය මගින් සහ රැස්වීම් / දැනුවත් කිරීම් මගින් අවස්ථාව ලබාදෙයි. මෙම අදහස් ද ප්‍රතිපත්ති ප්‍රකාශන වලට ඇතුළත් කිරීමෙන් පසුව බීමට ජලය සඳහා ප්‍රතිපත්තියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සනීපාරක්ෂාව සඳහා ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

# තොරතුරු තාක්ෂණය

ඉන්දියානු රජයේ අරමුදල් සපයන තො.තා. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සමගින් ව්‍යවසාය ව්‍යාප්ත තො.තා. විසඳුම හඳුන්වාදීම. ජා.ජ හා ජ. මණ්ඩලයේ වැදගත් ව්‍යාපාර කටයුතු ආවරණය වන ප්‍රධාන මොඩියුල 11 ක් ඇතුළත් විය. 2010 වර්ෂය තුළ ව්‍යවසාය ව්‍යාප්ත තො.තා. විසඳුම් ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා එය ප්‍රධාන වශයෙන් දායක විය. දීප ව්‍යාප්තව විසඳුම් ක්‍රියාත්මක කර ආයතනයේ කාර්ය මණ්ඩල සම්පත් උපයෝගී කරගෙන විසඳුම් පවත්වාගැනීම සඳහා මණ්ඩලයේ තො.තා. අංශය ශක්තිමත් කර අංග සම්පූර්ණ කරන ලදි. 2010 වර්ෂය තුළදී, තො.තා. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 10 ක් වටිනා උපකරණ ලබාගන්නා ලදි.

තො.තා. ව්‍යාපෘතිය යටතේ කෝට්ටේ ප්‍රදේශයේ මනු කියවන්නන් සඳහා පහසුවෙන් රැගෙන යා හැකි දත්ත ගබඩා උපකරණ හඳුන්වා දෙන ලදි. 2010 වර්ෂය දත්ත ගබඩා උපකරණ සඳහා මුද්‍රණ යන්ත්‍ර (ප්‍රින්ටර්) ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කරන ලදි. තො.තා. විසඳුම පිළිබඳ මෘදුකාංග මොඩියුල සමග උපක්‍රම යෙදවීම සකසා තිබුණි. 2010 වර්ෂයේදී කෝට්ටේ දී මුද්‍රණ යන්ත්‍ර (ප්‍රින්ටර්) ලබා දී තිබුණි.

මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා පාරිභෝගිකයන්ට තම පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පහසුකම් ඇති කිරීම පිණිස පාරිභෝගික පැමිණිලි ක්‍රමය වැඩි දියුණු කරන ලදි.

2010 වර්ෂය තුළදී දීප ව්‍යාප්තව මණ්ඩලයේ කාර්යාල සම්බන්ධ කරන අතථ්‍ය පෞද්ගලික පරිගණක ජාලයක් ව්‍යාප්ත කරන ලදි. යාපනය සහ වව්නියාව ඇතුළුව කිහිපයක් හැර කාර්යාල බොහොමයක් අතථ්‍ය පෞද්ගලික පරිගණක ජාලය මගින් ආවරණය කෙරේ. මණ්ඩලයේ විද්‍යුත් තැපැල් ක්‍රමය 2010 වර්ෂය තුළ ක්‍රියාත්මක ය. දැනට විද්‍යුත් තැපැල් ගිණුම් 300 ක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ලැබී ඇත.

ඒ.ඩී.එස්.එල්. (ADSL) පහසුව මගින් ප්‍රාදේශීය පරීක්ෂණා-ගාරවල ජලයේ ගුණාත්මක බව පිළිබඳ ඇතුළත් දත්ත මධ්‍යම පරීක්ෂණාගාරය වෙත යොමු කළ හැක.

## ඉදිරි සැලසුම්

ස්වයංක්‍රීයව මෙහෙයවන ජල මාපක කියවීමේ ක්‍රමවේදයක්, ජලය පාවිච්චි කිරීම සඳහා පෙර ගෙවුම් ක්‍රමවේදයක්, ජල මට්ටම් පාලනය සඳහා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ හරහා එස්. එම්. එස්. තාක්ෂණය යොදා ගැනීම පිළිබඳවත්, රසායනික ද්‍රව්‍යවල සාන්ද්‍රණය මැනීම සඳහා විද්‍යුත් යාන්ත්‍රික මෙවලම් පාවිච්චිය පිළිබඳව දැනට පර්යේෂණ සිදු කරනු ලබයි.


ඔබගේ කැමැත්ත
වියළි ලෝකයක්
නොසැලකිලිමත්
මානව
ක්‍රියාකාරකම්
හේතුවෙන් පරිසරය
දූෂිත වේ.
අපි පරිසරය
ආරක්ෂා කරමු.


යටිතල පහසුකම් සංවර්ධනය
කුමක්ද . . . ?
හරිත ලෝකයක්
මෙය අපගේ
අනාගත පරපුරෙහි
ජීවන තත්වය
සුරකින අතර
පානීය අවශ්‍යතාවයන්
සඳහා ජලය
සුරක්ෂිත කරයි.
ජලය ඉතා අගනේය.
එය අරපරිස්සමින් භාවිතා කරන්න.

# වැඩ සිදුවෙමින් පවතින ව්‍යාපෘති

## ප්‍රධාන ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති නිපුණතාවය

**2010 වර්ෂය තුළ ඉදි කරමින්/ වැඩි දියුණු කරමින් තිබූ විදේශ අරමුදල් ලැබූ ව්‍යාපෘති පිහිටි ස්ථාන පිළිබඳ සිතියම.**



| | ව්‍යාපෘතිය | ආධාර දෙන ආයතනය/රට |
|---|---|---|
| A | කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I පියවර II | JICA - ජපානය |
| B | මහකොළඹ පුනරුත්ථාපන ජල ව්‍යාපෘතිය | JICA - ජපානය |
| C | කොළඹින් උතුර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II | JICA - ජපානය |
| D | විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I පියවර II | JICA - ජපානය |
| E | නැගෙනහිර පළාත ජල සම්පාදන වැඩිදියුණු කිරීම | JICA - ජපානය |
| F | වව්නියාව සහ යාපන දිස්ත්‍රික් අවතැන් කඳවුරු වලට ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | JICA - ජපානය |
| G | කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩුකිරීමේ ව්‍යාපෘතිය | JICA - ජපානය |
| H | මහනුවර දකුණ ජල සම්පාදන ව්‍යාපෘතිය | DANIDA - ඩෙන්මාර්කය |
| I | නුවරඑළිය දිස්ත්‍රික්ක ඒකාබද්ධ නගර ජල සම්පාදන ව්‍යාපෘතිය | DANIDA - ඩෙන්මාර්කය |
| J | කැළණි ගඟ දකුණ ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය | DANIDA - ඩෙන්මාර්කය |
| K | ද්විතිය නගර ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ADB 4th) | ආ.ස.බැ |
| L | සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශ ගොඩනැංවීමේ ව්‍යාපෘතිය | ආ.ස.බැ |
| M | වියලි කලාපයේ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ADB 5th) | ආ.ස.බැ |
| N | හම්බන්තොට, අම්බලන්තොට හා වැලිගම ජල සම්පාදන සක්‍යතා අධ්‍යයනය | ඔස්ට්‍රියාව |
| O | කිරිඳිඔය ජල සම්පාදන ව්‍යාපෘතිය | ඔස්ට්‍රියාව |
| P | සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය (ගාල්ල දිස්ත්‍රික්කය) | ජර්මනිය |
| Q | අම්පාර, නාවලපිටිය සහ කොග්ගල ජල සම්පාදන ක්‍රමය | කොරියාව |
| R | මීගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම | නෙදර්ලන්තය |
| S | සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය | UNICEF |
| T | සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය | IFRC |
| U | විසල් ත්‍රිකුණාමල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | ප්‍රංශය |
| V | මොරටුව, පානදුර, හා මීගමුව පිරිපහදු ජල පහසුකම් ලබාදීමට අඹතලේ හා මීගමුව ජල පවිත්‍රාගාර ඉදිකිරීම | ස්පාඤ්ඤය |
| 1 | මහකොළඹ අපජල කළමණාකරණ ව්‍යාපෘතිය | ආ.ස.බැ |
| 2 | නුවර මහ නගර ප්‍රදේශය සඳහා අපජල පද්ධතිය | ජපානය |
| 3 | රත්මලාන/මොරටුව හා ජා ඇල/ඒකල ප්‍රදේශවල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය | SIDA - ස්වීඩනය |
| 4 | කොළඹ දකුණු ප්‍රදේශයේ මලාපවහන පුනරුත්ථාපන ව්‍යාපෘතිය | ඔස්ට්‍රියාව |

● ජල සම්පාදන ව්‍යාපෘති ● මලාපවහන ව්‍යාපෘති

# විදේශාධාර ජල සම්පාදන ව්‍යාපෘතිය

## ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ජපන් බැංකු ආධාර ඇතිව ආරම්භ කළ ව්‍යාපෘති

### 1. කළුගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය, අදියර I පියවර II

කලුගග ජල සම්පාදන ව්‍යාපෘතිය, අදියර I පියවර II 2008 වර්ෂයේදී අවසන් කරන ලදි. පළමුවන පියවරේ දෙවන අදියරේ සවිස්තර සැලසුම් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2009 වර්ෂය තුළ අවසන් කරන ලදි.

මහකොළඹ දකුණු කොටසේ පානීය ජලය සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වී ඇත. කැස්බෑව, පිළියන්දල, ජඹුරලිය, කුඹුකේ සහ අවට පළාත්වල වෙසෙන 250,000 ජනතාව මෙහි ප්‍රතිලාභීන් වනු ඇත.

**ව්‍යාපෘතියේ යෙදවුම් සහ විෂය පථය**

- කඳන හොරණ දිනකට ඝ.මී. 60,000 ක ධාරිතාවය ඇති ජල පවිත්‍රාගාරය.
- මි.මී. 1,000 සිට 800 දක්වා විශ්කම්භය සහිත කි.මී. 15 ක් දුර ප්‍රමාණයේ ඩී.අයි. සම්ප්‍රේෂණ නළ මාර්ගය සහ මි.මී. 450 සිට 400 දක්වා විශ්කම්භය සහිත කි.මී. 7 ක දුර ප්‍රමාණයේ ඩී.අයි. ද්විතීය නළ මාර්ග
- පිටකොටුව, අලුත්කඩේ සහ කොළඹ කොටහේන හා මරදාන ප්‍රදේශවල තෝරාගත් ජලය බෙදාහැරීමේ නළ මාර්ග පුනරුත්ථාපනය කිරීමෙන් කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩුකර ගැනීම, සම්පූර්ණ දිග කි.මී. 57 කි.
- කැස්බෑව, ජඹුරලිය සහ කුඹුකේ ජල ස්ථම්භ ඉදි කිරීම (ටෙන්ඩර් පිරිනමා ඇත)

ඩී.අයි. නළ හා උපාංග සැපයීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ වැඩ කටයුතු කෙරීගෙන යන අතර පී.වී.සී. නළ හා උපාංග සැපයීම නිමවී ඇත. සැපයුම් 2 ම ජලය බෙදාහැරීමේ පද්ධතිය සඳහා ය. 2010 වර්ෂය අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 15% ක් සහ 7%ක් වී ඇත.



කැස්බෑව ජල ස්ථම්භය ඉදි කිරීම

### 2. මහ කොළඹ ජල සම්පාදන පුනරුත්ථාපන ව්‍යාපෘතිය

කොළඹ ප්‍රදේශයේ සුරක්ෂිත පානීය ජලය සැපයීමේ සේවා මට්ටම උසස් තත්වයකට පත් කිරීම මෙම පුනරුත්ථාපන ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

බොහෝ ප්‍රාග්ධන ව්‍යාපෘති අතර සහශ්‍රයේ සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමේ අභිප්‍රාය ඇතිව සැලසුම් කර ඇති මෙම ව්‍යාපෘතිය එකී විශාල ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියකි. මහකොළඹ ප්‍රදේශයේ ආදායම් නොලබන ජල සැපයුම අඩුකර ගැනීමේ වැඩසටහන සඳහා මණ්ඩලයේ දීර්ඝකාලීන ක්‍රමෝපාය වෙනුවෙන් මෙය ඉදිරි පියවරක් තබන ලද ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාලසීමාව 2007 සිට 2012 දක්වා පවතී. මුලු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 5,380 ක් වන අතර ජා.ස.ජ.බැ. මගින් ලැබෙන මුදල් ඊට ඇතුළත් ය. කොළඹ මහ නගර සභාවේ සහ කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රදේශයේ ජල සැපයුම් පද්ධති පුනරුත්ථාපනය සහ වර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ යි. ව්‍යාපෘතියට පහත සඳහන් කටයුතු ඇතුළත් ය.

I. මාලිගාකන්දේ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම.
II. කොට්කාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශයේ ජලය බෙදාහැරීමේ පද්ධති ජාලය සැපයීම හා එලීම.
III. ප්‍රධාන සිවිල්, විදුලි හා යාන්ත්‍රික කටයුතු
කොට්කාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශයේ ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගය ඉදි කිරීම. මාලිගාකන්ද ජලාශය, එලිහවුස් නව ජලාශය සහ ගොතටුව ජල ස්ථම්භය ඉදි කිරීම.
IV. කොළඹ නගරයේ වතු ජනාවාස 8-10 අතර ප්‍රමාණයක් සඳහා ජල සම්බන්ධතා 1000ක් සපයමින් අඩු ආදායම් ලබන ජනාවාස සඳහා ජල සැපයුම වැඩිදියුණු කිරීම.

ව්‍යාපෘතියේ භෞතික වැඩකටයුතු ප්‍රගතිය 28% කි

### 3. කොළඹින් උතුරු නගර සඳහා ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර II

මහ කොළඹ උතුරු ප්‍රදේශය වෙනුවෙන් ජල සැපයුම් සේවා ව්‍යාප්ත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. යෝජිත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමෙන් පසුව 2025 වර්ෂය වන විට ජනගහනයෙන් 500,000 ක පිරිසකට ජල සැපයුම ලබාදීම ඉලක්ක කරමින් ජාඇල, කඳාන, රාගම, වැලිසර, ඒකල, මහර, ගනේමුල්ල සහ බියගම ප්‍රදේශ සඳහා ජල සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පහසුකම් සලසනු ලැබේ. 2006 වර්ෂයේ නොවැම්බර් මාසයේදී මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර අවසන් කරන ලදි. ව්‍යාපෘතියේ දෙවන අදියරේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 6,487 කි. මෙම මුදලින් රු.මිලියන 4,869ක් ජාත්‍යන්තර සහයෝගී-තාව පිළිබඳ ජපන් බැංකුව වෙතින් ද, ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය වෙතින් ද සැපයේ. ව්‍යාපෘතිය ඉදිකිරීමේ උච්ච අවස්ථාවේදී ලංකා ආණ්ඩුවේ අරමුදල් සැපයීම තීරණාත්මක සාධකය විය.

භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 62% ක් හා 48% ක් වේ.

### 4. විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I පියවර II

මහනුවර මහ නගර සභා ප්‍රදේශය, අම්පිටිය, රජපිහිල්ල, කලුගම්මන, නුගවෙල, හීරැස්සගල, මීකණුව, මුල්ලේපිහිල්ල, ඇල්හේන, ගුහාගොඩ, කොණ්ඩදෙනිය සහ තෙලඹුගහවත්ත යන ප්‍රදේශ ඇතුළත් වන විසල් මහනුවර ප්‍රදේශයේ 30,000 ක ජන පිරිසකට අලුතින් ජල සම්බන්ධතා ලබාදීමට සහ

231,000 ක පාරිභෝගික ජනතාවගේ සේවා මට්ටම වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත. දෙවන අදියර සඳහා මුළු ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 4,164 කි. 2012 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත ය.

කොන්ත්‍රාත්තු 5 ක ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර එයින් 2 ක් අවසන්ව ඇත. මුදල් දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්තු 5 ක් ඉවත් කරන ලදි. භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් 42% ක් හා 84% ක් වේ.

**5. නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘති**

අම්පාර ප්‍රදේශයේ 110,000 ක ජන පිරිසකට පමණ සේවය සැලසීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. මහවැලි ගඟ, කොණ්ඩුවට්ටුවාන සහ රඹුක්කන ඔය ජලාශය ජල සම්පත් ලෙස යොදා ගැනේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 7,703 කි. ප්‍රමුඛතා පදනම වශයෙන් ව්‍යාපෘතියට ඇතුළත් උප ව්‍යාපෘති වන්නේ කොණ්ඩුවට්ටුවාන සිට කල්මුණේ දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ නළ මාර්ගය ඉදි කිරීම, පොතුවිල් ජලය බෙදාහැරීමේ පද්ධතිය දියුණු කිරීම, උහන, දමන, හිඟුරාන සඳහා ජල සම්පාදන ක්‍රම පිහිටුවීම ය. පස් හා භූමි පරීක්ෂාකර බැලීම් සහ භූ ලක්ෂණ මිනින්දෝරු කටයුතු අවසන් කර ඇති අතර එම වැඩ සඳහා ඉතිරි මුදල් ගෙවීම තවමත් කළ යුතුව ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම වැඩ සටහනට අනුකූලව සිදුවෙමින් පවතී. භෞතික ප්‍රගතිය 20 % ක් පමණ ය.

**6. වවුනියාවේ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් සඳහා පිහිටි ශුභසාධන මධ්‍යස්ථාන වෙනුවෙන් සුරක්ෂිත ජල සම්පාදනය හා ටැංකි මගින් ප්‍රවාහනය කරන මලාපවහන සඳහා පවිත්‍රාගාර ඉදි කිරීමට අවශ්‍ය උපකරණ සැපයීම. (2 කේ.ආර්.)**

ටැංකි මගින් ප්‍රවාහනය කරන මලාපවහන සඳහා පවිත්‍රාගාර පොම්පෙමඩු ප්‍රදේශයේ ඉදි කිරීම, අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන්ට පානීය ජල පහසුකම් ලබාදීම ශක්තිමත් කිරීම සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීම, භූගත ජල පරීක්ෂා කිරීම සඳහා උපකරණ හා මෙවලම් ප්‍රසම්පාදනය කිරීම සහ නැවත පදිංචි කිරීමේ පියවර සඳහා අදාළ කටයුතු කිරීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.

මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 302.8 කි.

මෙම වර්ෂයේ පළමු කාර්තුව තුළ මලාපවහන පවිත්‍රාගාරයේ ඉදි කිරීම අවසන් කරන ලද අතර දැන් එය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වේ. උපකරණ බොහොමයක් දැනටමත් වව්නියා-වට ලබාදී ඇති අතර දැනට පවත්නා සහ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් වෙනුවෙන් ජ.ස.ක්‍රි. පිළිබඳ කටයුතු මෙහෙයවීම සහ නඩත්තුව සඳහා එම උපකරණ සම්පූර්ණයෙන් උපයෝගී කර ගනිමින් තිබේ. මෙම ප්‍රදේශයේ ජල සම්පාදන කටයුතු වෙනුවෙන් මෙම උපකරණ ඉතාමත් ප්‍රයෝජනවත් වේ. ඉතිරි උපකරණ ප්‍රසම්පාදනය සඳහා 2011 වර්ෂය වෙනුවෙන් මුදල් වෙන්කර නොමැත.

භෞතික ප්‍රගතිය 70 % ක් පමණ වන අතර 2011 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**7. කොළඹ නගරයේ ආ.නො.ජ. සැපයුම අඩුකර ගැනීම සඳහා ධාරිතා සංවර්ධනය**

කොළඹ නගරයේ ආ.නො.ජ. සැපයුම අඩුකර ගැනීම සඳහා ධාරිතා සංවර්ධනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වී ඇත. බොරැල්ල සහ කොටහේන නියමු කලාප දෙක වශයෙන් තෝරාගෙන ඇති අතර කලාප දෙකේ ආ.නො.ජ. සැපයුම අඩු කිරීමට අවශ්‍ය උපකරණ ලැබී ඇත. නළ මාර්ග ප්‍රති සම්පාදනය කිරීම, කපාට හා මනු අලුත්වැඩියා කිරීම හා ප්‍රතිසම්පාදනය කිරීම, නීති විරෝධී ජල සම්බන්ධතා ඉවත් කිරීම ආදි කටයුතු ද තෝරාගත් කලාප දෙක තුළ ආ.නො.ජ. සැපයුම අඩු කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම ද සිදු කරනු ලැබේ. ප්‍රදේශයේ 267,000 ක ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලැබේ. ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 200 කි.

මණ්ඩලයේ ආ.නො.ජ. සැපයුම් ඒකකය සමගින් කොළඹ නගරයේ ජලය බෙදාහැරීමේ පද්ධතිය ජා.ස.ජ.බැ. ආයතනයේ උපදේශකවරුන් විසින් සමාලෝචනය කර බලමින් තිබේ. සමස්ථ ප්‍රගතිය 25% ක් පමණ වන අතර 2011 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත ය.

## ඩෙන්මාර්ක ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයේ ආධාර ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘති

**1. මහනුවර දකුණු නගර ජල සම්පාදන ව්‍යාපෘතිය**

දැනට පවතින යෝජනා ක්‍රමය ඒකාබද්ධ කොට ව්‍යාප්ත කිරීමෙන් මහනුවර දකුණ ප්‍රදේශයට සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. 2006 මැයි මාසයේ සිට 2010 දක්වා මෙම ව්‍යාපෘතියේ කාලසීමාව වේ. මහවැලි ගඟ, පාරදෙක ජල මූලාශ්‍රයෙන් ලබාගන්නා පිරිසිදු නොකළ ජලය සහ උලපනේ ඔය යන ජල මූලාශ්‍රවලින් ලබා ගන්නා ජලය සම්පූර්ණයෙන් පවිත්‍ර කිරීම ද ඇල්පිටිය මහවැලි ගං ඉවුරේ පිහිටි නුළුමං ළිං වලින් ලබාගන්නා ජලය විෂබීජ නැසීමෙන් පමණක් සැපයීම ද ව්‍යාපෘතියේ ප්‍රධාන නිමවුම වේ. ජල පවිත්‍රාගාරවලින් පිටවන අපද්‍රව්‍ය පවිත්‍ර කිරීමෙන් අනතුරුව ස්වාභාවික ජල මාර්ගවලට බැහැර කරනු ලැබේ. නැවත ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 9,626 කි.

ඩෙන්මාර්කයේ එම්. ටී. හොව්ගාස් ඒ/එස් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ය. ජල පවිත්‍රාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා විදේශ කොන්ත්‍රාත්කරුවෙකුගේ ද සැලසුම් කටයුතු සඳහා විශේෂඥ දේශීය උප කොන්ත්‍රාත්-කරුවෙකුගේ ද සහය ඇතිව ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් සියළුම ව්‍යාපෘති කටයුතු මෙහෙයවනු ලබයි. ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය මිනිස් බලය, ද්‍රව්‍ය හා උපකරණ උපයෝගී කරගනු ලබයි.

මෙම ව්‍යාපෘතිය මගින් දැනට පවතින ජල නිෂ්පාදන පද්ධති වැඩිදියුණු කිරීම ඇතුළුව දිනකට ඝන මීටර් 68,000 ක ජල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරෙන අතර පේරාදෙණිය, පිළිමතලාව, කඩුගන්නාව, මුරුතලාව, දන්තුරේ, ගම්පොළ, උලපනේ සහ වෙලම්බඩ යන ප්‍රදේශවල 2025 සැලසුම් වර්ෂය වන විට 350,000 ක ජන පිරිසකට සේවා සැපයීම මෙහි ඉලක්කය වී ඇත.

අධීක්ෂණ පාලන හා දත්ත ලබාගැනීමේ පද්ධතිය යොදා ගැනීමෙන් මූලික කාර්යයන් ස්වංක්‍රීය ක්‍රියාකිරීම සහ ජල සම්ප්‍රේෂණය සඳහා අධික ඝනත්වය ඇති පොලිඑතලීන් නළ භාවිතා කිරීම වැනි නව තාක්ෂණ ක්‍රම ව්‍යාපෘතියට ඇතුළත් ප්‍රධාන අංග ලක්ෂණය වේ. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු පාරිභෝගිකයන්ට කඩිනමින් ප්‍රතිලාභ ලැබිය හැකි ජලය බෙදාහැරීමේ නළ මාර්ග එලීමෙන් එයට සමාන්තරව ජල සේවා සම්බන්ධතා 19,000 ක් සැපයීම මගින් වැඩිදියුණු කළ පද්ධති කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කෙරේ. ඉහත සඳහන් ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ජලය අපතේ යෑම අඩුකර ගැනීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අංග ලක්ෂණය වේ. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම පාහේ නිමවී ඇති අතර 2010 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% ක් හා 88% ක් වේ.



මීවතුර ජල පවිත්‍රාගාරය

### 2. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමූහ ජල සම්පාදන ව්‍යාපෘතිය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ, ගිනිගත්හේන, වලපනේ, නිල්දණ්ඩාහින්න, මස්කෙළිය, රාගල සහ හැටන් දික්ඔය යන ප්‍රධාන නගර 06 ක වෙසෙන 96,000 ක ජන පිරිසකට 2025 වර්ෂයේදී සුරක්ෂිත පානීය ජලය සැපයීමට මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම් කරන ලදි. මුල්ඔය, ලෝනාච් ඔය, කුරුඳු ඔය, මහනෙළුව ඔය, හල්ග්‍රාන් ඔය සහ සාංචිමලේ ඔය ජල මූලාශ්‍ර වේ. අදාළ ජල පවිත්‍රාගාරවල ධාරිතාව පිළිවෙලින් දිනකට ඝ.මී. 4000, 3000, 3000, 2500, 1500 සහ 4000 ක් වේ.

මෙම ජල පවිත්‍රාගාර හයම සම්පූර්ණ ජල පිරිපහදු ක්‍රියාවලියෙන් යුක්ත වේ. හැටන් ජ.ස.ක්‍රි. වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් වන අතර අනෙක් ජ.ස.ක්‍රි. 5 ක් අලුත් ජල සම්පාදන ක්‍රම වේ. 2006 සිට 2010 දක්වා ව්‍යාපෘතියේ කාල සීමාව වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 4,462 කි. 2010 වර්ෂය අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 89% ක් වේ.

### 3. කැළණි දකුණු ඉවුරු ජල පවිත්‍රාගාරය

මෙය ගම්පහ දිස්ත්‍රික්කයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ජල සම්පාදන තත්වය වැඩි දියුණු කිරීමේ පරමාර්ථය ඇතිව ආරම්භ කරන ලද ඉහළ ප්‍රමුඛතාවක් දක්වන ව්‍යාපෘතියකි. ජා.ස.ජ.බ. අරමුදල් කොළඹින් උතුරු නගර ව්‍යාපෘතිය යටතේ ජලය බෙදා හැරීමේ පද්ධති ජාලය සඳහා ජලය සැපයීමට මෙමගින් අපේක්ෂිත ය. අඹතලේ, පට්ටිවල, කැළණි ගගේ දකුණු ඉවුරේ ඉදි කරනු ලබන දිනකට මිලියන ගැලුම් 40 ක් සැපයිය හැකි තුළුමං ළිඳකින් එම ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරයකින් ද මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 8,100 කි. 2010 වර්ෂය අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 71% සහ 27% ක් වේ. මෙම කොන්ත්‍රාත්තුවේ ම විචලනයක් ලෙස කැළණි ගග හරහා ලවණ බාධකය ඉදි කිරීම 2011 වසරේදී ආරම්භ කිරීමට නියමිත ය.



කැළණි ගං ඉවුරේ ලවණ බාධකය සඳහා යෝජිත ස්ථානය

## ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘති

### 1. ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූලික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ආ.ස.බැ. සිව්වන ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතිය මගින් 2025 වර්ෂය වන විට උතුර මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශ සහ නාගරික මධ්‍යස්ථාන හතරෙහි (මඩකලපුව, හම්බන්තොට, මුත්තූර් සහ පොළොන්නරුව) 969,000 ක ජන පිරිසකට සුරක්ෂිත ජලය ලබාදීමට ද, 171,500 ක ජන පිරිසකට සනීපාරක්ෂක පහසුකම් සලසා දීමට ද, ඒ හා සමාන ජනතාවකට සුරක්ෂිත ජලය ලබාදීමේ දී ජල ආංශීය ආයතනවල හැකියාව වර්ධනය කිරීමට ද අරමුණු කර ඇත.

මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 19,272 ක් වන අතර එම මුදලෙහි ආ.ස.බැ. අරමුදල් ප්‍රමාණය වශයෙන් රු. මිලියන 13,241 ක මුදලක් ඇතුළත් වේ. මූලික ණය මුදල සහ අතිරේක ණය මුදල් 2 ක් මගින් මෙම මුදල දරනු ලබයි. නියමිත ව්‍යාපෘතිය 2010 දෙසැම්බර් මාසයේදී අවසන් වීමට ඇති නමුදු නාගරික කොන්ත්‍රාත්තුවල ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් 2012 දක්වා එය දීර්ඝ කර ඇත. මුත්තූර්හි මූලික කාර්යයන්, සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගය සහ ජල පවිත්‍රාගාරය පිරිනැමීම සඳහා ආ.ස. බැංකුවේ එකගත්වය ලබාදෙන ලදි.



හම්බන්තොට ජල පවිත්‍රාගාරයේ අපද්‍රව්‍ය පරිහරණ ප්‍රදේශය

2010 වර්ෂය අවසාන වන විට සමස්ථ භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් 84% ක් සහ 100% ක් වේ.

නාගරික ජල සම්පාදන ප්‍රගතිය 2010 වර්ෂය අවසානයේදී කොන්ත්‍රාත් 16 න් 10 ක වැඩ අවසන් කරන ලදි.

නාගරික ජලය සැපයීම හා සනීපාරක්ෂාව, ග්‍රාමීය ජල සැපයුම සහ හැකියාව වර්ධනය කිරීම යන කොටස්වල ප්‍රගතිය පිළිවෙළින් 82%, 95% සහ 72% වේ.

**2. සුනාමි බලපෑ ප්‍රදේශය යළි ගොඩනැගීමේ ව්‍යාපෘතිය (ආ.ස.බැ / ටාර්ෆ්)**

මෙම ව්‍යාපෘතිය මගින් ජීවනෝපාය මාර්ගය, ප්‍රජා හා පොදු සේවා, මූලික සාමාජීය යටිතල පහසුකම් යථා තත්වයට පත් කරමින් කඩිනම් ව ජනතාවගේ ජීවන තත්වයන් නගා සිටුවීම මගින් සුනාමි බලපෑ ප්‍රදේශවල සැළකිය යුතු පුද්ගලයන් සංඛ්‍යාවකගේ සුභසිද්ධිය සලසාදීම අරමුණ වී ඇත. නව ජ.ස.ක්‍ර. ඉදි කිරීම සහ සුනාමි බලපෑ ප්‍රදේශ වල දැනට පවතින ජ.ස.ක්‍ර. වැඩි දියුණු කිරීම / පුනරුත්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. 2005 - 2010 දක්වා ව්‍යාපෘති කාලසීමාව වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ 83,000 ක ජන පිරිසකට ද, මඩකලපුව දිස්ත්‍රික්කයේ 73,325ක ජන පිරිසකට ද, ත්‍රිකුණාමල (මුත්තුර්) දිස්ත්‍රික්කයේ 5,393ක ජන පිරිසකට ද ප්‍රථිලාභ හිමි වේ.

මෙම දිස්ත්‍රික්ක තුනේ උප ව්‍යාපෘති කිහිපයක් ද තිබේ. ඇතැම් යෝජනා ක්‍රම සුළු පරිමාණයේ යෝජනා ක්‍රම වන අතර එම යෝජනා ක්‍රම සඳහා ප්‍රධාන ජල මූලාශ්‍ර වන්නේ නළ ළිං සහ කණින ලද ළිං ය. අනෙකුත් යෝජනා ක්‍රම දැනට පවතින යෝජනා ක්‍රම ව්‍යාප්ත කළ ඒවා ය. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 1,230ක් වන මුදල් ප්‍රදානය ආ.ස.බැ. මගින් ලබාදෙනු ලබන අතර, රුපියල් මිලියන 220 ක මුදල ශ්‍රී ලංකා රජය මගින් ලබාදෙයි. උප ව්‍යාපෘති 23 අතරින් ව්‍යාපෘති 11 ක් හම්බන්තොට ද, ව්‍යාපෘති 3 ක් මඩකලපුවේ සහ මුත්තූර්හි ව්‍යාපෘති 2 ක්ද, අවසන් කරන ලද අතර අනෙකුත් ව්‍යාපෘතිවල කටයුතු ද සිදුවෙමින් තිබුණි. එම ව්‍යාපෘතිවල සමස්ත භෞතික ප්‍රගතිය 2010 වර්ෂය අවසන් වන විට 80% කි. කළුවංචිකුඩි කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රමාදයන් ඇති විය. 2011 මාර්තු මාසය දක්වා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කරන ලදි.

**3. වියළි කලාපයේ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ආ.ස.බැ. 5 වන ව්‍යාපෘතිය)**

ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ සහ උතුරු පළාතේ ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයේ ජා.ජ. හා ජ.ම. නියැලී සිටී. ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ පුත්තලම, හලාවත, වව්නියාව සහ මන්නාරම යන නගර සඳහා වැඩි දියුණු කළ ජල සම්පාදන පහසුකම් හා ටැංකි මගින් ප්‍රවාහනය කෙරෙන මලාපවහන සඳහා පවිත්‍රතා පහසුකම් සලසනු ලැබේ. ඉහත සඳහන් නගර 4 හි වෙසෙන 206,000 ක ජන පිරිසකට ආරම්භයේදී මෙම ව්‍යාපෘතිය මගින් ජලය සපයනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 13,030 ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව මගින් ව්‍යාපෘතියේ පිරිවැයෙන් 75% ක් ද, නෙදර්ලන්තය මගින් රුපියල් මිලියන 230 ක ප්‍රදානයක් ද සපයා දෙනු ලැබේ. ව්‍යාපෘති කාලසීමාව වසර 5 කි. 2010 වර්ෂය අවසන් වන විට භෞතික ප්‍රගතිය 11% කි.

## ඔස්ට්‍රියානු ආධාර ඇතිව ආරම්භ කළ ව්‍යාපෘති

**1. හම්බන්තොට, අම්බලන්තොට, වැලිගම, කතරගම ජල සම්පාදන ව්‍යාපෘති සහ බදුල්ල-බණ්ඩාරවෙල ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයන කටයුතු ක්‍රියාත්මක කිරීම. (යූ.එන්.අයි.එච්.ජ්.)**

මෙම ව්‍යාපෘතිය ජල සම්පාදනය වැඩිදියුණු කිරීම පිණිස 2004 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ නව ජල සම්බන්ධතා 28,000 ක් සැපයීමත්, හම්බන්තොට, අම්බලන්-තොට, වැලිගම සහ කතරගම ප්‍රදේශවල ජ.ස.ක්‍ර. මගින් දැනට සේවය ලබන 150,000 ක ජනගහණයක් සඳහා සේවා මට්ටම වැඩි දියුණු කිරීමත් ය. වලවේ ගඟ (අම්බලන්තොට සහ හම්බන්තොට ප්‍රදේශ දෙක සඳහා) පොල්අතුමෝදර සහ මැණික් ගඟ මෙම ව්‍යාපෘතිය සඳහා ජල මූලාශ්‍ර වේ. වැලිගම සහ කතරගම ප්‍රදේශ සඳහා දිනකට ඝ.මී. 5,000ක ධාරිතාවක් සහ අම්බලන්තොට සඳහා දිනකට ඝ.මී. 7,500ක ධාරිතාවක් ඇති නව ජල පවිත්‍රාගාර ඉදි කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන වැඩ කටයුතුවලට අයත් ය.



වැලිගම ජල පවිත්‍රාගාරයේ ජල තටාකය

ඔස්ට්‍රියානු රජයෙන් ලබා ගන්නා අරමුදල්වලින් මුල් ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම වශයෙන් කතරගම සිට සෙල්ල කතරගම දක්වා ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගය සපයා එළීම හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන මුදල් යටතේ සෙල්ල කතරගම දැනට පවත්නා ජලය බෙදාහැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම ද හඳුනාගෙන ඇත. ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇති අමතර වැඩ කටයුතු 2011 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට අවසන් කරනු ලැබේ. ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 2,126 කි. කතරගම ප්‍රදේශය සඳහා හඳුනාගෙන ඇති අමතර වැඩ සැලසුම් කිරීමේ අවස්ථාවේ ඇත. බදුල්ල, බණ්ඩාරවෙල ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයන කටයුතු ඇතුළුව ව්‍යාපෘතිය සඳහා වන භෞතික හා මූල්‍ය ප්‍රගතිය දීර්ඝ කරන ලද වැඩසටහන අනුව පවතී.

### 2. කිරිඳි ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය ලුණුගම්වෙහෙර, පන්නෙගමුව, වීරවිල, බෙරලිහෙල, මත්තල සහ දෙබරවැව යන නගරවල වෙසෙන 50,000 ක ජන පිරිසක් ඉලක්ක කරගෙන ඇති පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය ලුණුගම්වෙහෙර වාරිමාර්ග වැව වන අතර දිනකට ඝ.මී. 6,500 ක ධාරිතාවකින් යුත් ජල පවිත්‍රාගාරයක සම්පූර්ණ ජල පිරිපහදුවක් සිදු කරනු ලබයි. සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව පිළිවෙලින් ඔස්ට්‍රියානු රජය සහ ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන යුරෝ මිලියන 10 ක් සහ රු.මිලියන 401 ක් වේ. මුලින්ම කිරිඳි ඔය ජ.ස.ක්‍ර. ඉදිකළේ 1989 වර්ෂයේ කිරිඳි ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ ජනාවාසවල පදිංචිකරුවන් වෙනුවෙනි. දැනට දිනකට නිෂ්පාදනය කරන ඝ.මී. 5,900 ක ජල ධාරිතාව දැනට පවතින ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. මෙම ව්‍යාපෘතිය මගින් දැනට පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමය, පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව ඉටු කරනු ලැබේ. එම්.යූ.ටී. පී.එම්.බී.එච්. ඔස්ට්‍රියා කොන්ත්‍රාත්කරු වේ. 2010 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ජල පවිත්‍රාගාරය ක්‍රියාත්මක කරන ලදි. භෞතික ප්‍රගතිය 99% කි.




කිරිඳි ඔය ජ.ස. ක්‍රමයේ භූගත ජල තටාකය ඉදි කිරීම

## ජර්මන් රජයේ ආධාර (කේ.එෆ්.ඩබ්.) යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

### 1. සුනාමිය බලපෑ ප්‍රදේශවල (ගාලු දිස්ත්‍රික්කයේ) ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ජල පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීම සහ 2006 ජූනි මාසයේ සිට 2010 මාර්තු මාසය දක්වා කාල සීමාව  තුළ අම්බලන්ගොඩ ජල සම්පාදන සේවාව (පියවර 1 සහ II ඇතුළත් වේ) ව්‍යාප්ත කිරීම සඳහා වන ව්‍යාපෘතියකි. බලපිටිය දකුණ, අම්බලන්ගොඩ, හික්කඩුව සහ රත්ගම ප්‍රාදේශීය සභා ප්‍රදේශ හා අම්බලන්ගොඩ නගර සභා ප්‍රදේශය තුළ වෙසෙන 194,000 ක පමණ ජන පිරිසකට සේවා ලබා දීමට නියමිත ය. බද්දේගම, කිරිබතාවිල ප්‍රදේශයේදී, ගිං ගඟ ජල මූලාශ්‍රය ලෙස යොදාගෙන දිනකට ඝ.මී. 36,000 ක ප්‍රමාණයක් සාම්ප්‍රදායික ලෙස ජල පවිත්‍ර කිරීමේ ක්‍රියාවලිය තුළින් නිෂ්පාදිත ධාරිතාව වැඩි දියුණු කරනු ලැබේ. වාතනය, අවලම්බනය, අවසාදනය, අවසාදිත තල සහිත ඍජුකෝණා-ස්‍රාකාර අවසාදන ටැංකි සහ ලැසි වැලි පෙරණ මෙම පද්ධතියට ඇතුළත් වේ. දැනට ජල පවිත්‍රාගාරයේ අපද්‍රව්‍යය කුඹුරකට මුදාහරිනු ලැබේ. කෙසේ වුවද, වැඩි දියුණු කිරීමෙන් පසුව පෙරහන්වලින් සෝදා පිටවන ජලය නැවත භාවිතා කරන අතර එයින් ඇතිවන රොන්මඩ වියළන තට්ටුවලට යැවීමට සලස්වනු ලැබේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 4202 වන අතර එයට රු.මිලියන 3393 ක කේ.එෆ්.ඩබ්. ආයතනය මගින් දෙනු ලබන ප්‍රදානය හා ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන රු.මිලියන 809 ක් ඇතුළත් වේ.

පියවර දෙකකින් සමන්විත ගාලු දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් හා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග ගැනීම පිණිස ජර්මන් රජය විසින් කේ.එෆ්.ඩබ්. ආයතනය මගින් ශ්‍රී ලංකා රජය වෙත යුරෝ මිලියන 22 ක ප්‍රදාන මුදලක් ලබාදෙනු ලැබීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය සාර්ථක විය.

1 වන පියවර කඩිනම් ක්‍රියාමාර්ග සහ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම (2005 ජනවාරි මාසයේදී යුරෝ මිලියන 7 ක් ලබාදීමට එකඟ වන ලදි.)

11 වන පියවර ජල සම්ප්‍රේෂණය, ජලය ගබඩා කිරීම හා ජලය බෙදාහැරීමේ පද්ධති සහ බද්දේගම ජල පවිත්‍රාගාර යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ ව්‍යාප්ත කිරීම මගින් මධ්‍යකාලීන ක්‍රියාමාර්ග ගැනීම (යුරෝ මිලියන 15 ක මුදලක් ලබාදීමට 2005 ජූලි මාසයේදී එකඟ විය)



බද්දේගම ජල පවිත්‍රාගාරය

ව්‍යාපෘති ප්‍රදේශය නිරිත දිග වෙරළ තීරය ඔස්සේ කොස්ගොඩ සිට රත්ගම දක්වා පැතිරී යයි. 2025 වර්ෂයේදී ඇතිවිය හැකි ජල ඉල්ලුම සපුරාලීමට බද්දේගම ජල පවිත්‍රාගාරය උසස් තත්වයකට පත් කිරීම සඳහා කරන සියලුම කටයුතු පවතින මුදල් ප්‍රමාණය මත ඉටුකළ නොහැකි ය. ව්‍යාපෘතිය සඳහා අදාළ ප්‍රමුඛතාවයන් පහත දැක්වෙන පරිදි වේ.

- සුනාමිය බලපෑ වෙරළබඩ කලාපය සහ නොගැඹුරු ළිං වලට ලවණතාවය ඇතුළු වන ප්‍රදේශය
- නැවත පදිංචි කිරීමේ කලාප
- අනාගත වර්ධනය සඳහා අපේක්ෂිත ප්‍රදේශ

2010 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් විය.

**2. අම්පාර, නාවලපිටිය හා කොග්ගල ජල සම්පාදන ක්‍රම වැඩිදියුණු කිරීම**

අම්පාර - මෙම ව්‍යාපෘතිය යටතේ අම්පාර නගර සහා ප්‍රදේශයේ වෙසෙන 35,000 ක ජන පිරිසකට පානීය ජල පහසුකම් ලබාදීම සඳහා දැනට අම්පාරේ පවතින ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කරන ලදි. ඇස්තමේන්තු ගතකළ පිරිවැය රු.මිලියන 982 කි. කොණ්ඩුවටුවාන වැව ජල මූලාශ්‍රය වන අතර දිනකට ඝ.මී. 6,500 ක ධාරිතාවෙන් යුතු නව ජල පවිත්‍රාගාරයක් ඉදි කෙරේ. ජල පවිත්‍රකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් සිදුකෙරේ. ජල කාන්දු අනාවරණය කර ගැනීමේ වැඩ කටයුතු, කපාට කුටි ඉදි කිරීම සහ ගැමුණුපුර හා සද්ධාතිස්සපුර ජල ස්ථම්භ පුනරුත්තාපනය කිරීම මෙම වර්ෂය තුළ සිදු කරන ලදි. ජල පවිත්‍රාගාරය ක්‍රියාත්මක කිරීම සහ ජල කාන්දු අනාවරණය කර ගැනීමේ වැඩ කටයුතු නිම කිරීමට ඇත. ජල පවිත්‍රාගාරය ක්‍රියාත්මක කිරීමේදී ජල පෙරහන්වල ඇති වූ තාක්ෂණික ගැටලු සම්බන්ධව කටයුතු කරමින් පවතී.

නාවලපිටිය - නාවලපිටිය නාගරික ප්‍රදේශයේ වෙසෙන 22,000 ක පමණ ජන පිරිසකට මෙම නව ව්‍යාපෘතිය මගින් සේවා සැලසීමට නියමිත ය. ජල මූලාශ්‍රය හන්ග්‍රන් ඔය (මහවැලි ගගේ අතු ගංගාවකි) වන අතර ජල පවිත්‍රාගාරයේ ධාරිතාව දිනකට ඝ.මී. 4,500 කි. ජල පවිත්‍රීකරණ ක්‍රියාවලිය සඳහා උඩු අතට ගලායන ජල පෙරහන, මන්දගාමී වැලි පෙරහන, විෂබීජ නැසීම සඳහා ක්ලෝරීන් යෙදීම ඇතුළත් වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1,151 කි. ඉල්ලුම් කරන ලද ජලය බෙදාහැරීමේ පද්ධතිය ව්‍යාප්ත කිරීම සඳහා නළ මාර්ග එළීම, ඉතිරි ජල පෙරහන මාධ්‍ය සැපයීම හා භූමිය අලංකාර කිරීම වර්ෂය තුළ සිදු කරන ලදි. 5 වැනි ජල පෙරහනේ සවි කිරීම සහ ඇතැම් භූමිය අලංකාර කිරීම කටයුතු හැර ඉදි කිරීම් වැඩ කටයුතු නිම කරන ලදි. 2007 දෙසැම්බර් මාසයේදී ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදි. ගංගාවලින් වැලි සහ බොරළු ගොඩදැමීම පිළිබඳව විවිධ පාරිසරික රෙගුලාසි සහ ඒවා ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් ඇති දැඩි රෙගුලාසි නිසා පෙරහන මාධ්‍ය සැපයීමේදී ප්‍රමාදයන් සිදු විය.

කොග්ගල - කොග්ගල අපනයන සැකසුම් කලාපයේ සේවකයන් සහ හබරාදුව ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ අනෙකුත් ජන කොටස් 17,000 ක පිරිසක් ඇතුළුව ප්‍රතිලාභීන් 37,000 කට ජ.ස.ක්‍ර. වැඩි දියුණු කිරීම සිදු කෙරේ. විසල් ගාලු ප්‍රදේශයේ ජල පවිත්‍රාගාරය සඳහා ගිං ගඟ ජල මූලාශ්‍රය ලෙස යොදාගන්නා අතර දිනකට ඝ.මී. 7,300 ක ජල ඉල්ලුම පවතී. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 531 කි. 2008 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර එය 2009 වර්ෂය තුළ කොන්ත්‍රාත් බැඳීම් කාලය වී තිබුණි. 2010 වර්ෂය අවසානය වන විට මෙම ව්‍යාපෘතිය අවසන් කරන ලදි. දේශීය අරමුදල් වැඩි කිරීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

# නෙදර්ලන්ත ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතිය

**මීගමුව ජල සම්පාදනය හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය වසර 3 ක පුනරුත්තාපනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍ර ලෙස මහ ඔය සහ කැළණි ගඟ උපයෝගී කරගනු ලබන අතර සම්පූර්ණයෙන් ජල පවිත්‍රීකරණය කිරීම සිදුකරනු ලබයි. මුළු පිරිවැය ඇස්තමේන්තුව වන රු.මිලියන 7,288 ක මුදල නෙදර්ලන්තයෙන් ලැබේ. 54% ක් වන විදේශීය මුදල් ප්‍රමාණය ආධාර මුදලක් වන අතර ඉතිරි මුදල වන 46% ක ප්‍රමාණය ණය මුදලකි. මීගමුව මහ නගර සභා ප්‍රදේශයේ දැනට නළ ජල සැපයුම 59% ක් වන අතර ප්‍රමාණවත් ජලය සහ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් නොමැති බැවින් දිනපතා පෙ.ව. 8.00 සිට ප.ව. 3.00 දක්වා බොහෝ තැන්වලට ජල සැපයුම සීමාකර ඇත.

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ජල සැපයුම් සේවාව සපයන ප්‍රදේශය තුළ වෙසෙන 100% ක ජනගහණයට පැය 24 පුරා සේවාව සපයමින් සුරක්ෂිත ජල සැපයුම් සේවා මට්ටම වර්ධනය කිරීම යි. මීගමුව මහ නගර සභා ප්‍රදේශයට අමතරව කොච්චිකඩය සහ දූව පිටපත ප්‍රදේශ ද මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. 2011වර්ෂය වන විට 198,000 ක ජනගහණයකට ද, 2025 වර්ෂය වන විට 215,000 ක ජනගහණයකට ද මෙම ව්‍යාපෘතිය මගින් ඵල ප්‍රයෝජන සැලසේ. දිනකට ඝ.මී. 12,500 ක ධාරිතාවයක් සහිත බම්බුකුලියේ නව ජල පවිත්‍රාගාරය ඉදි කිරීම, කැළණි ගඟේ දකුණු ඉවුරේ ඉදි කිරීමට යෝජිත ජල පවිත්‍රාගාරයෙන් දිනකට ඝ.මී. 21,000 ක පවිත්‍රීකරණ ජල ප්‍රමාණයක් සම්ප්‍රේෂණය කිරීම සඳහා ජාඇල සිට මීගමුව දක්වා මි. මී. 600 ක විෂ්කම්භය ඇතිව කි.මී. 14 ක් දුරට ප්‍රධාන සම්ප්‍රේෂණ ජල නළයක් එළීම, දැනට පවතින ජල පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගය (කි.මී. 6 දිග මි. මී. 350 ක විශ්කම්භය සහිත සී.අයි.) උසස් තත්වයකට පත් කිරීම, විදුලි යාන්ත්‍රික උපකරණ උසස් තත්වයකට පත් කිරීම, කි.මී. 200 ක් දිග නව ජල බෙදාහැරීමේ පද්ධතියක් ඉදි කිරීම සහ නවීන ජල වත්කම් කළමනාකරණ පද්ධතියක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ කටයුතුවලට ඇතුළත් වේ. 2010 වර්ෂය අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 66% ක් සහ 62% ක් වේ.

# රතුකුරුස ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

**සුනාමිය බලපෑ ප්‍රදේශවල ජල සම්පාදනය පුනරුත්තාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

සුනාමි ඇතිවීමෙන් පසුව ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශය වැඩි දියුණු කිරීම සඳහා ආධාර පියවර කිහිපයකින් ලබාදීමට ශ්‍රී ලංකා රතු කුරුස සංගමය, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයත්, රතු අඩසඳ සමාජයත් සමග එක්ව එකගත්වය පළ කරන ලදි. දකුණු සහ නැගෙනහිර පළාත්වල ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි. ජලය බෙදාහරින ප්‍රදේශ ව්‍යාප්ත කිරීම, ජල පවිත්‍රාගාර වැඩි දියුණු කිරීම, මළ බැඳුනු ජල නල මාර්ග ප්‍රතිසම්පාදනය කිරීම, සුනාමියෙන් විපතට පත්ව සිටින ජනතාව අලුතින් පදිංචි කිරීමේ ජනාවාස වැඩබිම් සඳහා ජලය සැපයීම ආදිය මෙම ව්‍යාපෘතිවලට ඇතුලත් වේ. ව්‍යාපෘතිය 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ඉදිරි වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. රතු කුරුස සංවිධානය ආධාර කළ ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 3,750 ක් පමණ වේ. භෞතික ප්‍රගතිය 75% කි.

**මාතර දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය වැඩි දියුණු කිරීමේ කටයුතු**

ජා.ර.කු.ස. පහත සඳහන් ව්‍යාපෘතිවලට ආධාර කර 2009 වර්ෂය තුළ සම්පූර්ණව නිම කරන ලද අතර ජ. ජ. හා ජ. මණ්ඩලයට භාරදෙන ලදි.

- මාතර සමූහ ජ.ස. ක්‍රමයේ ජලය බෙදාහැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම සහ සුනාමි නිවාස යෝජනා ක්‍රම සඳහා නල මාර්ග ව්‍යාප්ත කිරීමේ කටයුතු
- කුඩාවැල්ල ජ.ස.ක්‍ර. වැඩි දියුණු කිරීම.
- දික්වැල්ල ජලාශයේ සිට නාදුගල ජලස්ථම්භය දක්වා ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය එළීම.
- කඹුරුගමුවේ සමුද්‍රතෙර ප්‍රදේශයේ ජල ස්ථම්භය ඉදි කිරීම.
- මාතර ජ.ස.ක්‍ර. ස්වයංක්‍රිය කිරීම.

ඉහත ව්‍යාපෘති සඳහා මුළු පිරිවැය රුපියල් 170 කි. රුපියල් 300 ක මුළු වියදමින් වැලිගම ජ.ස. ක්‍රමයේ වැඩිදියුණු කිරීම සඳහා ජා.ර.කු.ස. ද ආධාර ලබාදෙන ලදි. වර්ෂය අවසානය වන විට 90% ක් පමණ ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලද අතර 2010 වර්ෂයේ සියළු වැඩ කටයුතු අවසන් විය.

**ගාලු දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය වැඩිදියුණු කිරීමේ කටයුතු**

ගාලු දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර ප්‍රදේශවල පදිංචි කළ සුනාමියෙන් විපතට පත්වූ අයගේ ශුභ සිද්ධිය සඳහා කුඩා පරිමාණයේ ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති 8 ක් ඉදිකර ක්‍රියාත්මක කරන ලද අතර මෙහෙයවීම හා නඩත්තුව සඳහා එම ව්‍යාපෘති අදාළ ප්‍ර.මූ.ස. වෙත භාරදෙන ලදි. ඉහත ව්‍යාපෘතිය සඳහා පිරිවැය රුපියල් 90 ක් වූ අතර එම මුදල ජා.ර.කු.ස. විසින් සපයන ලදි. ප්‍රා.ස.සේ.ම. විසින් සම්බන්ධීකරණ කටයුතු කිරීමෙන් ද, ප්‍ර.මූ.ස. සඳහා පුහුණුව ලබාදීමෙන් ද ක්‍රියාවලියට පහසුකම් සලසන ලදි.

ජා.ර.කු.ස. ආධාර ඇතිව වක්වැල්ල ජල පවිත්‍රාගාරයේ සිට බික්ක ජලාශය දක්වා නව ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ඉදි කිරීම සඳහා නව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය රුපියල් 300 කි.

# ප්‍රංශ ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතිය

**ත්‍රිකුණාමලය විසල් ප්‍රදේශයේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය**



කන්තලේ අල්ලායි නව තුළුමං ළිඳ ඉදි කිරීම.

කන්තලේ ජල පවිත්‍රාගාරයේ දිනකට ගැලුම් මිලියන 12 දක්වා නිෂ්පාදන ධාරිතාවය වැඩිකර එමගින් ත්‍රිකුණාමලයේ මුළු ඒකාබද්ධ ජ.ස. ක්‍රමයේ සේවා මට්ටම වැඩි කිරීම මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වී ඇත. දැනට ත්‍රිකුණාමල ප්‍රදේශයේ පවතින ජ.ස.ක්‍ර. පුනරුත්තාපනය කර වැඩි දියුණු කිරීමටත් පුල්මුඩේ සහ එච්චිලම්පත්තු ප්‍රදේශවල නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදි කිරීමත් මෙම ව්‍යාපෘති විෂය පථය වී ඇත. ත්‍රිකුණාමලය නගරය සහ කඩවත ප්‍රදේශවල, කන්තලේ, තම්පලගාමම්, කින්නියා, කුච්චවේලි හා එච්චිලම්පත්තු ප්‍රා.ලේ. කොට්ඨාශවල වෙසෙන 330,000 ක් පමණ වන ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සේවා සැලසෙනු ඇත. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් 4,200 ක් වන අතර එම මුදලින් යුරෝ මිලියන 10 ක් ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය (ඒ. එෆ්. ඩී.) මගින් ද, යුරෝ මිලියන 10 ක් ප්‍රංශ මුදල් අමාත්‍යාංශය මගින් ද, ශ්‍රී ලංකා රජය වෙතින් රුපියල් 1,003 ක් ද සපයනු ලබයි. ජල මූලාශ්‍රය මහවැලි ගඟ වන අතර සාම්ප්‍රදායික ජල පිරිපහදු කිරීම භාවිත කෙරේ.

ව්‍යාපෘතියේ වැඩ කොටස් සැකෙවින් පහත දැක්වේ.

- කන්තලේ ඇල්ලේ පාලමේ නව තුළුමං ළිඳ සහ ජල පොම්පාගාරයක් ඉදි කිරීම.
- පිරිසිදු නොකළ ජලය ගෙනයෑම සඳහා නව ප්‍රධාන නල මාර්ගයක් එළීම.
- නව ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් එළීම.
- ජලය බෙදාහැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම.
- කන්තලේ ජල පවිත්‍රාගාරය සහ සේවා ජලාශ පුනරුත්තාපනය කිරීම සහ වැඩි දියුණු කිරීම.
- ස්වයංක්‍රියව ක්‍රියාත්මක හා මෙහෙයුම් පද්ධතියක් හඳුන්වාදීම.
- පුල්මුඩේ සහ එච්චිලම්පත්තු ප්‍රදේශවල නව ජ.ස.ක්‍ර. ඉදි කිරීම.

2006 වර්ෂයේදී උපදේශක ආයතනයක් පත් කරන ලදි. තුළුමං ලිං පොම්පාගාරය සහ ජලාශ ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තු භාර දී ඇත. අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී. 2011 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

## එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදලේ ආධාර ඇතිව ආරම්භ කළ ව්‍යාපෘති

**සුනාමිය බලපෑ ප්‍රදේශවල ජල සම්පාදනය පුනරුත්තාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

සුනාමිය ඇතිවීමෙන් පසුව පහත සඳහන් ප්‍රධාන කටයුතු සඳහා ආධාර ලබාදීමට එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල එකඟ විය.

(අ) තංගල්ල ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම.

ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ දැනට පවතින තංගල්ල සහ බෙලිඅත්ත ජ.ස.ක්‍ර. ඒකාබද්ධ කර දිනකට ජල ධාරිතාව ඝ.මී. 6,500 සිට 15,000 දක්වා වැඩි දියුණු කරන ලදි. වැඩි දියුණු කිරීම සඳහා පිරිවැය රු.මිලියන 1,000 ක් වූ අතර එ.ජා.ජා.ළ.අ. මගින් ප්‍රදානයක් ලෙස රු.මිලියන 800 ක් ලබා දෙන ලදි. මෙම යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ විට 52,000 ක ජන පිරිසකට ජල සම්පාදනය සපයනු ලැබේ. තංගල්ල ජ.ස.ක්‍ර. වැඩි දියුණු කිරීම අවසන් කරන ලද අතර 2008 වර්ෂයේ අගෝස්තු මාසයේදී එය ක්‍රියාත්මක කරන ලදි.

(ආ) තිරුක්කෝවිල් සඳහා නව ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය මගින් ප්‍රදේශයේ දීර්ඝ කාලීනව පැවති අවශ්‍යතාවක් ඉටු කරමින් 30,000 ක ජන පිරිසකට ජලය සපයාදෙනු ඇත.  යෝජනා ක්‍රමය සඳහා පිරිවැය රු.මිලියන 1,100 ක් වන අතර එ.ජා.ජ.ළ.අ. ආධාර මුදලක් වශයෙන් රු. මිලියන 900 ක් ලබාදීමට එකගවී ඇති අතර ශ්‍රී ලංකා රජය මගින් ඉතිරි මුදල් ලබාදෙනු ලබයි. මෙම ජ.ස.ක්‍ර. 2009 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී කොටසක් ක්‍රියාත්මක කල අතර 2010 වර්ෂයේදී අවසන් කරන ලදි.

(ඇ) පුත්තලම ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම.

ප්‍රදේශයේ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් වෙත ජලය සපයාදීම සඳහා දැනට පවතින පුත්තලම ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කරන ලදී. වැඩි දියුණු කිරීම සඳහා පිරිවැය රු.මිලියන 180 කි. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල මෙම ව්‍යාපෘතිය මගින් අවතැන්වූ පුද්ගලයන් 2,000 කට ජලය සපයාදීමට අපේක්ෂා කර ඇති අතර වැඩි දියුණු කිරීමේ කටයුතු 2009 වර්ෂයේ අගෝස්තු මාසයේදී අවසන් කරන ලදි.

## ස්පාඤ්ඤ ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතිය

**අඹතලේ සහ මීගමුව ජල පවිත්‍රාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

සුනාමිය නිසා විනාශවූ මහජන උපයෝගිතා ප්‍රතිසංස්කරණය කර පුනරුත්තාපනය කිරීමට මුදල් ලබාදීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත අනුග්‍රහ ණය මුදලක් ස්පාඤ්ඤ රජය විසින් ලබාදෙන ලදි. මොරටුව. පානදුර සහ මීගමුව යන ප්‍රදේශවල සුනාමිය බලපෑ ජනතාවට ජල සම්පාදන පහසුකම් ඉදි කිරීම සඳහා මෙම මුදල යොදා ගනිමින් තිබේ. මොරටුව සහ පානදුර ප්‍රදේශයට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා දිනකට ඝ.මී. 50,000 ක ධාරිතාව ඇති සම්පූර්ණ ජල පිරියම් පවිත්‍රාගාරයක් අඹතලේ ඉදි කිරීම, මීගමුව ප්‍රදේශය සඳහා දිනකට ඝ.මී. 3,000 ක ධාරිතාව ඇති ලවණ ඉවත් කිරීමේ පවිත්‍රාගාරයක් ඉදි කිරීම ස්පාඤ්ඤ සමාගමක් වෙත භාරදී ඇත. 2008 වර්ෂයේ ජූනි මාසයේ සිට ව්‍යාපෘතියේ වැඩ සිදුවෙමින් පවතී.

ස්පාඤ්ඤයෙන් ආනයනය කළ ජල යන්ත්‍ර සහ උපකරණ 80% ක ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතියට ඇතුළත් වන අතර ජල පවිත්‍රාගාරය එකලස් කිරීම වැඩ බිමේදී සිදු වේ. භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% ක් හා 100% ක් වේ.



මීගමුවේ ලවණ ඉවත් කිරීමේ පවිත්‍රාගාරය

## විදේශ අරමුදල් සැපයූ මලාපවහන ව්‍යාපෘති

### ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

**මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය**

කොලොන්නාව, දෙහිවල සහ ගල්කිස්ස යන ප්‍රදේශවල අපජලය පොම්ප කරන ස්ථාන පුනරුත්තාපනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. කොලොන්නාව, දෙහිවල සහ ගල්කිස්ස යන ප්‍රදේශවල වෙසෙන 838,000 ක ජන පිරිසකට

එමගින් සේවා සැලසේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. බිලියන 13.3 කි. ව්‍යාපෘති කාල සීමාව 2010 සිට 2014 දක්වා වේ. භෞතික වැඩ 2010 වර්ෂයේදී ආරම්භ කරනු ලැබේ. සිතියම් සැකසීමේ අංශය සමග එක්ව දැනට පවතින මලාපවහන සම්බන්ධතා ව්‍යාප්ත කිරීම දැක්වෙන සිතියම් සැකසීමට සැලසුම් කර ඇත.

## ස්වීඩන් ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

**රත්මලාන / මොරටුව සහ ජාඇල / ඒකල ප්‍රදේශ සඳහා අපජලය බැහැර කිරීමේ පද්ධති**

මුදල් ප්‍රදානය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියට අයත් කටයුතු පහත සඳහන් පරිදි වේ.

- රත්මලාන/ මොරටුව සහ ජාඇල / ඒකල ප්‍රදේශ (වැඩ කොන්ත්‍රාත්තුව) සඳහා ස්වීඩන් ජාත්‍යන්තර නියෝජිත ආයතනයෙන් ප්‍රදානය කළ ඇ.ඩො. මිලියන 91 ක මුදලින් ප්‍රදානය යටතේ අපජලය බැහැර කිරීමේ පද්ධති ඉදි කිරීම.
- ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයේ ස්වීඩන ක්‍රෝනා මිලියන 28 ක අධීක්ෂණ කොන්ත්‍රාත්තුව.
- නිවාසවලට සේවා සම්බන්ධතාවය ලබාදීම සහ අපජලය පද්ධති ජාලයෙන් බැහැර සනිපාරක්ෂක විසඳුම් ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 2 කි. ලෝක බැංකුව මගින් අරමුදල් ලබා දේ.
- ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයේ ආධාර යටතේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො.මි. 0.2 ක් වන පාරිභෝගික සනිපාරක්ෂක නියමු ව්‍යාපෘතිය

.2008 පෙබරවාරි මාසයේදී කොන්ත්‍රාත් වැඩ ආරම්භ කරන ලද අතර මෙහෙයුමේ හා නඩත්තු කාල සීමාව වන මාස 18 ඇතුළුව ව්‍යාපෘතිය අවසන් වන්නේ 2013 ජනවාරි මාසයේ දිය. වැඩ කොන්ත්‍රාත්තුව සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් වන අතර අපවහන පද්ධති ජාලය එළීම, ප්‍රධාන නළ මාර්ග, පොම්ප කිරීමේ ස්ථාන හා ප්‍රදේශ දෙක සඳහා අපජල පවිත්‍රාගාර ඉදි කිරීම මෙම කොන්ත්‍රාත්තුවට ඇතුළත් ය. රත්මලාන මොරටුව ප්‍රදේශයේ ලුනාව කලපුව අසලින් මුහුදටත් ජා ඇල / ඒකල ප්‍රදේශයේ දඬුගම් ඔයටත් පිරියම් කළ අපජලය මුදාහරිනු ලැබේ.



ලුනාව කලපුව අසලම අපජලය බැහැරලන මුහුදු පිටදොර නිර්මාණ කටයුතු

## ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ජපන් බැංකු ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

**මහනුවර නගරයේ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය**

මහනුවර නගරයේ අපජලය බැහැර කිරීම අවිචාරවත් ලෙස සිදු කෙරෙන බැවින් නුවර වැව, මැද ඇළ සහ අවසාන වශයෙන් මහවැලි ගඟ ද, මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල ප්‍රධාන පානීය ජල මූලාශ්‍ර ද දූෂණය වේ. මෙයට ස්ථිර විසඳුමක් සොයාගැනීම පිණිස මහනුවර නගරය සඳහා අපජලය බැහැර කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ජා.ජ. හා ජ.ම. යෝජනා කර ඇත. මහනුවර නගරයේ හෙක්ටයාර් 732 ක ප්‍රදේශයේ අපජලය එකතුකර කි.මී. 94 ක් දිග නළ මාර්ග පද්ධතියක් මගින් එකතුකර දිනකට ඝ.මී. 14,000 ක ධාරිතාව ඇති අපජල පවිත්‍රාගාරයට යොමුකිරීම යෝජිත ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේදී, මෙම නව ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර 2017 වර්ෂයේදී අවසන් කරනු ලැබේ. මහනුවර වෙසෙන 55,000 ක පමණ පදිංචිව සිටින ජන පිරිසකටත් මහනුවර ප්‍රදේශයේ 150,000 ක සංක්‍රමික ජන පිරිසකටත් මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ.

පවිත්‍ර කිරීමෙන් පසු බැහැර කරන අපද්‍රව්‍ය පිළිබඳ විස්තර පහත දැක්වේ.

B.O.D. (දින 5 ක් තුළ සෙල්සියස් අංශක 20) ලීටරයට මි.ග්‍රෑ. 20 වඩා අඩුවිය යුතුය. මුළු අවලම්බිත අපද්‍රව්‍ය ලීටරයට මි.ග්‍රෑ. 20 ප්‍රමාණයකට වඩා අඩුවිය යුතුය. C.O.D. ලීටරයට මි.ග්‍රෑ. 250 ප්‍රමාණයකට වඩා අඩුවිය යුතුය. මුළු කෙල්ඩාල් (kjeldhal) නයිට්‍රජන් ප්‍රමාණය ලීටරයට මි.ග්‍රෑ. 50 ප්‍රමාණයට අඩුවිය යුතු අතර ෆිකල් කොලිෆෝම් (Fecal coliform) ප්‍රමාණය (මිලිග්‍රෑම් 100 ට M.P.N. ) 40 ට වඩා අඩුවිය යුතුය.

අපජල පවිත්‍ර කිරීමේ ක්‍රියාවලිය ඔක්සිකරණ ටැංකි මගින් සිදු කෙරෙන අතර මූලික පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 21,982 කි. 2010 අවසානයේදී, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 58% ක් පමණ වේ.

සඵල කරගත් වැදගත් කාර්යයන් පහත දැක්වේ.

- නිවාස වැසිකිළිවල පූතික ටැංකිය සහ අපජල උරා ගැනීමේ ටැංකි සැලසුම් කිරීම සඳහා එස්.එල්.එස්. ප්‍රමිතිය පිළිබඳ මහනුවර මහ නගර සභා ප්‍රදේශය තුළ නිවාස සැලසුම් අනුමත කිරීමේ සැලසුම් කමිටුව දැනුවත් කරන ලදි. ගොඩනැගිලි අයදුම්පත් ක්‍රියාවලිය අනුමත කිරීමේදී එම ප්‍රමිතීන් අනුගමනය කරන ලෙස එම අයට මග පෙන්වීම කරන ලදි.

- එස්.එල්.එස්. ප්‍රමිතියට අනුව නිවාස වැසිකිළිවල පූතික ටැංකි සහ අපජල උරාගැනීමේ ටැංකි සැලසුම් කිරීම සඳහා මෘදුකාංගයක් සකස් කර මහනුවර මහ නගර සභාවේ කාර්මික නිලධාරීන්ට සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ටත් අනුමැතිය සඳහා නිවාස සැලසුම් ඉදිරිපත් කරන ලියාපදිංචි වී ඇති ගෘහ නිර්මාණ ශිල්පීන්ට සහ මහනුවර මහ නගර සභාවේ සැලසුම් ශිල්පීන්ටත් එය හඳුන්වා දෙන ලදි.
- යෝජිත මලාපවහන පද්ධති ජාලයට ගෘහස්ථ මළද්‍රව්‍යය එක්රැස් කිරීම සඳහා වූ ජල නළ ක්‍රම සඳහා සම්මත සැලසුමක් සකසන ලදි.
- අපජලය බැහැර කිරීම පිළිබඳ සංශෝධිත මහනුවර මහනගර සභාවේ අතුරු නීති ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් සකසා නීති කෙටුම්පත් සකසා ඔවුන්ගේ අදහස් විමසීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදි.

## ඔස්ට්‍රියානු ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘති

**කොළඹ මලාපවහනය (දකුණු ජල පෝෂක ප්‍රදේශය) පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය 2007 සිට 2010 දක්වා ක්‍රියාත්මක වූ දැනට පවතින අපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියකි. කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ සිටින 180,000 ක පමණ ජන පිරිසකට සේවා සැලසෙන අතර දිනකට ඝ.මී. 25,920 ක ධාරිතා ප්‍රමාණයකින් ජලය පරිහරණය කෙරේ. මූලික පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 2,222 කි.

කොළඹ නගරයේ දකුණු ජල පෝෂක ප්‍රදේශයේ එකතුවන අපජලය කාර්යක්ෂම ලෙස එකතු කර සහ බැහැර කිරීම වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ පරමාර්ථය වී ඇත. සැලසුම් කිරීම සහ ගොඩනැගීමේ පදනම මත මෙම කොන්ත්‍රාත්තුව මගින් “Angerlehner Hoch-und Tifban Gasellchaft mBH” නැමැති ආයතනය හරහා සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ ආවරණය වී ඇති ප්‍රධාන කටයුතු වන්නේ වැල්ලවත්තේ පොම්පාගාරය දක්වා දළ වශයෙන් කි.මී. 8 ක් දිග ප්‍රධාන අපවහන නළ මාර්ග දෙක පුනරුත්ථාපනය කිරීම සහ වැල්ලවත්ත ප්‍රදේශයේ නව පොම්පාගාරයක් ඉදි කිරීම ය. 2010 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියේ තත්වය වන්නේ ගාලු පාර, ඩුප්ලිකේෂන් පාර, හැව්ලොක් පාර, ඩිවෝස් ඇවනිව්, කිරුළපනේ පාර, රිජ්වේ පාර, රාජසිංහ පටුමග, විවේකානන්ද මාවත, කැළණි පාර සහ වජිර පාර යන ප්‍රදේශ ඔස්සේ අපවහන නළ මාර්ග කි.මී. 8 ක් පමණ දුරට පුනරුත්ථාපනය කර තිබීම ය. මෙම පුනරුත්ථාපනය කිරීමට නියමිත කොටස් 7 න්, 5 ක් මෙහෙයුම් කටයුතු සඳහා කො.ම.න.ස. වෙත භාර දී ඇත. අපජල එකතුවන මැන් හෝල් පුනරුත්ථාපනය කිරීම අවසන් කර ඇත. වැල්ලවත්ත පොම්පාගාරය නිම කර ඇති අතර කො.ම.න.ස. වෙත භාරදීමට සූදානම් ව පවතී. 2010 වර්ෂය අවසානයේදී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් සහ 79% ක් වේ.



වැඩ අවසන් කරන ලද වැල්ලවත්ත අපජල පොම්පාගාරය

## ශ්‍රී ලංකා රජය අරමුදල් සැපයූ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති

### මධ්‍යම පළාත

**කුණ්ඩසාලේ ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය කුණ්ඩසාලේ, බලගොල්ල, දිගන, අරත්තන, සහ වාවින්න යන ප්‍රදේශවල වෙසෙන 100,000 ක පමණ ජන පිරිසකට සේවා සැලසීම සඳහා වසර 2 කින් නිමවන වෘද්ධියකරණ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍ර මහවැලි ගඟ / හුලු ගඟ වන අතර දිනකට ඝ.මී. 20,000 ක ජල ප්‍රමාණයක් සම්පූර්ණයෙන් පිරිපහදු කර නිකුත් කරනු ඇත. දැනට දිනකට ඝ.මී. 13,000 ක ජල නිෂ්පාදනයක් අරත්තන ජල පිරිපහදුව මගින් ලබාගනී. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රදේශයේ වැඩි වී ඇති ජල ඉල්ලුම සපුරාලීමට කඩිනමින් වැඩි දියුණු කිරීම් සිදුවෙමින් පවතී. 2010 වර්ෂය අවසන් වන විට සමස්ත ප්‍රගතිය 75% කි.

**පළාපත්වෙල ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙය පළාපත්වෙල සහ කෝට්ටේගොඩ ප්‍රදේශයේ සිටින 22,000 ක් පමණ ජන පිරිසකට සේවා සැලසීමට සකස් කරන ලද වෘද්ධියකරණ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය සුදු ගඟ වන අතර දිනකට ඝ.මී. 4,000ක ධාරිතාවයකින් යුතු පිරිපහදුවක් මගින් ජලය පවිත්‍රීකරණය කෙරේ. මූලික පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 150 කි. පළාපත්වෙල පිහිටා ඇති භූගත ජලාශයට පිරිපහදු කළ ජලය පොම්ප කරනු ලබන අතර කි.මී. 8 ක් දිග පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගයකින් ජලය බෙදා හැරීමට සැලසුම්කර ඇත. තුළුමං ළිඳෙන් ලබා ගන්නා ජල ධාරිතාව දිනකට ඝ.මී. 4,000 කින් වැඩිකර ගැනීමට යෝජිත අතර අවශ්‍ය වෙනස්කම් සිදු කරමින් පවතී.

ජලය බෙදා හැරීමේ පද්ධතිය සහ ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගය ඉදි කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. පොම්පාගාරය ඉදි කිරීම අවසන් කර තිබේ. සමස්ත ප්‍රගතිය 2010 වර්ෂය අවසානය වන විට 80% ක් විය.

### මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය මාතලේ නගර ප්‍රදේශය සහ තදාසන්න ප්‍රදේශවල සිටින 15,000 ක ජන පිරිසකට සේවය සැලසීම සඳහා දැනට පවතින ජල යෝජනා ක්‍රමය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාල සීමාව අවුරුදු 04 කි. ජල මූලාශ්‍රය සුදු ගඟ වන අතර දිනකට ඝ.මී. 12,000 ක ධාරිතාව සහිත ජල පිරිපහදුවකින් සමන්විත ය. මූලික පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 385 කි. නව තුළුමං තටාකයක් සහ පොම්පාගාරය ඉදි කිරීමෙන් ද, ජල පිරිපහදුව වැඩි දියුණු කිරීමෙන් ද, ජලය පොම්ප කිරීමේ සහ බෙදාහැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීමෙන් ද මෙම ව්‍යාපෘතිය යටතේ දිනකට ඝ.මී. 16,000 ක් දක්වා ජල ධාරිතාවය වැඩි දියුණු කිරීමට යෝජිත ය. මුදල් හිඟකම නිසා අවලම්බිත ටැංකි ඉදි කිරීම සහ ලැසි පෙරහන පුනරුත්තාපනය යන කටයුතු අත්හිටුවන ලදි. 2010 වර්ෂය වන විට සමස්ත ප්‍රගතිය 75% කි.

# ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති

**ශ්‍රී ලංකා රජය මගින් මුදල් සපයන ලදුව 2010 වර්ෂය තුල වැඩිදියුණු කරමින් / ඉදිකරමින් තිබූ ව්‍යාපෘති පිහිටි ස්ථාන පිළිබඳ සිතියම**




| පළාත | ව්‍යාපෘති ගණන |
|---|---|
| මධ්‍යම | 05 |
| නැගෙනහිර | 04 |
| උතුරු මැද | 05 |
| වයඹ | 02 |
| සබරගමුව | 10 |
| දකුණ | 07 |
| ඌව | 05 |
| බස්නාහිර - මධ්‍යම | 03 |
| බස්නාහිර - උතුර | 02 |
| බස්නාහිර - දකුණ | 01 |
| එකතුව | 44 |

### මාරස්සන ජල සම්පාදන ක්‍රමය

මෙය මාරස්සන නගරය සහ තදාසන්න ප්‍රදේශවල සිටින 25,000 ක නව ප්‍රතිලාභීන් පිරිසකට සේවය සලසන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය මා ඔය වන අතර දිනකට ඝ.මී. 5,000 ක ධාරිතාවක් සහිත ජල පිරිපහදුවකින් සමන්විත ය. ප්‍රතිශෝධිත මූලික පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 222 කි. ප්‍රදේශයෙන් සීඝ්‍රයෙන් වර්ධනය වන ජල ඉල්ලුම සපුරාලීමට දැනට දිනකට ඝ.මී. 2,200 ක ජල නිෂ්පාදනය ප්‍රමාණවත් නොවේ. සම්පූර්ණ සේවා සම්බන්ධතා 3,500 ක් පමණ තිබෙන අතර ජලය බෙදාහැරීමේදී කලාප ක්‍රමය භාවිත කරනු ලැබේ. මුදල් නොමැතිකම සහ ඉඩම් පිළිබඳ කරුණු ව්‍යාපෘතියේ ප්‍රගතිය සඳහා ඇතිවී තිබෙන බාධකය. 2010 වර්ෂය වන විට සමස්ත ප්‍රගතිය 79% කි.

### තලවකැලේ ලිඳුල ජල සම්පාදන ක්‍රමය

මෙය තලවකැලේ සහ ලිඳුල ප්‍රදේශයේ වෙසෙන 15,000 ක ජන පිරිසකට සේවා සැලසීමට දැනට පවතින යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය ග්‍රේට් වෙස්ටර්න් සහ නානු ඔය වේ. මූ.පි.ඇ. රු.මිලියන 172 ක් වන අතර ශ්‍රී ලංකා රජය සහ විදුලිබල මණ්ඩලය යන ආයතන විසින් අරමුදල් සපයනු ලබයි. දැනට පවතින දිනකට ඝ.මී. 1,650 ක ධාරිතාවක් සහිත (අර්ධ වශයෙන් ජල පිරිපහදු කරන) ජල පිරිපහදුව දිනකට ඝ.මී. 2,500 ක ධාරිතාවකින් ක්‍රියාකළ හැකි පරිදි වැඩි දියුණු කරනු ලබයි. තුළුමං වැඩි දියුණු කිරීම සහ වාතකය, අවලම්භනය, අවසාදන ටැංකිය හා පීඩන පෙරන ජල පිරිපහදුවට අලුතින් සවි කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. මේ හැරුණු විට, ඉහළ කොත්මලේ ජල විදුලිය නිපදවීමේ ක්‍රියාවලිය නිසා ජනතාව නැවත පදිංචි කළ ප්‍රදේශවලට දැනට පවතින ජලය බෙදාහැරීමේ පද්ධතිය ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ. 2009 වර්ෂය අවසානය වන විට සමස්ත ප්‍රගතිය 15% කි.

## උතුරු මැද පළාත

### මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය - I වන අදියර



මැදිරිගිරිය ජ.ස.ක්‍රමයේ ජල මූලාශ්‍රය

මෙය මැදිරිගිරියේ පැරණි නගරයේ සහ නව නගරයේ ද දිවුලන්කඩවල, දියසෙන්පුර හා විජයපුර ප්‍රදේශවල ද සිටින 60,000 ක පමණ ජන පිරිසකට සේවය සැලසීම සඳහා සැලසුම් කර ඇති නව යෝජනා ක්‍රමයකි. කවුඩුල්ල වැව මෙහි ජල මූලාශ්‍රය වන අතර මෙම ජල පවිත්‍රාගාරයන් අවලම්බනය, අවසාදිත ටැංකි, ලැසි වැලි පෙරන සහ විශබීජ නාශකය සහිත දිනකට ඝ.මී. 9,000 ක් පවිත්‍ර කර හැක. කාර්යක්ෂම ලෙස ජල පවිත්‍රාගාරයේ අපද්‍රව්‍යය පවිත්‍රීකරණය කිරීම සඳහා රොන් මඩ ඝන කිරීමේ උපකරණය සහ වියළීමේ ටැංකි ද යෝජිත ය. මූ.පි.ඇ. රු. මිලියන 1,890 කි. කවුඩුල්ල වැවෙන් සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වී ඇත. තුළුමග පිරිසිදු නොකළ ජලය පොම්ප කිරීමේ පද්ධති, ජල පවිත්‍රාගාරය, ජලය ගබඩා කිරීමේ පහසුකම්, සම්ප්‍රේෂණ පද්ධතිය හා ජලය බෙදාහැරීමේ නළ මාර්ග පද්ධතිය මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. සීමිත මුදල් ප්‍රතිපාදනය ව්‍යාපෘතියේ ප්‍රගතියට බාධාවක් වී ඇත. 2010 වර්ෂය අවසානය වන විට භෞතික ප්‍රගතිය 35% කි.

### මින්නේරිය හිඟුරක්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය II වන අදියර

මෙය මින්නේරිය, ගිරිතලේ සහ හිඟුරක්ගොඩ ප්‍රදේශයේ වෙසෙන 60,000 ක ජන පිරිසකට සේවය සලසන දැනට පවතින ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීමකි. ව්‍යාපෘති කාල සීමා වසර 3 කි. ජල මූලාශ්‍රය මින්නේරිය වැව වන අතර දිනකට ඝ.මී. 10,900 ක ධාරිතාව ඇතිව විශබීජනාශක ක්‍රමය සහ ලැසි වැලි පෙරහන් දැනට පවතින පවිත්‍රීකරණ ක්‍රියාවලියට ඇතළත් වේ. මූ.පි.ඇ.රු. මිලියන 100 කි. සමස්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා තිබෙන ජල පවිත්‍රාගාරය වන මින්නේරිය ජල පවිත්‍රාගාරය මගින් මින්නේරිය සහ හිඟුරක්ගොඩ ජල සම්පාදන ක්‍රමය ක්‍රියාත්මක වේ. දිනකට ඝ.මී. 13,600 ක් දක්වා තුළුමං ධාරිතාව වැඩි දියුණු කිරීම දැනට පවතින මින්නේරිය ජල පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීම සහ මින්නේරිය සහ හිඟුරක්ගොඩ යෝජනා ක්‍රම 2 සඳහා ජලය ගබඩා කිරීමේ ධාරිතා වැඩි දියුණු කිරීම, ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුළත් වේ. 2010 වර්ෂය අවසානය වන විට භෞතික ප්‍රගතිය 35% ක් විය.

### ඉපලෝගම ජල සම්පාදන ක්‍රමය

මෙය ඉපලෝගම ප්‍රා.ස. ප්‍රදේශයේ ග්‍රා.නි. කොට්ඨාශ 4ක් ඇතුළුව ඉපලෝගම, රණවිරු ගම්මානයේ වෙසෙන 18,000 ක ප්‍රතිලාභීන්ට සේවය සැලසීමට අපේක්ෂිත නව යෝජනා ක්‍රමයකි. දැනට පවතින ඉපලෝගම සහ කැකිරාව ජල සම්පාදන ක්‍රම 2 ටම ජල පවිත්‍රාගාරය සහ තුළුමං ළිඳ පොදුය. දිනකට ඝ.මී. 4,500 ක ධාරිතාව සහ සම්පූර්ණ ජල පිරිපහදු කිරීම සහිතව කලා වැව ජල මූලාශ්‍රය වේ. පිරිසිදු නොකළ ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගයේ මුළු දිග කි.මී. 4 ක් වන අතර සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගයේ දිග කි.මී. 4 කි. ශ්‍රී ලංකා රජයේ මුදල් යටතේ මූ.පි.ඇ. රු. මිලියන 798 කි. 2010 වර්ෂය අවසානයේදී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 75% ක් සහ 90% කි.



ඉපලෝගම ජ.ස. ක්‍රමයේ වාතනය

## නැගෙනහිර පළාත

### කන්තලේ (අග්බෝපුර) ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 1,100 කට සේවා සැලසීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතියකි. මු.පි.ඇ. රු.මිලියන 275 කි. 2010 වර්ෂය අවසානයේදී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 86% හා 66% කි.

### තම්පලගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 30,000 කට සුරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මු.පි.ඇ. රු.මිලියන 95 කි. 2010 වර්ෂය අවසානය වන විට පිළිවෙලින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය 76% ක් සහ 76% ක් වේ.

### සේරුනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය සේරුනුවර, කල්ආරු සහ තදාසන්න ප්‍රදේශවල වෙසෙන ප්‍රතිලාභීන් 9,500 කට සේවය සැලසීමට යෝජිත නව ව්‍යාපෘතියකි. මු.පි.ඇ. රු. මිලියන 110 කි. 2010 වර්ෂය අවසානයේ දී භෞතික ප්‍රගතිය 70% ක් විය.

### දෙහිඅත්තකණ්ඩිය ජල සම්පාදන ව්‍යාපෘතිය - I වන අදියර

මෙය නව ප්‍රතිලාභීන් 16,000 කට දෙහිඅත්තකණ්ඩියේ සුරක්ෂිත ජල සම්පාදනය මගින් ජලය ලබාදීමට අපේක්ෂිත ව්‍යාපෘතියකි. මෙය මු.පි.ඇ. රු. මිලියන 300 ක ව්‍යාපෘතියකි. 2010 වර්ෂයේදී මූල්‍ය ප්‍රගතිය 56% කි.

## වයඹ පළාත

### මහව - නිකවැරටිය ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය

නිකවැරටිය, මහව, වාරියපොළ සහ තදාසන්න ප්‍රදේශවල සිටින 9,000 ක පවුල් සංඛ්‍යාවකට සේවා සැලසීමට සැලසුම් කර ඇති නව ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය මාගල්ල වැව වන අතර දිනකට ඝ.මී. 6,500 ක ධාරිතාව ඇතිව සම්පූර්ණයෙන් ජල පිරිපහදු කිරීම සහිත නිකවැරටිය ජ.ස. ක්‍රමයේ පවිත්‍රාගාරය වේ. ප්‍රතිශෝධිත මු.පි.ඇ. රු.මිලියන 996 කි. ජල පවිත්‍රාගාරය, ජලය බෙදාහැරීමේ පද්ධතිය සහ නිකවැරටිය ජ.ස. ක්‍රමයේ ජලය ගබඩා කිරීමේ ටැංකි සම්බන්ධයෙන් වැඩ අවසන් කර ඇති අතර ජනවාරි මාසයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ය. කි.මී. 12 ක් දිග ජල පොම්ප කිරීමේ ප්‍රධාන නළ මාර්ගයේ කි.මී. 4.5 ක් දුර ප්‍රමාණයක් සඳහා නළ එලිය යුතුව ඇති අතර මහව ජ.ස.ක්‍ර. 2011 වර්ෂය අවසානයේදී ක්‍රියාත්මක කළ හැකි ය. වාරියපොළ ජ.ස. ක්‍රමයේ ජල පවිත්‍රාගාරය සැලසුම් කිරීමේ අවස්ථාවේ පවතී. සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 75% ක් හා 68% ක් වේ.

### කරුක්කපන ජල සම්පාදන ක්‍රමය

පුත්තලම දිස්ත්‍රික්කයේ කරුක්කපන ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 2,500 කට සුරක්ෂිත පානීය ජලය ලබාදීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ය. මු.පි.ඇ. රු. මිලියන 51 කි. 2010 වර්ෂය අවසානය වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 80% ක් හා 53% ක් වේ.

## සබරගමුව පළාත

### ඇඹිලිපිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය ප්‍රතිලාභීන් 84,000 කට සේවය සැලසීම සඳහා අපේක්ෂිත ජල පවිත්‍රාගාරයක් සහිතව දැනට පවතින යෝජනා ක්‍රමය වැඩි දියුණු කරන ව්‍යාපෘතියකි. ජල පවිත්‍රාගාරය නිමකර ඇත. මු.පි.ඇ. රු.මිලියන 363 ක් වන අතර ශ්‍රී ලංකා රජය මගින් සැපයේ. (2010 වසර අවසානයේ මූල්‍ය ප්‍රගතිය මුල් මු.පි.ඇ. 86% ක් විය) මු.පි.ඇ. ප්‍රතිශෝධනය කිරීමක් සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදුවෙමින් පවතී.

### උඩවලවේ ජල සම්පාදන ව්‍යාපෘතිය - පළමුවන සහ දෙවන අදියර

මෙය දැනට පවත්නා ජ.ස.ක්‍ර. වැඩි දියුණු කිරීමකි. මු.පි.ඇ. රු. මිලියන 974 කි. ජල පවිත්‍රාගාරය සහ තුළුමං ළිඳ ඉදි කිරීම 2009 වර්ෂය තුළ අවසන් කරන ලදි. ඉතිරි වැඩ නිම කිරීම සඳහා ප්‍රතිශෝධිත මු.පි.ඇ. සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුව ඇත. 2010 වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රගතිය 49% ක් විය.

### ගොඩකවෙල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය ගොඩකවෙල කොස්නාතොට, රිදීවෙල සහ තදාසන්න ප්‍රදේශවල සිටින ප්‍රතිලාභීන් 22,500 කට සුරක්ෂිත පානීය ජලය සැපයීමට අපේක්ෂා කරන නව ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය රක්වාන ගඟ වන අතර දිනකට ඝ.මී. 4,500 ක ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරයකින් කැටි අවලම්බනයෙන්, අවසාදනයෙන් ලැසි වැලි පෙරණයකින් සහ ක්ලෝරිනීකරණය මගින් ජලය පිරිපහදු කරනු ලබයි. ජල පවිත්‍රාගාර භාරකරු පදිංචි නිවාස ඉදිකිරීම, ගෑස් ක්ලෝරින් කාරකයන් සහ වැලි පෙරණ පිරිසිදු කිරීමේ පොම්ප සවි කිරීම ව්‍යාපෘතියට අයත් වැඩ කොටස් වේ. 2010 වර්ෂයේ දී ව්‍යාපෘතිය අවසන් කර ක්‍රියාත්මක කරන ලදි.



ගොඩකවෙල ජල පවිත්‍රාගාරයේ කොටසක්



යටියන්තොට ජ.ස. ක්‍රමයේ තුළුමං ළිඳ

#### ගලිගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

දැනට ගලිගමුව නගර ප්‍රදේශයේ නල ජල සම්පාදනය නොමැත. අලව්වේ නව තුළුමං ළිඳ (දිනකට ඝ.මී. 5,000) ඉදි කිරීම. දිනකට ඝ.මී. 5000 ක ධාරිතාව ඇති සාම්ප්‍රදායික ජල පවිත්‍රාගාරයක් ඉදි කිරීම. භූගත ජලාශ (ඝ.මී. 225 ක් සහ ඝ.මී. 1,800 ක් සහිතව) ඉදි කිරීම, පොම්පාගාරය ඉදි කිරීම, කි.මී. 12 ක් දුරට සී.අයි. ජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග සපයා එළලීම, දැනට පවතින ජලය බෙදාහැරීමේ ප්‍රධාන නල මාර්ග වැඩිදියුණු කිරීම සහ පොම්ප සවි කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. මූ.පි.ඇ. රු.මිලියන 841 ක් වන අතර ගලිගමුව නගර ප්‍රදේශවල සිටින 30,800 ක ජන පිරිසකට ප්‍රතිලාභ ලැබීමට නියමිත ය. මෙය නව ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘති කාල සීමාව වසර 3 කි. 2010 වර්ෂය අවසානය වන විට මූල්‍ය ප්‍රගතිය 10% ක් විය.

#### නිවිතිගල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 9,400 කට සුරක්ෂිත පානීය ජලය ලබාදීමට අපේක්ෂිතය. මූ.පි.ඇ. රු.මිලියන 99 කි. 2010 වර්ෂය අවසානයේදී මුල් මූ.පි. ඇස්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය 56% කි. මූ.පි.ඇ. ප්‍රතිශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදුවෙමින් පවතී.

#### පැල්මඩුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 14,500 කට සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මූ.පි.ඇ. රු.මිලියන 195 කි. 2010 වර්ෂය වන විට මුල් මූ.පි. ඇස්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය 107% ක් විය. මූ.පි.ඇ. ප්‍රතිශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී.

#### යටියන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය

කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 6,700 කට සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. ප්‍රතිශෝධිත මූ.පි.ඇ. රු.මිලියන 166 කි. 2009 වර්ෂයේ මුල් භාගයේදී ව්‍යාපෘතියේ අර්ධයකින් ක්‍රියාත්මක කරන ලදී. 2010 වර්ෂය වන විට මුල් මූ.පි. ඇස්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය 91% ක් විය..

### දකුණු පළාත

#### අකුරැස්ස ජල සම්පාදන ව්‍යාපෘතිය

අකුරැස්ස සහ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිටින 15,000 ක පමණ ජන පිරිසකට මෙම යෝජනා ක්‍රමය මගින් ජලය සපයනු ලැබේ. නිල්වලා ගඟෙන් ලබා ගන්නා ජලය බෙදාහැරීමට පෙර සම්පූර්ණයෙන් පවිත්‍රිකරණය කරනු ලැබේ. යෝජනා ක්‍රමය සඳහා දිනකට ඝ.මී. 3,150 ක ධාරිතාවක් ඇති අතර ව්‍යාපෘතියේ පිරිවැය රු.මිලියන 338 කි. ජල පවිත්‍රාගාරය පිහිටි ස්ථානය වෙනස් කිරීම සහ ජල මූලාශ්‍රය වෙනස් කිරීම හේතුවෙන් ඉදි කිරීම් කටයුතු ප්‍රමාද විය. 2010 වර්ෂයේ දී ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර ක්‍රියාත්මක කරන ලදි.



අකුරැස්ස ජ.ස. ක්‍රමයේ අවසාදන ටැංකිය

#### හක්මන ජල සම්පාදන ක්‍රමය

හක්මන යෝජිත ජ.ස.ක්‍ර. යටතේ හක්මන ප්‍රදෙශයේ සිටින ප්‍රතිලාභීන් 10,000 කට සුරක්ෂිත පානීය ජලය සැපයීමට අපේක්ෂා කෙරේ. 2010 වර්ෂයේ සිට 2012 දක්වා කාල සීමාව තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ජල මූලාශ්‍රය භූගත නල ළිඳක් වන අතර දිනකට ඝ.මී. 1,800 ක ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරය ජලය අර්ධ වශයෙන් පවිත්‍රිකරණය කරනු ලැබේ. තුළුමං ළිඳ වැඩි දියුණු කිරීම නව ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, ජල සම්ප්‍රේෂණ හා ජල බෙදා හැරීමේ නල මාර්ග ඉදිකිරීම සහ පොම්ප සපයා සවි කිරීම ව්‍යාපෘතියට අයත් ප්‍රධාන වැඩ කටයුතු වේ. ව්‍යාපෘතියේ මුල් මූ.පි.ඇ. රු.මිලියන 140 ක් වන අතර මූ.පි.ඇ. ප්‍රතිශෝධනය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී. 2010 වර්ෂයේ ජනවාරි මාසයේදී ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන ලදි.

**තිහගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය**



තිහගොඩ ජල සම්පාදන ක්‍රමයේ ලුහු වැලි පෙරහනය

තිහගොඩ සහ තදාසන්න ප්‍රදේශයේ ඇතිවූ සංවර්ධනය හේතුවෙන් ජල ඉල්ලුම සපුරාලීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන ලද අතර 6,500 ක පමණ ජන පිරිසකට එමගින් සේවය සැලසේ. ජල මූලාශ්‍රය භූගත නළ ළිං දෙකක් වන අතර දිනකට ඝ.මී. 1,000 ක ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරයේ ජලය අර්ධ වශයෙන් පිරිපහදු කෙරේ. පෙරහන් මාධ්‍යය හිඟය සහ කොන්ත්‍රාත්කරු විසින් නිතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රගතිය කෙරෙහි බරපතල ලෙස බලපෑවේය. 2010 වර්ෂයේ දී ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර ක්‍රියාත්මක කරන ලදි.

**උඩුගම ජල සම්පාදන ව්‍යාපෘතිය**

උඩුගම සහ තදාසන්න ප්‍රදේශවල වෙසෙන 6,000 ක ජන පිරිසකගේ ජල ඉල්ලුම සපුරාලීම පිණිස මෙම යෝජනා ක්‍රමය ඉදිකිරීම 2004 වර්ෂයේදී ආරම්භ කරන ලදි. ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 145 කි. දිනකට ඝ.මී. 1,200 ක ධාරිතාව ඇති සාම්ප්‍රදායික ජල පවිත්‍රාගාරය නළ ළිං තුනකින් ලබා ගන්නා භූගත ජලය සම්පූර්ණයෙන් පවිත්‍රීකරණය කරනු ලැබේ. කොන්ත්‍රාත්කරුගේ අසතුටුදායක කාර්ය සාධනය සහ පෙරහන මාධ්‍ය හිඟය මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වේ. යන්ත්‍රාගාරය ඉදිකර පෙරහන මාධ්‍යය 2009 වර්ෂයේදී සපයන ලදි. මෙම ව්‍යාපෘතිය 2011 වර්ෂය තුළ අවසන් කරනු ලැබේ.



උඩුගම ජ.ස. ක්‍රමයේ රළු පෙරණය

**පිටබැද්දර ජල සම්පාදන ව්‍යාපෘතිය**

පිටබැද්දර නගර ප්‍රදේශයේ වෙසෙන 6,000 ක ජන පිරිසකට ජලය ලබාදීම යෝජිත ජල සම්පාදන ක්‍රමය මගින් අපේක්ෂිතය. දිනකට ඝ.මී. 1,200 ක ධාරිතාව ඇති සාම්ප්‍රදායික ජල පවිත්‍රාගාරයකින් ව්‍යාපෘතිය සමන්විත වන අතර ජල මූලාශ්‍රය ලෙස භූගත නළ ළිං 2 ක් යොදා ගනු ලැබේ. ව්‍යාපෘතියේ මු.ඇ.පි. රු. මිලියන 130 කි. 2007 වර්ෂයේ ඉදි කිරීම් වැඩ ආරම්භ කරන ලද නමුදු මුදල් නොමැතිකමින් සහ කොන්ත්‍රාත්කරුගේ අසතුටුදායක කාර්ය සාධනය නිසා ප්‍රගතිය මන්දගාමී විය. ජල පවිත්‍රාගාරයේ ඉතිරි වැඩ සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවස්ථාවට පත්ව ඇත. පොම්ප සපයා සවි කිරීමේ කොන්ත්‍රාත්තුව ඇගයීමේ අවස්ථාවේ පසුවේ. 2010 වර්ෂයේ අවසානයේදී භෞතික ප්‍රගතිය 28% ක් විය.

**රදම්පොල ජල සම්පාදන ව්‍යාපෘතිය**

රදම්පොල සහ රට ආසන්න ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා මෙම නව යෝජනා ක්‍රමය සැලසුම් කර ඇත. 13,000 ක ජන පිරිසකට මෙම යෝජනා ක්‍රමය මගින් පහසුකම් සැලසේ. දිනකට ඝ.මී. 1,800 ක ධාරිතාව යෝජනා ක්‍රමය සතුවන අතර අර්ධ වශයෙන් ජල පවිත්‍ර කිරීමේ පහසුකම්වලින් එය යුක්ත වේ. ජල මූලාශ්‍රය ලෙස නළ ළිං 2 ක් භාවිත කරනු ලැබේ. යෝජනා ක්‍රමයේ මු.පි.ඇ. රු.මිලියන 133 කි. 2009 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී ව්‍යාපෘතිය අවසන් කර ක්‍රියාත්මක කරන ලදි.

## ඌව පළාත

**ඔහිය ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙය වැලිමඩ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල වෙසෙන 10,000 ක ජන පිරිසකට සේවා සැපයීම අපේක්ෂා කරන වසර 3 ක නව යෝජනා ක්‍රමයකි. දිනකට ඝ.මී. 2,000 ක ධාරිතාවය ඇති සම්පූර්ණ ජල පිරිපහදුවක් සිදුවන මෙම ව්‍යාපෘතියේ උමා ඔය ජල මූලාශ්‍රය වේ. මු.පි.ඇ. රු.මිලියන 189 ක් වන අතර 2010 වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 80% ක් සහ 90% ක් පමණ විය. මුදල් සීමා කිරීම ව්‍යාපෘතියේ ප්‍රගතිය පමා කරයි.



ඔහිය ජල පවිත්‍රාගාරයේ කොටසක්

**මොණරාගල ජල සම්පාදන ව්‍යාපෘතිය 2 වන අදියර**

මෙය මොණරාගල නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල සිටින 10,000 ක් පමණ ජන පිරිසකට සේවා සැලසීම සඳහා දැනට පවතින යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමකි. දිනකට ඝ.මී. 3,500 ක ධාරිතාවයකින් අර්ධ වශයෙන් ජල පවිත්‍ර කිරීමක් සහිතව ජීලොන් වතුයාය හරහා ඇති ජල ධාරාව ජල

මූලාශ්‍රය වේ. මූ.පි.ඇ. රු. මිලියන 154 ක් වන අතර 2010 වර්ෂයේ අවසානයේදී මූල්‍ය ප්‍රගතිය 82% ක් පමණ විය.

### අඹගස්දෝව ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය අඹගස්දෝව සහ තදාසන්න ප්‍රදේශවල සිටින 6,000 ක ජන පිරිසකට සේවය සැලසීම සඳහා දැනට පවතින යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීමකි. දිනකට ඝ.මී. 3,000 ක ධාරිතාවක් ඇති සම්පූර්ණ ජල පිරිපහදුව සහිත බෝඹුරු ඇල්ල ජල මූලාශ්‍රය වේ. මූ.පි.ඇ. රු.මිලියන 185 කි. 2010 වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රගතිය 83% ක් පමණ විය.

### වැල්ලවාය ජල සම්පාදන ව්‍යාපෘතිය

මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 6,000 කට සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මූපි.ඇ. රු.මිලියන 250 ක් වන අතර 2010 වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රගතිය 4% ක් පමණ විය.

### බඩල්කුඹුර ජල සම්පාදන ව්‍යාපෘතිය

මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 22,000 කට ජලය සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මූ.පි.ඇ. රු. මිලියන 124 කි. 2010 වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 35% ක් සහ 36% ක් පමණ විය.

## බස්නාහිර පළාත

### කිරිදිවැල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙය කිරිදිවැල ප්‍රදේශයේ වෙසෙන 8,000 ක ජන පිරිසකට සේවය සැලසීමට සැලසුම් කළ නව ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාල සීමාව වසර 5 කි. සම්පූර්ණ ජල පිරිපහදු කිරීම සහිත ජල මූලාශ්‍රය කැලණි ගඟ වන අතර අපද්‍රව්‍ය මිරිදිය ඇළට මුදා හැරේ. මූ.පි.ඇ. රු.මිලියන 198 කි. දිනකට ඝ.මී. 2,750 ක් සැපයිය හැකි නව ජල පවිත්‍රාගාරයක් දැනට පූගොඩ තිබෙන ජල පවිත්‍රාගාර වැඩබිමේ ඉදි කරනු ලැබේ. 2010 වර්ෂය අවසානයේදී සමස්ත ප්‍රගතිය 75% ක් විය.

### නිට්ටඹුව - වේයන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය

නිට්ටඹුව, තිහාරිය, වාරණ සහ කලගෙඩිහේන යන ප්‍රදේශවල ප්‍රතිලාභීන් 12,000 කට සේවය සැලසීම මෙම නව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් සිදුකෙරේ. අත්තනගලු ඔයෙන් ජලය ලබාගනු ලැබේ. දිනකට ඝ.මී. 3,000 ක ධාරිතාවය ඇති ජල පවිත්‍රාගාරයක් මගින් ජලය සම්පූර්ණයෙන් පිරිපහදු කරයි. ව්‍යාපෘතියේ මූ.පි.ඇ. රු. මිලියන 211 කි. 2009 වර්ෂය තුළ පී.වී.සී. නල මාර්ගය මාර්ග විහාරස්ථාන පාර දක්වා එළන ලද අතර 2010 වර්ෂය අවසානයේදී සමස්ත ප්‍රගතිය 85% ක් විය.

### කළුතර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන පියවර

210,000 ක ජන පිරිසකට සේවා සැලසීම සඳහා පයාගල, මග්ගොන, බේරුවල, දර්ගා නගරය, බෙන්තොට සහ අලුත්ගම ප්‍රදේශවලට ජලය ලබාදීම ව්‍යාප්ත කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය සැලසුම් කරන ලදි. දිනකට ඝ.මී. 56,250 ක් ඇති සම්පූර්ණ ජල පිරිපහදු කිරීම සිදු කරන ජල මූලාශ්‍රය කළු ගඟ වේ. ප්‍රතිශෝධිත මූ.පි.ඇ. රු. මිලියන 1,366 කි. කළුතර දකුණු ප්‍රදේශය සඳහා ජලය බෙදාහැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම, 2 වන අදියරේ ප්‍රධාන අරමුණ වේ. සෙන්ට්‍රල් හන්දියේ සිට මග්ගොන දක්වා ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය සවි කිරීම සහ සී.අයි. නල මාර්ග එලීම සිදුවෙමින් පවතී. 2011 වර්ෂය තුළ ඉහත සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයේ 2 වන අදියර මග්ගොන සිට බේරුවල දක්වා සවි කිරීමට නියමිත ය. 2010 වර්ෂය අවසානයේදී භෞතික ප්‍රගතිය 34% ක් විය.

### කටුනායක - සීදූව ජල සම්පාදන ව්‍යාපෘතිය

කටුනායක, සීදූව සහ රද්දොලුගම යන ප්‍රදේශවල 29,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසෙන අතර දිනකට ඝ.මී. 4,500 ක ධාරිතාවකින් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. ජල මූලාශ්‍රය දඬුගම් ඔය වන අතර ජල අවශ්‍යතාව වැඩි දියුණු කළ රද්දොළුගම ජල පවිත්‍රාගාරය මගින් ලබා ගනී. මූ.පි.ඇ. රු.මිලියන 470 ක් දක්වා ප්‍රති-ශෝධනය කරන ලදි. රද්දොලුගම දැනට පවතින ජල පවිත්‍රාගාරය වැඩි දියුණු කිරීම ආරම්භ කරන ලද අතර ජලය බෙදාහැරීමේ පද්ධතියේ කොටස ජල නල එලිය යුතුව ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ ගැටළු සහ මුදල් නොමැතිකම නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය ප්‍රමාද විය. 2010 වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රගතිය 36% ක් පමණ විය.

### අවිස්සාවේල්ල නව නගර ව්‍යාපෘතිය

මෙම ජල සම්පාදන ක්‍රමයෙන් ධාරිතාව දිනකට ඝන මීටර් 2500 ක නව ජල පවිත්‍රාගාරයක් හා නව ජල බෙදාහැරීමේ පද්ධතියකින් සමන්විත වන අතර, එම ජල බෙදාහැරීමේ පද්ධතිය දැනට පවතින ජලය බෙදාහැරීමේ පද්ධතිය හා සම්බන්ධ කෙරේ. තවද, මෙහි ජල තුලුමුව වන්නේ සීතාවක ගඟ වන අතර, එහි ධාරිතාව වන්නේ ඝන මීටර් 9000 කි. දැනට පවතින ජල පවිත්‍රාගාර ධාරිතාවය 2010 වර්ෂයේ ජල ඉල්ලුමට ප්‍රමාණවත් නොවන බැවින්, ඒ සඳහා ජල පවිත්‍රාගාර ධාරිතාව ඝන මීටර් 4500 දක්වා වැඩි කිරීමට යෝජනා කර ඇත. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 30 ක් පමණ වේ. මෙලෙස සැලසුම් කරනු ලැබුවද, 2010 වර්ෂයට පෙර මුදල් නොමැති බැවින්, මෙම වැඩි දියුණු කිරීම් සිදු කිරීමට නොහැකි විය. දැනට පවතින ජල පවිත්‍රාගාරයේ වැඩිදියුණු කිරීම්වලට අමතරව, ඝන මීටර් 4500 ක ධාරිතාවකින් යුක්ත නව ජල පවිත්‍රාගාරයක් 2018 වර්ෂයට පෙර පෙන්රිත් වත්තේ ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඉදිරියේදී, ඇතිවන ජල ඉල්ලුම සපුරාලීම සඳහා දැනට පවතින අවිස්සාවේල්ල පැරණි ජල සම්පාදන ක්‍රමයේ ක්ලෝරිනීකරණ පද්ධතිය ප්‍රතිසංස්-කරණය කර, ධාරිතාවය ඝන මීටර් 3000 ක ජල පරිමාවක් 2018 වර්ෂයේ ලබා ගැනීමට සැලසුම් කර ඇත. තව ද, අවිස්සාවේල්ල ජල සම්පාදන ක්‍රමයේ ඉදිරි වැඩි දියුණු කිරීම් සඳහා අදියර දෙකකින් සැලසුම් කර ඇති අතර එහි පළමු අදියර මිලියන 1228 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ක්‍රියාත්මක කිරීම 2012 - 2014 දක්වා කාලසීමාව තුළදී නිම කිරීමට ද සැලසුම් කර ඇත. මේ සඳහා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර දෙවන අදියර 2030 වර්ෂයේ ජල ඉල්ලුම සැපයිය හැකිවන පරිදි සැලසුම් කර ඇත. මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව 2030 වර්ෂයේදී ප්‍රතිලාභීන් 65,000 කට ජලය සැපයීමට මෙම ව්‍යාපෘතිය මගින් හැකියාව ඇත.

**ජල්තර - රනාල ජල සම්පාදන ව්‍යාපෘතිය 1 වන පියවර 1 වන අදියර**

මෙය කඩුවෙල සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා සේවය සලසන නව ව්‍යාපෘතියකි. 1 වන පියවරේ 1 වන අදියර සඳහා 2030 වර්ෂයේදී සැලසුම් ජනගහණය 7,646 ක් වන අතර 2030 වර්ෂයේදී 2 වන පියවරේදී එම සංඛ්‍යාව 92,118 ක් වේ. 1 වන පියවර සඳහා පවිත්‍ර ජලය කලටුවාව/ ලබුගම (ඩී 20) නළ මාර්ගයෙන් ලබා ගන්නා අතර II වන පියවර සඳහා සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් සහ සමාගම වෙතින් ජල පවිත්‍රාගාරය භාර ගන්නා ලදි. 1 වන පියවර සඳහා මූ.පි.ඇ. රුපියල් මිලියන 217 ක් වන අතර II වන පියවර සඳහා එය රුමිලියන 1,295.95 වේ. ඉහත ව්‍යාපෘතිය යටතේ ජල්තර - රනාල ප්‍රදේශය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ලෙස හඳුනාගෙන ඇති අතර පියවර 2 කින් මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ජල්තර හා හෝමාගම ග්‍රාම නිලධාරී කොට්ඨාශ 1 වන පියවරේ 1 වන අදියර යටතේ ආවරණය වන අතර ආටිගල නැගෙනහිර, ආටිගල බටහිර, පානලුව සහ බටේවෙල 1 වන පියවරේ 1 වන අදියර යටතේ ආවරණය කරනු ලැබේ. II වන පියවර යටතේ කඩුවෙල සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඇතුළත ඉතිරි ප්‍රදේශය ආවරණය කෙරේ. ව්‍යාපෘතිය සඳහා මුදල් සැපයීමේ බාධක ඇත.

**හංවැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙය හංවැල්ල ප්‍රදේශයේ 20,000 ක ජන පිරිසකට සේවය සැලසීමට අපේක්ෂාව ඇති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකි. මෙම යෝජනා ක්‍රමය සඳහා ජලය ලබුගම - කලටුවාව පවිත්‍ර ජල පද්ධතියෙන් ලබාගනී. මූ.ඇ.පි. රුමිලියන 47 කි. ජලය බෙදාහැරීමේ පද්ධති ජාලය ව්‍යාප්ත කිරීම හා දැනට පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමට යෝජිත ය. නව ජලය බෙදාහැරීමේ පද්ධතියේ සම්පූර්ණ දිග කි.මී. 15 ක් වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග හැර ඉන් කි.මී 9 ක් නිමකර ඇත. භෞතික ප්‍රගතිය 60% කි. ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන බාධාවක් වශයෙන් ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය රුමිලියන 29 කලට වේලාවට නොලැබීම හඳුනාගෙන ඇත.

## අන්තර්පළාත් කුඩා ව්‍යාපෘති

**වැගන්තලේ ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙය වැගන්තලේ සහ තදාසන්න ප්‍රදේශවල ප්‍රතිලාභීන් 5,000 කට සේවය සැලසීම අපේක්ෂිත නව ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය මහ ඔය වේ. ඝ.මී. 225 ක භූතල ජලාශය සහ ප්‍රවේශ මාර්ග ඉදි කිරීම ඇතුළුව කටයුතු ව්‍යාපෘතිය සඳහා අයත් වැඩ කොටස් වේ. මූ.පි.ඇ. රු. මිලියන 30 කි.

**පහළ කඩුගන්නාව ජල සම්පාදන ව්‍යාපෘතිය**

මෙය පහළ කඩුගන්නාව සහ තදාසන්න ප්‍රදේශවල 5,000 ක ප්‍රතිලාභීන්ට සේවය සැලසීම අපේක්ෂිත නව ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාලසීමාව 2010 සිට 2012 දක්වා වේ. ජල මූලාශ්‍රය කඩුගන්නාවේ පිහිටි උල්පතක් වන අතර දිනකට ඝ.මී. 1,000 ක ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරයක් මගින් විශබීජ නැසීම ඇතුළුව ජල පිරිපහදුව කිරීම සිදු කෙරේ. මූ.පි.ඇ. රු. මිලියන 30 කි.

## 2011 වර්ෂයේ දී භෞතික වැඩ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති

**ලබුගම - කලටුවාව ජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම (හංගේරියානු ණය ආධාර)**

පිරිපහදු කළ ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සහ ජල පවිත්‍රාගාරයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ද අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට ද ලබුගම සහ කලටුවාව ජල පවිත්‍රාගාර (ආරම්භය පිළිවෙලින් 1886 සහ 1957 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලදි.) වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම ව්‍යාපෘතියට ඇතුළත් වේ. කොළඹ නගරය, කඩුවෙල සහ හංවැල්ල ප්‍රදේශ සඳහා එම ව්‍යාපෘතිය මගින් සේවය සැලසේ. මූ.පි.ඇ. රුමිලියන 6,800 ක් වන අතර හංගේරියානු රජය මගින් මුදල් සැපයේ. ණය ගිවිසුම සහ කොන්ත්‍රාත්තු ගිවිසුම අත්සන් කර ඇත.

**විසල් රත්නපුර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වන පියවර (ස්පාඤ්ඤ ණය ආධාර)**

දැනට සිටින පාරිභෝගිකයන් සඳහා ද නව ප්‍රදේශ සඳහා පාරිභෝගික සේවාවන් ව්‍යාප්ත කිරීම සඳහා ද මෙම ව්‍යාපෘතියේ 1 වන පියවර මගින් දැනට සපයනු ලබන සේවා වැඩි දියුණු කරනු ලැබේ. රත්නපුර, කුරුවිට සහ තදාසන්න ප්‍රදේශවල සිටින 160,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් 2025 වර්ෂයේදී සේවා සපයනු ලැබේ. දිනකට ඝ. මී. 13,000 ක ධාරිතාවය ඇති නව ජල පවිත්‍රාගාරයක් ඉදි කිරීම, ජල සම්ප්‍රේෂණ පද්ධතියේ කටයුතු අවසන් කිරීම, ජලය බෙදාහැරීමේ පද්ධතියේ කොටසක වැඩ අවසන් කිරීම, කුරුවිට කුරු ගඟේ නව තුලුමං ළිඳ ඉදි කිරීම 1 වන පියවර සඳහා අයත් ප්‍රධාන වැඩකටයුතු වේ. දිනකට ඝ.මී. 6,500 ක් වන වර්තමාන පාරිභෝගිකයන් වෙත දැනට පවතින ජල පවිත්‍රාගාරය මගින් සේවා සැපයීම කරගෙන යනු ලැබේ. මූ.පි.ඇ. රුමිලියන 9,928 කි. වාණිජ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇති අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ණය ගිවිසුම අත්සන් කළ යුතුව ඇත.

**යාපනය අර්ධද්වීපයේ ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව (ආ.ස.බැ. ණය ආධාර)**

යාපනය නගරයේ, තදාසන්න ප්‍රදේශවල සහ යාපනය අර්ධද්වීපයේ කුඩා නගර කීපයක වෙසෙන 689,000 ක ජන පිරිසකට පමණ පානීය ජල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් වැඩි දියුණු කිරීමට නියමිත ය. යාපනය අර්ධද්වීපයේ භූගත ජල මූලාශ්‍රවලට අතිරේකව ජලය සැපයීම සඳහා කිලිනොච්චි ප්‍රදේශයේ පිහිටි ඉරණමඩු වැවෙන් ජලය සපයා ගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අදියර 2 කින් සිදුකළ යුතුව ඇත. 1 වන අදියර සඳහා මූ.පි.ඇ. රුබිලියන 12 ක් වන අතර 11 වන අදියර සඳහා රු. බිලියන 8 ක් වැයවේ.

### කොළොන්න සහ බලංගොඩ ජල සම්පාදනය (බෙල්ජියම ණය ආධාර)

දිනකට ඝ.මී. 7,700 ක ධාරිතාව ඇති සම්පූර්ණ ජල පිරිපහදුව, භූගත ජලාශ (ඝ.මී. 1,000) ජල ටැංකි ඝ.මී. 1,500 ඉදිකිරීම. කි.මී. 25 ක් දිග සි.අයි. සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගය සහ ජලය බෙදාහැරීමේ පද්ධති ජාල ඉදි කිරීම, ඇරේපෝරුව, කොළොන්න, මඩුවන්වෙල, නන්දනගමුව, බලංගොඩ, සමනලවැව ප්‍රදේශය යන ප්‍රදේශවල වෙසෙන 117,500 ක් පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතියේ සේවා සපයනු ලැබේ. මූ.පි.ඇ. රු. මිලියන 4,965 කි. කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන ලදි.

### රුහුණුපුර ජල සම්පාදනය සංවර්ධනය කිරීම (කොරියානු ණය ආධාර)

මෙය 2025 වර්ෂයේදී 112,000 ක ජන පිරිසකට සේවය සලසන නව ව්‍යාපෘතියකි. ජල මූලාශ්‍රය රිදියගම වැව වේ. කොරියානු රජය මගින් අරමුදල් සපයනු ලැබේ. I වන අදියර සඳහා මූ.පි.ඇ. රු. මිලියන 9,742 ක් වන අතර II වන අදියර සඳහා රු. මිලියන 3,760 ක් වේ. රුහුණුපුර සහ හම්බන්තොට ප්‍රදේශ සඳහා පානීය ජලය සැපයීමට යෝජිත රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය සැලසුම් කර තිබේ. ව්‍යාපෘතිය අදියර 2 කින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ය. කොන්ත්‍රාත්තු ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රමාදවීම භෞතික වැඩ ආරම්භ කිරීම කෙරෙහිත් බලපා ඇත. ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ද සිදුවෙමින් පවතී.

### අම්පාර දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළබඩ නගර ජල සම්පාදනය III වන පියවර (ඕස්ට්‍රේලියාව)

දිනකට ඝ.මී. 22,250 ක සහ දිනකට ඝ.මී. 12,000 ක ධාරිතා ජල පවිත්‍රාගාර ඉදි කිරීම, භූගත ජල තටාක, ජල ස්ථම්භ, පොම්පාගාර, විදුලි හා යාන්ත්‍රික වැඩ, කාර්යාල ගොඩනැගිලි, ජල සම්ප්‍රේෂණ, ප්‍රධාන නළ මාර්ග සහ ජලය බෙදාහැරීමේ ප්‍රධාන නළ මාර්ග සපයා එළීම මෙම නව ව්‍යාපෘතියට ඇතුළත් වේ. අම්පාර ප්‍රදේශයේ 150,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සේවා සපයනු ලැබේ. ජල මූලාශ්‍රය හිමිදුරාව වැව වේ. මූ.පි.ඇ. ඇ.ඩො. 18,012 කි. 2010 වර්ෂයේ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන ලදි. අත්තිකාරම් මුදල් ගෙවන ලද අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගන්නා ලදි.

### අඹතලේ ජල පවිත්‍රාගාරයේ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය (ජර්මන් ණය ආධාර)

බල ශක්ති විගණන 2 ක් යටතේ අඹතලේ ජල පවිත්‍රාගාරයේ බල ශක්ති සංරක්ෂණ ක්‍රමෝපාය ජා.ජ. හා ජ.ම. විසින් යොදන ලදි. බල ශක්තිය 31% කින් අඩුකර සැලකිය යුතු ඉතිරියක් එනම් මාසයකට රු.මිලියන 10 ක මුදලක් ඉතිරි කර ගත හැකිවන බව බලශක්ති විගණනවලින් අනාවරණය වී ඇත. සවිස්තර බල ශක්ති විගණන සිදු කිරීම බලශක්තිය සංරක්ෂණය සඳහා අඹතලේ සිට කොළඹට ප්‍රධාන සම්ප්‍රේෂණ පද්ධති ප්‍රතිසම්පාදනය කිරීම, නළ සම්බන්ධතා යළි සැකසීම සහ ජල පොම්ප කිරීමේ ඒකක ප්‍රතිසම්පාදනය කිරීම ව්‍යාපෘතියට ඇතුළත් වේ. බල ශක්තිය සංරක්ෂණය සඳහා පොම්ප කිරීමේ කටයුතු කාර්යක්ෂම විය යුතුය. මූ.පි.ඇ. රු. මිලියන 7302 කි. කොන්ත්‍රාත් සහ ණය ගිවිසුම් අත්සන් කළ යුතුව ඇති අතර ව්‍යාපෘතිය සූදානම් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

### ගෘහස්ත මලාපවහන සම්බන්ධතා වැඩි කිරීම සහ මලාපවහන පද්ධති නොමැති ස්ථාන සඳහා සනීපාරක්ෂක විසඳුම් ලබාදීම (ලෝක බැංකු ආධාර)

GPOBA ව්‍යාපෘතිය මගින් දෙහිවල/ගල්කිස්ස සහ මොරටුව මහ නගර සභා, කොලොන්නාව සහ ජාඇල ප්‍රාදේශීය සභා ප්‍රදේශවල පදිංචි නිවැසියන් හට ආරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් ලබාදීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක නොවන පූතික ටැංකි සනීපාරක්ෂක නොවන වළ වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් නොමැති අඩු ආදායම්-ලාභී නිවැසියන් 15,725 කට (ජනගහනය 76,400) පහසුකම් සලසයි. සෘජු මලාපවහන සම්බන්ධතා 11,247ක්, සාම්ප්‍ර-දායික හා සරල කෙටි මලාපවහන නළ පද්ධති දීර්ඝ කිරීම්වලින් විමධ්‍යගත අපජල පිරිපහදු සහිත කුඩා මලාපවහන පද්ධතිවලින් මලාපවහන සම්බන්ධතා ලබා දීමෙන් සහ නිවැසියන් 4,028 ට නියමිත මලාපවහන බැහැර කිරීමේ ක්‍රමවේද සහිත ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් ලබා දීමෙන් මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට යෝජිත ය. මූ.පි.ඇ. රු.මිලියන 797 කි. මේ සඳහා ලෝක බැංකු අරමුදල් රු.මිලියන 354 ක්ද, ශ්‍රී ලංකා රජයේ අරමුදල් රු.මිලියන 345 ක්ද ඉතිරි රු.මිලියන 46 ප්‍රතිලාභීන්ගෙන් ද ලබා ගනී. ලෝක බැංකුව මගින් මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා වාර්තාව සම්පූර්ණ කර ඇත.

## යෝජිත ව්‍යාපෘති

### විසල් කුරුණෑගල ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව (චීන ආධාර)

ජල සම්පාදනය හා මලාපවහනය පිළිබඳ යෝජනාවලියකින් මෙම ව්‍යාපෘතිය සමන්විත ය. කුරුණෑගල මහනගර ප්‍රදේශය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශයකින් කොටසක් මෙම ව්‍යාපෘතියේ ජල සම්පාදන කොටසින් ආවරණය වේ. හතරැස් කි.මී. 28 ක ප්‍රදේශය තුළ සිටින 66,450 ක ජන පිරිසකට සේවා සැලසීම සඳහා ජල සම්පාදන ධාරිතාව දිනකට ඝ.මී. 6,500 සිට දිනකට ඝ.මී. 14,000 දක්වා ව්‍යාප්ත කිරීමට නියමිතව ඇත. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8,283 කි. ඩෙ.ජා.ස.නි.ආ. සහය ලබාදීමෙන් ඉවත් වීමෙන් අනතුරුව මුදල් ලබා ගැනීමේ විකල්ප මූලාශ්‍ර හඳුනාගෙන ඇත. චීන කොන්ත්‍රාත්කරුවෙකු විසින් සැලසුම් හා ගොඩනැගීමේ යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර සාකච්ඡා මගින් තීරණ ගැනීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී.

### විසල් දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය

දිනකට ඝ.මී. 30,000 ක ධාරිතාවය ඇති ජල පවිත්‍රාගාරය ඉදි කිරීම ජලය බෙදා හැරීමේ හා සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන නළ මාර්ග සපයා එළීම මෙම ව්‍යාපෘතියේ කටයුතුවලට ඇතුළත් වේ. දඹුල්ල නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල සිටින 60,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සේවය සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 3 ක් වන අතර

මූ.පි.ඇ. රු. මිලියන 10,629 කි. ව්‍යාපෘති යෝජනාව ඇගයීම අවසන් කරන ලද අතර කොන්ත්‍රාත් ගිවිසුම පිළිබඳව කටයුතු අවසන් කළ යුතුව ඇත.

**බදුල්ල, හාලිඇල සහ ඇල්ල ඒකාබද්ධ ජ.ස. ක්‍රමය**

නව ජල පවිත්‍රාගාරයක් (දිනකට ඝ.මී. 15,000 ක), පොම්පාගාරයේ ඉදි කිරීම, දැනට පවතින පද්ධතිය පුනරුත්තාපනය කිරීම ව්‍යාපෘතියට අයත් කටයුතු වේ. බදුල්ල. හාලිඇල සහ ඇල්ල. යන ප්‍රදේශවල සිටින 109,036 ක ජන පිරිසකට පමණ මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 4 කි. මූ.පි.ඇ. රු. මිලියන 8,707 කි. ව්‍යාපෘතියට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී.

**ගම්පහ, අත්තනගල්ල සහ මීනුවන්ගොඩ ඒකාබද්ධ ජ.ස.ක්‍ර.**

බස්නාගොඩ ජලාශය, නව ජල පවිත්‍රාගාරය (දිනකට ඝ.මී. 22,500) ඉදිකිරීම් සහ ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගය හා ජලය බෙදාහැරීමේ පද්ධතිය සපයා ඉදි කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. වේයන්ගොඩ, අත්තනගල්ල, උඅරපොළ, ගම්පහ, යක්කල සහ නිට්ටඹුව ප්‍රදේශවල සිටින 250,000 ක ජන පිරිසකට පමණ මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 3 ක් වන අතර මූ.පි.ඇ. රු. මිලියන 10674 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් ව්‍යාපෘතියට අනුමැතිය ලැබී ඇත. කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව ඇගයීමේ කටයුතු සිදුවෙමින් පවතී.

**කළුතර ජල සම්පාදනය වැඩිදියුණු කිරීම - III වන අදියර**

නළ මාර්ග සපයා එලීම, ජල ස්ථම්භ හා භූගත ජලාශ ඉදි කිරීම ව්‍යාපෘතියට ඇතුළත් වේ. කලුතර, දර්ගා නගරය, බේරුවල සහ වාද්දුව යන ප්‍රදේශවල සිටින 400,000 ක් පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 3 කි. මූ.පි.ඇ. රු. මිලියන 1,367 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘති යෝජනාවක් සඳහා මූලික කැමැත්ත ප්‍රකාශ කිරීමේ අයදුම්පතක් එක් කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව ඇගයීමට ලක්වී ඇත.

**විසල් මාතලේ ප්‍රදේශය සඳහා ජල සම්පාදන ක්‍රමය**

දිනකට ඝ.මී. 38,500 ක් දක්වා ජල පිරිපහදු ධාරිතාව වැඩි දියුණු කිරීම සහ භූගත ජලාශ 4ක් ඉදි කිරීම (ඝ.මී. 3,200 ක ධාරිතාව එක් එක් භූගත ජලාශය සඳහා ඇති) සඳහා යෝජිත ව්‍යාපෘතිය සැලසුම් කරනු ලැබේ. උකුවෙල, මාතලේ, යටවත්ත, පල්ලේපොල සහ රත්තොට ප්‍රදේශවල වෙසෙන 150,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 3 කි. මූ.පි.ඇ. රු. මිලියන 8,000 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තු අනුමැතිය ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණි. ව්‍යාපෘති යෝජනාවක් සඳහා මූලික කැමැත්ත ප්‍රකාශ කිරීමේ අයදුම්පතක් එක් කොන්ත්‍රාත් -කරුවකු විසින් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව ඇගයීමට ලක්වී ඇත.

**අලව්ව - පොල්ගහවෙල ඒකාබද්ධ ජ.ස. ක්‍රමය**

දිනකට ඝ.මී. 12,000 ක තුළුමං ව්‍යුහය, දිනකට ඝ.මී. 8000 ක ධාරිතාව ඇති සම්පූර්ණ ජල පවිත්‍රාගාරය. කි.මී. 35 ක ජලය බෙදාහැරීමේ පද්ධති ජාලය සහ ඝ.මී. 450 ක උත්ථාපක ජල ස්ථම්භය ඉදි කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම් කරන ලදි. පොල්ගහවෙල සහ අලව්ව ප්‍රදේශවල ජීවත් වන 250,000 ක පමණ ජන පිරිසකට පමණ මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසෙනු ඇත. ව්‍යාපෘති කාල සීමාව වසර 4 කි. මූ.පි.ඇ. රු. මිලියන 11,807 කි. ව්‍යාපෘතිය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඇගයීමේ අදියරේ පවතී. ව්‍යාපෘති යෝජනාවක් සඳහා මූලික කැමැත්ත ප්‍රකාශ කිරීමේ අයදුම්පතක් එක් කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව ඇගයීමට ලක්වී ඇත.

**බඩල්කුඹුර, අළුපොත ඒකාබද්ධ ජ.ස. ක්‍රමය**

දිනකට ඝ.මී. 3,300 ක ධාරිතාව ඇති ජල පවිත්‍රාගාරය භූ ගත ජලාශ දෙකක් ඉදි කිරීම, කි. මී. 18 ක් දිග පිරිසිදු නොකළ ප්‍රධාන නළ මාර්ගය සහ ජලය බෙදාහැරීමේ ප්‍රධාන නළ මාර්ග සපයා ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් කටයුතු ය. පිඇස්ස ඇල්ල සහ මිල්ල ඇල්ල ප්‍රදේශවල සිටින 26,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසෙනු ඇත. ව්‍යාපෘති කාල සීමාව වසර 2 කි. මූ.පි.ඇ. රු. මිලියන 1,400 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී ඇති අතර මේ දක්වා අරමුදල් ලබාගත හැකි ආයතනයක් ඉදිරිපත් වී නොමැත.

**වරකාපොළ ජ.ස. ක්‍රමය**

දිනකට ඝ.මී. 16,000 ක තුළුමං ළිඳ පොම්පාගාරය ඉදි කිරීම, ජල පවිත්‍රාගාරය ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නළ මාර්ගය හා ජලය බෙදාහැරීමේ ප්‍රධාන නළ මාර්ග සපයා එළලීම සහ විදුලි හා යාන්ත්‍රික උපකරණ සවි කිරීම ව්‍යාපෘතියෙන් සැලසුම් කර ඇත. වරකාපොළ, අලව්ව, ගල්ගමුව සහ රුවන්වැල්ල ප්‍රදේශවල වෙසෙන 25,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසෙනු ඇත. ව්‍යාපෘති කාල සීමාව වසර 3 කි. මූ.පි.ඇ. රු. මිලියන 3,442 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

**මොණරාගල, බුත්තල ඒකාබද්ධ ජ.ස. ක්‍රමය**

ජල පවිත්‍රාගාරය (දිනකට ඝ.මී. 3,500). තුළුමං ළිඳ (දිනකට ඝ.මී. 4,800) ඉදි කිරීම සහ ජල සම්ප්‍රේෂණ හා ජලය බෙදාහැරීමේ පද්ධති ජාලය සපයා ඉදි කිරීම, පොම්ප සවි කිරීම මෙම ව්‍යාපෘතියට අයත් කටයුතු ය. බඩල්කුඹුර, බුත්තල, වැල්ලවාය, මොණරාගල, මඩුල්ල යන ප්‍රදේශවල වෙසෙන 26,000 ක පමණ ජන පිරිසකට මෙම ව්‍යාපෘතිය මගින් සෙත සැලසේ. ව්‍යාපෘති කාල සීමාව වසර 2 කි. මූ.පි.ඇ. රු. මිලියන 1955 කි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘති යෝජනාවක් සඳහා මූලික කැමැත්ත ප්‍රකාශ කිරීමේ අයදුම්පතක් එක් කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව ඇගයීමට ලක්වී ඇත.

# ක්‍රම සම්පාදනය හා සැලසුම්

## ජල සම්පාදන ව්‍යාපෘති

නව ජල සම්පාදන ව්‍යාපෘති (හෝ වැඩි දියුණු කිරීම) සඳහා අවශ්‍යතාව ඇති ජල සම්පාදන ක්‍රම අදාළ ස්ථානභාර නිලධාරීන් විසින් පළමුව හඳුනා ගන්නා ලදි. ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අනෙකුත් විශාල ව්‍යාපෘති මගින් පානීය ජල අවශ්‍යතා ඉටු කරන ජල සම්පාදන ව්‍යාපෘති අවශ්‍යතාව ඇති කෙරේ. ඒ අනුව පයිප්ප නළ ජල සම්පාදනය සඳහා ඇස්තමේන්තු කළ ඉල්ලුම උදෙසා ප්‍රා.ස.සේ.ම. වල ජ.ස.ක්‍රි. සඳහා යෝජනා ආරම්භ කරන ලදි. යෝජිත ව්‍යාපෘතියේ මූල්‍ය සහ තාක්ෂණ ශක්‍යතාව සොයා දැන ගැනීමට පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලබයි. අනතුරුව මූලික ව්‍යාපෘති යෝජනාව සකස් කර ව්‍යාපෘති ඇගයීම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

නව ව්‍යාපෘති වාර්ෂිකව පළාත් අනුව සහ දිප ව්‍යාප්තව ද, ආංශීය සැලසුම් කිරීමේ අවශ්‍යතාව සඳහා තෝරා ගත් නිර්ණායකයන් පදනම් කරගෙන ද ප්‍රමුඛතාගත කරනු ලැබේ. මෙම ප්‍රමුඛතාවය අනුමැතිය, මුදල් සැපයීමේ විමසුම් සහ ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලැබේ.

ප්‍රධාන ව්‍යාපෘතිවල සැලසුම සහ ක්‍රියාත්මක කළ යුතු ශක්‍යතා අධ්‍යයන ප්‍රධාන කාර්යාලයේ ඇති ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය මගින් සිදු කෙරේ. විදේශ ආධාර ව්‍යාපෘතිවල සැලසුම් සමාලෝචනය මෙන්ම ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ව්‍යාපෘති සැලසුම් කිරීම ද නිශ්චිත වශයෙන් භාරව සිටින්නේ මෙම අංශය යි. පහත සඳහන් පරිච්ඡේදයෙන් එම කටයුතු පිළිබඳ සාරාංශයක් විස්තර කෙරේ.

2010 වර්ෂය තුළ ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය විසින් ඉටුකළ වැඩවල මුළු ඉදි කිරීම් වටිනාකම රු. මිලියන 3,101.7 ක් වන අතර අංශයේ මුළු මෙහෙයුම් වියදම රු. මිලියන 103.7 ක් විය. ඉහත සඳහන් ඉදිකිරීම් වැඩ පිළිබඳ වටිනාකමට විශාල පරිමාණයේ විදේශ ආධාර සැලසුම් හා ඉදිකිරීමේ ව්‍යාපෘති සමාලෝචනය සහ සැලසුම් කිරීම/ ශක්‍යතා කටයුතු සඳහා සැලසුම් වෙනුවෙන් සැපයූ ප්‍රධාන ප්‍රතිපාදන ඇතුළත් නොවේ.

**2010 වර්ෂය තුළ සිදුකරනු ලැබූ ක්‍රම සම්පාදන කටයුතු පහත දැක්වේ.**

කොළඹට නැගෙනහිර නගර සඳහා ජ.ස, ගම්පහ අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජ.ස, කොළඹ ජ.ස බෙදා හැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම, ජල්තර - රතාල ජ.ස. 11 පියවර, කළුතර ජ.ස. වැඩි දියුණු කිරීම III අදියර, කැළණි දකුණ ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය II අදියර, මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්ප්‍රේෂණ පද්ධතිය සහ කොළඹ නගරයේ ජලය බෙදාහැරීමේ පද්ධතිය විශ්ලේෂණය කිරීම, වී ඔය ජලාශය (කැළණි ගගේ ඉහළ කොටසේ දිනකට ඝ.මී. මිලියන 11 ක ධාරිතාවය සහිතව) ලෝක බැංකු ආධාර යටතේ හදිසි උතුරු පුනරුත්තාපන ව්‍යාපෘති, අඩම්පන්, විඩ්තලතිව් හා තෙවන්පිඩ්ඩි ජ.ස, ආ.ස.බැ. ආධාර යටතේ ගැටුම් බලපෑ ප්‍රදේශයේ හදිසි ව්‍යාපෘති. පේදුරු තුඩුවේ ජ.ස, මුලතිව්, මාන්කුලම් සහ කිලිනොච්චි ජ.ස. ව්‍යාපෘති.

**2010 වර්ෂය තුළ සැලසුම් සමාලෝචන කටයුතු පහත දැක්වේ.**

- මහ කොළඹ ජල පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය. මීගමුව ජ.ස. ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම, කැළණි ගඟේ දකුණු ඉවුරේ ජල පවිත්‍රාගාර ව්‍යාපෘතිය, කිරිඳි ඔය ජ.ස. ව්‍යාපෘතිය, අම්පාර දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළබඩ නගරවල ජ.ස.ව්‍යා. 111 වන පියවර, ත්‍රිකුණාමලය විසල් ප්‍රදේශයේ ඒකාබද්ධ ජ.ස.ව්‍යා සහ ආ.ස.බැ. 4 වැනි ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව ජ.ස. යන ව්‍යාපෘති-වල ව්‍යුහාත්මක සැලසුම්, ජල තාක්ෂණ සැලසුම්. සම්-ප්‍රේෂණ හා බෙදාහැරීම් නළ පද්ධති සැලසුම් හා ජල පවිත්‍ර කිරීමේ සැලසුම් සමාලෝචනය කිරීම.
- ඉහත සඳහන් ව්‍යාපෘති වන යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු හා ස්වයංක්‍රියව ක්‍රියා කිරීම පිළිබඳ සැලසුම් සමාලෝ-චනය කිරීම. පොළොන්නරුව ජ.ස. හැර එහෙත් ආ.ස.බැ. ආධාර ඇතිව වියළි කලාපයේ නාගරික ජ.ස.ව්‍යා. ඇතුළුව

**2010 වර්ෂය තුළ සිදුකළ සවිස්තර සැලසුම් කිහිපයක්**

පිටරවුම් පාර සඳහා ඉඩකඩ සලසාදීම පිණිස මාකුඹුර ප්‍රදේශයේ කලටුවාව - දෙහිවල ජල සම්ප්‍රේෂණ නළ මාර්ගය (එන් 33) වෙනස් කර නැවත මාර්ගය ඉදි කිරීම, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය සහ බස්නාහිර පළාතේ මාලඹේ ප්‍රදේශයේ තො.තා. උද්‍යානයට ජල සම්පාදන පහසුකම් සලසා දීම ඇතුළුව දියගම කුඩා නගර සංවර්ධනය සඳහා ජල සම්පාදනය,



මාකුඹුර එන් 33 ප්‍රධාන නළ මාර්ගය වෙනස් කිරීම

යටියන්තොට ජ.ස. ක්‍රමයේ තුළුමං ලිඳ හා ගං ඉවුර ආරක්ෂා කිරීම, ඇඹිලිපිටිය ජ.ස. සඳහා චන්ද්‍රිකා වැවේ නව තුළුමං ව්‍යුහය හා ප්‍රවේශ පාලම සහ දකුණු/ නැගෙනහිර කලාපයේ ගැටුම් බලපෑ ප්‍රදේශයේ හදිසි ව්‍යාපෘති යටතේ ඒච්චිලම්පත්තු ජල සම්පාදන ක්‍රමය



ඒච්චිලම්පත්තු ජ.ස. සඳහා තුළුමං ළිඳ පිහිටි ස්ථානය - වෙරුගල් ගඟ



රිදියගම වැවේ ඇළ මාර්ගයේ රුහුණුපුර ජ.ස.ව්‍යා. සඳහා යෝජිත තුළුමං ළිඳ පිහිටුවන ස්ථානය

- හදිසි උතුරු පුනරුත්තාපන ව්‍යාපෘතිය යටතේ අඩම්පන්, විඩුතලතිව් හා තෙමන්පිඩ්ඩි ජ.ස, ගැටුම් බලපෑ ප්‍රදේශයේ හදිසි ව්‍යාපෘතිය යටතේ පේදුරු තුඩුව ජ.ස, උතුරු/මධ්‍යම කලාපයේ ආ.ස.බැ. ආධාර ලැබූ වියළි කලාපයේ නාගරික ජ.ස.ව්‍යා. යටතේ මුරුක්කන්, මන්නාරම ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය.



මන්නාරම ජ.ස. සඳහා මුරුක්කන් ජල මූලාශ්‍රය

**2010 වර්ෂය තුළ බල ශක්තිය ඉතිරි කිරීමේ ප්‍රයත්නයන් කිහිපයක් පහත දැක්වේ.**

- ජ.ජා.ස.නි.ආ. මගින් මුදල් සැපයූ නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උහන, දමන සහ හිඟුරාන ජ.ස. සඳහා සෘජු ජල පොම්ප කිරීම බෙදාහැරීමේ පද්ධතිවලට සම්බන්ධ විචල්‍ය වේග උපක්‍රම ධාවක අනුව සැලසුම් කිරීම.
- කලටුවාව සහ ලබුගම දක්වා ඇති ගුරුත්ව ජල නළවල අමතර ධාරිතාවය උපයෝගී කර කොළඹින් නැගෙනහිර නගර වෙනුවෙන් ඇති ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ආරම්භ කිරීම.
- කලටුවාව සහ ලබුගම ජල පද්ධතියේ පවතින බල ශක්තිය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම උදෙසා කොළඹ සඳහා ගුරුත්ව පද්ධතියක් වෙනුවෙන් ජල සම්ප්‍රේෂණ නල මාර්ග සැලසුමක් සැකසීම.
- බලශක්ති පිරිවැය මෙන් ම ජල සම්ප්‍රේෂණ පිරිවැය අඩු කිරීමට යෝජිත කොලොන්නාව ජලාශය හරහා අඹතලේ සිට මාලිගාකන්ද දක්වා නව ජල සම්ප්‍රේෂණ නල මාර්ගයක් සැලසුම් කිරීම.

**නල ජ.ස. පද්ධති ක්‍රම සම්පාදනය කර සැලසුම් කිරීම සඳහා බලපෑ පොදු ගැටලු පහත සඳහන් වේ.**

- ලබා දී ඇති ඉතා කෙටි කාල පරිච්ඡේදය හා වැඩ සංකීර්ණත්වය නිසා ගොඩනැගීමේ ව්‍යාපෘති සැලසුම් සමාලෝචනය කිරීම සඳහා පළපුරුදු සැලසුම් ඉංජිනේරු -වරුන් අවශ්‍ය වීම.
- නව ව්‍යාපෘති බොහෝ සංඛ්‍යාවක් සඳහා වර්තමාන ප්‍රවණතාවය සැලසුම් ගොඩනැගීමේ වර්ගයේ ව්‍යාපෘති වීම නිසා සවිස්තර සැලසුම් කිහිපයකට පමණක් සම්බන්ධවීමෙන් සැලසුම් කිරීමේදී පළපුරුද්ද ලබා ගැනීමට ඉංජිනේරුවරුන් සහ අනෙකුත් විශේෂඥයන් අවස්ථාවක් නොලැබීම.
- ජා.ජ. හා ජ.ම. කාර්යමණ්ඩලය විසින් යෝජිත වෙනස්කම් පිළිගැනීමට ව්‍යාපෘති උපදේශකවරුන් අකමැති වීම. සැලසුම්කරුවන් විසින් සම්පූර්ණ සැලසුම් පත් සහ සම්පූර්ණ සැලසුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී ප්‍රමාදය සහ උපදේශකවරුන් විසින් සිදුකළ කටයුතුවල ගුණාත්මක බව පිරිහීම.
- සැලසුම් කටයුතු අවසන් කර අනුමත ව්‍යාපෘති සඳහා විස්තරාත්මක සැලසුම් ආරම්භ කිරීමට විමර්ශන සහ අනෙකුත් මූලික කටයුතු සිදුකිරීමට දේශීය අරමුදල් නොමැතිකම.
- හඳුනාගත් ජල මූලාශ්‍රවලින් ජලය ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමේදී ප්‍රමාදය සහ දුෂ්කරතාවය.
- පිරිසිදු නොකළ ජලය ගබඩා කිරීම වැඩි දියුණු කිරීම සහ නව ජලාශවල දිය රඳවාගැනීම ඇතුළුව ජල සම්පත් වැඩිදියුණු කිරීම ක්‍රම සම්පාදනය කර සැලසුම් කිරීමට විශේෂඥ දැනුම මණ්ඩලය තුළ නොමැති වීම.
- භූගත ජලාශ, ජල ස්ථම්භ සහ ජල පවිත්‍රාගාර සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීම සහ කාලෝචිතව ලබා ගැනීම.
- මාර්ග මත නල මාර්ග එලීම සඳහා මා.ස.අ. / ප.මා.ස.අ. අනුමැතිය ලබා ගැනීම.

**2011 වර්ෂයේදී නව අවධානය යොමුවී ඇති කටයුතු කිහිපයක් පහත දැක්වේ.**

- වඩා සවිස්තර සැලසුම් කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම සඳහා ව්‍යාපෘති මුදල් සැපයීම පිණිස නව ක්‍රමෝපායන් ආරම්භ කිරීම. එකඟ වූ පිරිවැයකට සවිස්තර සැලසුම් සිදු කිරීමට සහ ව්‍යාපෘති සඳහා දේශීය බැංකුවලින් මුදල් ලබාගැනීමේ හැකියාවන් සොයාබැලීමට මණ්ඩලය සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වන යෝජනා ඉදිරිපත් කරන්නන් සමග සාකච්ඡා මගින් තීරණ වලට එළඹීම යොදාගත යුතු වන ඇතැම් හඳුනාගත් ක්‍රමෝපායන්.
- ප්‍රතිදානවල (ප්‍රසම්පාදන, ලිපි ලේඛන, සවිස්තර චිත්‍ර සටහන්, ප්‍ර.බි. පිරිවැය ඇස්තමේන්තු) ගුණාත්මක බව වැඩි දියුණු කිරීම.
- පවතින සැලසුම් කාර්ය සංග්‍රහ සහ කාර්ය පටිපාටි සංග්‍රහ යථාවත් කිරීම. සඳහා අවශ්‍ය සම්පත් යෙදවීම සහ මුදල් ලබාගැනීම.
- සියලුම අදාළ වැඩ වර්ග සඳහා නියැදි ප්‍රමාණ බිල්පත් සැකසීමට යතුරුලියනය කිරීම.
- ජල සම්පාදනය සහ මලාපවහනය සඳහා මිල ගණන් ගොඩනැගීමේ උපලේඛණයක් සැකසීමට අවසන් කළ යුතු අධ්‍යයන කළ වැඩ පදනම් කරගත් මිල ගණන් උප ලේඛණය
- සැලසුම්කරුවන් සඳහා සවිස්තර සංග්‍රහක් සැකසීම.

## මලාපවහන ව්‍යාපෘති

ක්‍රියාත්මක කළ යුතු සියලුම මලාපවහන ව්‍යාපෘතිවල සැලසුම් හා ශක්‍යතා අධ්‍යයන, ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

**2010 වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රම සම්පාදන කටයුතු පහත දැක්වේ.**

කතරගම පූජා භූමි නගරයේ මලාපවහන සහ කාත්තන්කුඩි අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මලාපවහනය, මීගමුව හා ගාලු අපජල පිරිපහදු පද්ධති සහ හම්බන්තොට අපජල පිරිපහදු පද්ධති සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ශක්‍යතා අධ්‍යයන අවසන් කරන ලද අතර ජාඇල / ඒකල - රත්මලාන / මොරටුව අදියර 11 පියවර 1 සහ කතරගම පූජාභූමි නගරයේ අපජලය බැහැර කිරීමේ පද්ධතිය සඳහා ව්‍යාපෘති සංකල්ප ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. මහරගම සහ බොරලැස්ගමුව නගර සහා ප්‍රදේශ සඳහා ශක්‍යතා අධ්‍යයන. දෙහිවල / ගල්කිස්ස සඳහා නළ මලාපවහනය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය, හලාවත අ.ජ.බැ.ප. සහ පුත්තලම අ.ජ.බැ.ප. පිළිබඳ කටයුතු සිදු කරමින් පවතී.

**2010 වර්ෂය තුළ සිදුකළ සැලසුම් සමාලෝචන කටයුතු පහත දැක්වේ.**

සවිස්තර සැලසුම් සමාලෝචනය කර බැලීම සහ විදේශ මුදල් සැපයූ ව්‍යාපෘති හතර එනම්. ජාඇල / ඒකල - රත්මලාන / මොරටුව පියවර 1 අදියර 1 සඳහා අ.ජ.බැ.ව්‍යා. කොළඹ මලාපවහන පුනරුත්තාපන ව්‍යාපෘතිය, දකුණු ජල පෝෂක ප්‍රදේශය, මහනුවර නගරයේ අපජලය බැහැර කිරීම සහ කුරුණෑගල විසල් ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජලය බැහැර කිරීම සඳහා විශේෂඥ සහාය ලබාදීම.

**2010 වර්ෂය තුළ මලාපවහන ව්‍යාපෘති ක්‍රම සම්පාදනය හා සැලසුම් කිරීම සම්බන්ධයෙන් සිදුවූ විශේෂ අවස්ථා පහත දැක්වේ.**

- 2010 – 2015 සීමාව සඳහා සනීපාරක්ෂක සංවර්ධන සැලැස්ම යථාවත් කිරීම.
- 2010 වර්ෂය සඳහා මලාපවහන වැඩ කටයුතු වෙනුවෙන් මිල ගණන් පොත සකස් කිරීම.
- අපද්‍රව්‍ය ස්ථායීකරණ පොකුණු පද්ධති සඳහා ක්‍රියාත්මක හා නඩත්තු කාර්ය සංග්‍රහය සිංහල හා දෙමළ මාධ්‍යවලින් සැකසීම.
- ස්ථානීය සනීපාරක්ෂක වැඩ කටයුතු සඳහා නව වර්ගයේ සැලසුම්පත් සැකසීම.
- සේවා දායකයන් විසින් අපේක්ෂා කළ තාක්ෂණ සහාය අනුව මලාපවහන වැඩ කටයුතු පිළිබඳ විවිධ විෂය පථය සඳහා නැවත ගාස්තු අයකළ හැකි ව්‍යාපෘති 11 සිදු කිරීම. ව්‍යාපෘති 4 සඳහා ප්‍රගතිය 75% - 85% ටත් වඩා ලබා ගන්නා ලදි. වර්ෂය තුළ ලබාදුන් උපදේශක සේවා වෙනුවෙන් 2010 සැප්තැම්බර් මාසය වන විට නැවත ගාස්තු අයකළ හැකි ව්‍යාපෘතිවලින් ලැබුණු ආදායම රු. මිලියන 4.4 කි.
- 2011 අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිත සනීපාරක්ෂාව පිළිබඳ 4 වැනි දකුණු ආසියානු සමළු වැඩමුළුව සංවිධානය කිරීමට දායක වීම.

# ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන




| පළාත/ප්‍රා.ස.සේ.ම | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| මධ්‍යම | 164,259 |
| නැගෙනහිර | 95,169 |
| උතුරුමැද | 62,579 |
| වයඹ | 40,947 |
| උතුර | 6,456 |
| සබරගමුව හා ඌව | 126,035 |
| දකුණ | 203,820 |
| බස්නාහිර - මධ්‍යම | 349,372 |
| බස්නාහිර - උතුර | 141,601 |
| බස්නාහිර - දකුණ | 163,335 |
| එකතුව | 1,353,573 |

## ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන

ජා.ජ. හා ජ. මණ්ඩලයේ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන 10 කින් නව ව්‍යාපෘති ආරම්භ වේ. ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ නියෝජනයක් වශයෙන් ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය විසින් නව ව්‍යාපෘතිවල ක්‍රම සම්පාදන හා නියාමන කාර්ය පටිපාටි දැඩි ලෙස සම්බන්ධීකරණය කරනු ලබයි.

දැනට පවතින ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රම මෙහෙයවන්නේ ද නඩත්තු කරන්නේ ද එම මධ්‍යස්ථාන විසින් ය. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ආදායම් නොලබන ජලය අඩු කිරීම, බලශක්ති කළමනාකරණය සහ ආයතනික සංවර්ධන කටයුතු ප්‍රා.ස.සේ. මධ්‍යස්ථානවල ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයේ කාර්යසාධනය අදාළ අංශවලට ඇතුළත් වේ. ඉහත සඳහන් අංශවලට ඇතුළත් නොවන සමහර අනෙකුත් වැදගත් තොරතුරු පහත සඳහන් ලෙස සාරාංශ කර දැක්වේ.

### බස්නාහිර - මධ්‍යම

පුනරුත්තාපනය කිරීමේ මුදලින් ඇතැම් පද්ධති වැඩි දියුණු කිරීම් සිදුකරනු ලබයි. කොළඹ නගරයේ මළ බැඳුණු ජල නළ නැවත ප්‍රතිස්ථාපනය කටයුතු, බැද්දගාන සී.අයි. නළ මාර්ගය ප්‍රතිසම්පාදනය, කඩුවෙල රත්නාරාම පාර සහ මොරගස්-මුල්ල ප්‍රදේශවල ජලය බෙදාහැරීම වැඩි දියුණු කිරීම එම කටයුතු ය. කොළඹ නගරයේ ජල නළ මාර්ග පද්ධති ජාලයේ ජල ඉල්ලුම ගණන් බැලීම සහ එහි ජල නළ පද්ධතිය සැලසුම් කිරීම සඳහා පරිගණක මොඩලය සකස් කිරීම සිදුවෙමින් පවතී. ජල පද්ධති වැඩි දියුණු කිරීම සඳහා ආරම්භ වූ නව යෝජනා 4 මූලික අවස්ථාවේ තිබේ. නළ මාර්ගය සඳහා අගල් කැණීම හා ඒවා නැවත පිරවීම සඳහා ජනතා සහභාගීත්ව යොදා ගන්නා හංවැල්ල හා ජල්තර ප්‍රදේශවල රනාල අතුරු මාර්ගවල ජලය බෙදාහැරීමේ නළ මාර්ග සඳහා ඇති වළවල් පිරවීම / ව්‍යාප්ත කිරීම අවසන් කර ඇති අතර එහි ප්‍රගතිය පිළිවෙලින් 100% ක් සහ 65% ක් වේ. නැවත ගාස්තු අය කරන වැඩකටයුතු 4 ක් භාරගන්නා ලද අතර එයින් වැඩ 2 ක් අවසන් කර අනෙකුත් වැඩ 2 හි කටයුතු සිදුවෙමින් පවතී.

කොළඹ නගරයේ ක්‍රියාත්මක හා නඩත්තු සඳහා ඇති පොදු ගැටලුව නම් ජල කාන්දු අලුත්වැඩියා සඳහා අදාළ බලධාරීන් විසින් මාර්ග කැණීම් අවසරපත් නිකුත් කිරීමේදී සිදුවන ප්‍රමාදය වේ.

### බස්නාහිර - දකුණ

පිළිවෙලින් කළුතර සහ පානදුර හොරණ ප්‍රාදේශිකවල එළා තිබෙන ජලය බෙදාහැරීමේ නළ මාර්ගවල දීර්ඝ කිරීමේ හා විවිධ විෂ්කම්භයෙන් අතුරු මාර්ග සඳහා කුඩා නළ මාර්ග කි.මී. 16.5 ක් සහ කි.මී. 26 ක් පමණ ව්‍යාප්ත කිරීම් අවසන් කර ඇත. වෙනම ගාස්තු අය කරන වැඩ 21 ක් අවසන් කර ඇති අතර අනෙකුත් නළ මාර්ග දීර්ඝ කිරීම් 33 කින් කටයුතු සිදුවෙමින් පවතී.

### බස්නාහිර - උතුර

කටාන ප්‍රදේශය සඳහා නව ව්‍යාපෘති යෝජනාවක් සකස්කර ව්‍යාපෘති ඇගයීමේ කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදි. පුනරුත්තාපනය කිරීමේ මුදල්වලින් සිදුකළ පද්ධති වැඩි දියුණු කිරීම් කිහිපයක් වන්නේ නුගේපාරේ සහ දුටුගැමුණු මාවතේ නළ මාර්ගය ප්‍රතිසම්පාදනය කිරීම, රු.මිලියන 23.6 ක වියදමින් දිවුලපිටියේ ජ.ස.ක්‍ර. සඳහා ඝ.මී. 100 ක ධාරිතාවය ඇති ජලය ගබඩා කිරීමේ තටාකයක් ඉදි කිරීම ය. ජල නළ මාර්ග විතැන් කිරීම සඳහා මා.ස.අ. වෙතින් භාරගත් නැවත ගාස්තු අය කිරීමේ වැඩ කටයුතු 3 ක් අවසන් කර ඇත. රජයේ දිස්ත්‍රික් අරමුදල්වලින් බියගම නළ මාර්ග ව්‍යාප්ත කිරීම් සිදු කරන ලද අතර පළාත් සභා මුදලින් කැළණිය, මහර, වත්තල සහ ජාඇල ප්‍රදේශවල නළ මාර්ග ව්‍යාප්ත කිරීම සිදු කරන ලදි.

### දකුණු පළාත

දකුණු ප්‍රා.ස.සේ.ම. විසින් ශක්‍යතා අධ්‍යයන 8 ක් සිදුකර යෝජනා සකස්කර එයින් 6 ක් අනුමත කර ඇත. ජ.ස.ව්‍යා. 6 ක් ක්‍රම සම්පාදන කටයුතු කිරීමේ අවස්ථාවේ පසුවන අතර අරමුදල් හඳුනාගත යුතුව ඇත. නැවත ගාස්තු අය කරන ව්‍යාපෘති 6 ක් සිදු කරන ලද අතර 3 ක වැඩ අවසන් වී ඇත. දකුණු පළාතේ පළාත් පාලන ආයතන විසින් පාලනය කරනු ලබන ජ.ස.යෝ. 17 ක් සහ ප්‍ර.මු.ස. මගින් පාලනය කරනු ලබන කුඩා නගර හා ග්‍රාමීය ජ.ස.ක්‍ර. 330 ක් සඳහා ග්‍රාමීය ජල සම්පාදන ඒකකය මගින් අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදෙන ලදි.

### වයඹ පළාත

| | එච්.ඩී.එෆ්.සී. කොටස් ආයෝජනය | | | 208,742 |
| | එච්.ඩී.එෆ්.සී. කාර්ය මණ්ඩල නිවාස ණය සඳහා | | 64,541,010 | 74,139,609 |
| | ලංකා බැංකුවේ ඉතිරි කිරීම් - 1 | | | 1,655,075 |
| | ලංකා බැංකුවේ ඉතිරි කිරීම් -11 | | 942,223 | 883,254 |
| | | | 65,483,233 | 76,886,680 |
| 14. | **අවසාන භාණ්ඩ තොග** | | | |
| | ප්‍රධාන ගබඩාවල තොග | | 179,426,440 | 213,247,142 |
| | වැඩබිම් ගබඩාවල තොග | | 3,067,082,627 | 3,078,020,128 |
| | මාර්ගස්ථ භාණ්ඩ | | 72,629,229 | 2,035,788 |
| | තොග ගැලපුම් | | 29,028,765 | 54,635,314 |
| | | | **3,348,167,061** | **3,347,938,373** |
| | යල් පැනගිය තොග සඳහා ප්‍රතිපාදන | | (65,497,048) | (41,973,331) |
| | මුළු තොග පිරිවැය | | 3,282,670,013 | 3,305,965,042 |
| 15. | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්** | | | |
| | කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ගමන් | | 1,443,290 | 1,865,166 |
| | කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - වැටුප් | | 3,009,915 | 2,575,747 |
| | එච්.ඩී.එෆ්.සී. ලැබිය යුතු මුදල් | | 24,270 | 29,770 |
| | උත්සව අත්තිකාරම් | | 10,749,904 | 10,943,704 |
| | සේවකයන් සඳහා ණය - ආපදා | | 1,361,943,018 | 1,196,195,476 |
| | සේවකයන් සඳහා ණය - වාහන | | 14,838,288 | 18,532,294 |
| | සේවකයන් සඳහා ණය- විශේෂ අත්තිකාරම් | | 81,184 | 122,604 |
| | සේවකයන් සඳහා ණය සුනාමි | | 91,730 | 1,686,480 |
| | විශේෂ දිරිගැන්වීම අත්තිකාරම් | | 25,049,581 | 27,855,183 |
| | අයවිය යුතු වැට් බද්ද | | 1,445,442 | 458,763,913 |
| | අයවිය යුතු රුඳවුම් බද්ද | | 1,310,065 | 40,005 |
| | වෙළඳ ණයගැතියෝ - ජලය | 2,719,393,716 | | 2,628,712,930 |
| | කො.ම.න.ස.ණයගැතියෝ | 28,789,241 | | 28,519,949 |
| | මලාපවහන ණයගැතියෝ | 76,716,118 | | 97,606,077 |
| | වෙනත් ණයගැතියෝ | 61, 505,759 | | 62,820,334 |
| | | 2,886,404,833 | | |
| | අඩුකළා-බොල්ණය සඳහා ප්‍රතිපාදන | (439,992,424) | 2,446,412,409 | (419,828,578) |
| | ණයගැති අය එකතු පාලන | | 231,404,538 | 165,495,718 |
| | අවිනිශ්චිත ණයගැතියෝ | | 72,992 | 72,992 |
| | පොලිය මත ලැබිය යුතු මුදල් හා වෙනත් | | 4,424,718 | 8,377,940 |
| | වාරික ණයගැතියෝ - අළුතින් ජල සැපයුම් | | 60,975,040 | 47,012,170 |
| | වාරික ණයගැතියෝ - අළුතින් ජල සැපයුම් (අඩු ආදායම්) | | 687,315 | (36,671,146) |
| | | | **4,163,963,700** | **4,300,728,728** |
| 16. | **තැන්පතු හා අත්තිකාරම්** | | | |
| | නැවත අයකළ හැකි ව්‍යාපෘති වැඩ | | 406,295,088 | 395,985,044 |
| | සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | | 35,328,829 | 44,757,378 |
| | කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් | | 73,057,383 | 74,490,859 |
| | මුදල් අත්තිකාරම් ප්‍රධාන කාර්යාලය | | 1,554,586 | 1,196,472 |
| | මුදල් අත්තිකාරම් ප්‍රාදේශීය කාර්යාල | | 1,201,163 | 1,784,691 |
| | වෙනත් අත්තිකාරම් | | 6,450,000 | 6,450,000 |
| | කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් (දේශීය කොන්ත්‍රාත්තු) | | 1,590,238,105 | 2,343,305,184 |
| | කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් ( විශේෂ ව්‍යාපෘති) | | 3,226,366,168 | 1,650,273,294 |

| | | 2010-12-31<br>රු. | 2009-12-31<br>රු. |
|---|---|---|---|
| | පූර්ව ගෙවීම් | 870,000 | 1,468,299 |
| | විශේෂ ඩොලර් ගිණුම | 133,722,027 | 133,722,027 |
| | වෙනත් කෙටි කාලීන තැන්පතු | 91,286,467 | 101,558,033 |
| | සේවක ඇප තැන්පතු | 2,117,714 | 2,757,461 |
| | විදුලි තැන්පතු | 9,008,446 | 8,155,597 |
| | දුරකථන තැන්පතු | 28,767 | 66,267 |
| | | **5,577,524,742** | **4,765,970,605** |
| **17.** | **ආයෝජන** | | |
| | භාණ්ඩාගාර බිල්පත් | 357,413,810 | 100,000,000 |
| | ස්ථාවර තැන්පතු | 68,500,000 | 53,286,694 |
| | රත්මලාන මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් | 57,142 | 46,058 |
| | රත්මලාන ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම | 53,908 | 51,798 |
| | දෙහිවල ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම | 15,683,082 | 12,009,223 |
| | දෙහිවල ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම | 170,616,944 | 138,310,633 |
| | | **612,324,887** | **303,704,405** |
| **18.** | **මුදල් හා මුදලට සමාන වත්කම්** | | |
| | ප්‍රධාන ජංගම ගිණුම් | 856,970,717 | 174,002,326 |
| | නව ජල සැපයුම් ගිණුම් | 46,427,141 | 43,896,138 |
| | ප්‍රධාන අය එකතු කිරීමේ ගිණුම | 226,116,259 | 302,330,046 |
| | අභ්‍යන්තර මුදල් මාරුකිරීමේ ගිණුම | 3,301,488 | 5,113,855 |
| | මුදල් අග්‍රිමය ප්‍රධාන කාර්යාලය | 1,290,678 | 156,629 |
| | උප එකතු කිරීමේ ගිණුම් | 13,354,270 | 16,375,184 |
| | මුදල් අග්‍රිම ප්‍රාදේශීය කාර්යාල | 248,425 | 6,906,777 |
| | මාර්ගස්ථ මුදල් | 6,010,768 | 47,973,458 |
| | **අවසාන මුදල් ශේෂය** | **1,153,719,747** | **596,754,413** |
| | ගැලපීම් | | |
| | නව ජල සැපයුම් පාලන ගිණුම | 2,360,436 | 3,309,017 |
| | ජල බිල්පත් අය එකතු කිරීමේ පාලන ගිණුම | 4,669,051 | 24,803,865 |
| | **මුදල් හා මුදලට සමාන වත්කම්** | **1,160,749,233** | **624,867,296** |
| **19.** | **ප්‍රාග්ධන ප්‍රදාන** | 78,149,764,416 | 66,851,379,463 |
| | විදේශ ප්‍රදාන | 470,219,209 | 338,521,700 |
| | දේශීය ප්‍රදාන | **78,619,983,625** | **67,189,901,163** |
| **20.** | **ප්‍රාග්ධනය ආපසු අයකර ගැනීමේ අරමුදල** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 2,150,618.551 | 1,818,551,822 |
| | වර්ෂය තුළ අත්පත් කළ මුදල් ප්‍රමාණය | 381,631,564 | 332,066,729 |
| | | **2,532,250,115** | **2,150,618,551** |
| **21.** | **ගෙවිය යුතු ණය** | | |
| | භාණ්ඩාගාරය මගින් සපයන විදේශ ණය | 22,451,615,595 | 19,517,083,197 |
| | දේශීය ණය | 124,274,006 | 124,859,451 |
| | ගෙවිය යුතු පොලිය | 494,735,575 | 494,735,575 |
| | | **23,070,625,176** | **20,136,678,223** |
| **22.** | **වෙනත් විලම්භිත බැරකම්** | | |
| | විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය | 2,402,977,185 | 2,333,955,232 |
| | පාරිභෝගික හා සේවක ඇප තැන්පතු | 1,001,715,117 | 853,754,473 |
| | | **3,404,692,303** | **3,187,709,705** |
| **22.1.** | **විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන සංචලනය** | | |
| | අදාළ කාලපරිච්ඡේදය ආරම්භයේදී ශේෂය | 2,333,955,232 | 1,442,337,046 |
| | එකතු කළා : අදාළ කාලපරිච්ඡේදය සඳහා ප්‍රතිපාදන | 220,195,945 | 1,012,860,343 |
| | | 2,554,151,177 | 2,455,197,389 |
| | අඩු කළා : අදාළ කාලපරිච්ඡේදය තුළ පාරිතෝෂික ගෙවීම | (151,173,991) | (121,242,157) |
| | | **2,402,977,185** | **2,333,955,232** |

| | | 2010-12-31<br>රු. | 2009-12-31<br>රු. |
|---|---|---|---|
| **23. ණයහිමියෝ** | | | |
| අයකර ගත හැකි වැඩ සඳහා ගණුදෙනුකරුවන්ගේ අත්තිකාරම් | | 1,264,869,393 | 1,072,039,002 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගැනීමේ මුදල | | 1,060,004,822 | 1,084,803,972 |
| කල්බදු ණයහිමියෝ | 29,615,417 | | 27,476,516 |
| අඩුකළා : අවිනිශ්චිත පොලිය | (9,605,875) | 20,009,542 | (10,879,546) |
| | | **2,344,883,758** | **2,173,439,944** |
| **24. 2010 වර්ෂයේ ගෙවිය යුතු ප්‍රාග්ධන ණය** | | | |
| අයි.ඩී.ඒ. 1041 | | 141,065,865 | 163,678,288 |
| ප්‍රංශ - ත්‍රිකුණාමලය | | 20,556,464 | 20,556,464 |
| ප්‍රංශ - මීගමුව 1 | | 5,037,467 | 5,037,467 |
| ප්‍රංශ - මීගමුව 11 | | 4,490,036 | 4,490,036 |
| ප්‍රංශ - කුරුණෑගල | | 3,097,060 | 3,097,060 |
| ප්‍රංශ - බදුල්ල | | 4,080,480 | 4,080,480 |
| ප්‍රංශ - අඹතලේ | | 49,479,984 | 56,321,059 |
| ආ.ස.බැ. 817 | | 131,404,027 | 155,799,463 |
| අයි.ඩී.ඒ. 1700 | | 96,646,476 | 114,853,524 |
| ඕ.ඊ.සී.එෆ්. - එස්.එල්.පී. 19 | | 54,943,550 | 68,359,998 |
| කල්මුණේ (ඕස්ට්‍රේලියා) | | 2,522,312 | 3,152,890 |
| යූ.එස්.ඒ.අයි.ඩී. | | 6,974,972 | 6,974,972 |
| ආ.ස.බැ. (1235) | | 89,688,575 | 111,653,123 |
| එස්.එල්.පී. 37 | | 217,215,035 | 244,366,915 |
| යූ.ඒ.ඩී. - ආ.ස.බැ. 111 | | 132,440,547 | 132,440,547 |
| ඕ.ඊ.සී.එෆ්. - එස්.එල්.පී. 49 | | 220,772,759 | 275,974,534 |
| ඕ.ඊ.සී.එෆ්. - එස්.එල්.පී. 66 | | 33,473,280 | 27,894,400 |
| ගාල්ල විසල් ප්‍රදේශය 1 | | 81,245,753 | 67,704,794 |
| ගාල්ල විසල් ප්‍රදේශය 11 | | 14,673,930 | - |
| මහනුවර - ඩී.ඒ.එන්.අයි.ඩී.ඒ. | | 68,680,800 | - |
| නුවරඑළිය - ඩී.ඒ.එන්.අයි.ඩී.ඒ. | | 26,004,210 | - |
| යූ.එන්.අයි.එච්.ඒ. | | 7,185,871 | - |
| ඕ.ඩී.ඒ. කඳුරට | | 3,732,138 | 6,163,782 |
| ආ.ස.බැ. 1757 | | 6,996,189 | 5,830,157 |
| ඕ.ඊ.සී.එෆ්. - එස්.එල්.පී. 55 | | 728,995,055 | 593,015,856 |
| මාතර/තිල්අඹේ (ඕ.ඩී.ඒ.) | | 49,532,586 | 61,915,731 |
| අඹතලේ දුරස්ථ ණය | | 24,939,249 | 20,788,431 |
| අඹතලේ අලුත්වැඩියා කටයුතු සඳහා ණය | | 21,722,729 | 18,102,275 |
| උතුරු කොළඹ ජල සම්පාදන ක්‍රමය | | 6,673,026 | 6,673,026 |
| ප්‍රංශ අනුරාධපුර | | 43,708,070 | 33,809,964 |
| කේ.එෆ්.ඩබ්ලිව්. ව්‍යාපෘති අම්පාර | | 64,345,499 | 42,897,000 |
| | | **2,362,323,996** | **2,255,632,239** |
| **25. වෙනත් අයවිය යුතු මුදල්** | | | |
| ණය හිමි පාලන ගිණුම | | 125,883,574 | 139,058,407 |
| ගෙවිය යුතු වැට් බද්ද | | 41,814,353 | 53,365,762 |
| ඇප තැන්පතු | | 2,108,742 | 623,931 |
| වෙනත් ණය හිමියෝ | | 41,687,764 | 21,907,747 |
| ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු | | 29,382,854 | 26,286,492 |
| ගෙවිය යුතු වැටුප් | | 112,258,613 | 100,773,472 |
| රැඳවුම් බද්ද | | 1,420,225 | 2,075,584 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වැට් බද්ද | | 761,037,716 | 418,944,559 |
| රැඳවුම් සී.අයි.ජී.එෆ්. | | 172,716 | 1,080,577 |
| රැඳවුම් වැට් බද්ද | | 16,983,344 | 4,135,047 |
| උපචිත වියදම් | | 176,826,595 | 167,935,386 |
| මුදල් පාඩු සඳහා ප්‍රතිපාදන | | 1,075,000 | 1,075,000 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | | 1,730,805 | 1,730,805 |
| | | **1,312,382,299** | **938,992,770** |

**26. ප්‍රාග්ධන බැඳීම්**

2010 වර්ෂය සඳහා බැඳී ඇති ප්‍රාග්ධන වියදම රු. මිලියන 29,000 ක් වන අතර ශ්‍රී ලංකා රජය ජාතික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් වෙන්කර ඇත.

**27. කොන්ත්‍රාත් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව**

මණ්ඩලයේ කොන්ත්‍රාත්තු පිළිබඳව එහි අධ්‍යක්ෂවරුන් තුළ ඍජුව හෝ වක්‍රව හෝ බැඳියාවක් නොමැත.

**28. සංසන්දනාත්මක තොරතුරු**

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් සනාථ කිරීමට අවශ්‍ය අවස්ථාවලදී පසුගිය වර්ෂයේ සංඛ්‍යා නැවත සඳහන් කර ඇත.

**29. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකීම උසුලයි.

# 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කෙරේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසය යි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.)

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) **ශ්‍රී.ල.ගි.ප්‍ර. - 3**

පසුව අතහැර දමන ලද ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද රු.මිලියන 444.3 ක්වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දිගින් දිගටම දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී.ල.ගි.ප්‍ර. - 5**

මූල්‍ය ප්‍රකාශවල දැක්වූ 2010 දෙසැම්බර් 31 වටිනාකම රු. 3,282,670,013 ක් වූ තොග වර්ග කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) **ශ්‍රී.ල.ගි.ප්‍ර. - 9**

මුදල් සහ ආසන්න මුදල් උත්පාදනය හා උපයෝජනය නියමිත පරිදි පෙන්නුම් කෙරෙන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීම සිදුකළ යුතු නමුත් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමේ සත්‍ය මුදල් ප්‍රවාහය පෙන්නුම් කළ බවට සාක්ෂි නොවී ය.

(ඈ) **ශ්‍රී.ල.ගි.ප්‍ර. -13**

ඉදි කිරීම් කොන්ත්‍රාත් ආදායම් (නැවත අය කර ගැනීමේ වැඩ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී.ල.ගි.ප්‍ර. - 18**

(i) දේපල, පිරියත හා උපකරණ නැවත අගය කිරීමේදී ප්‍රයෝජනවත් ජීවිත කාලය සලකා නොතිබුණි.

(ii) දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන දේපල, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු ය. කෙසේ වුවද, මණ්ඩලයට අයත් මාතර කාර්යාලයේ රු. මිලියන 46.8 ක් වටිනා වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(iii) 2002 සිට 2009 කාල පරිච්ඡේදය තුළ පමණක් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කළ දේපල, පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේ වුවද, ඒ වෙනුවෙන් ඉකුත් වර්ෂ සඳහා ක්ෂය කිරීම් ගිණුම්වල සිදුකර නොතිබුණි.

#### 2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.75,843,711,555 වූ කෙරීගෙන යන වැඩවලට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රධාන කාර්යාලයේ කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු. 979,750,333 ක් වටිනාකම වූ විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉල්ලා තිබුණ ද ලැබී නොතිබුණි.

(ii) රු. 1,749,927,354 ක් වටිනාකම වූ සම්පූර්ණ කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති හා ප්‍රාග්ධන ඉදිකිරීම් වැඩ ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර නිම කිරීම් වාර්තා භාර

ගැනීම්, සහතික ස්ථාවර වත්කම් ආකෘති ආදිය ඉදිරිපත් නොකිරීම එයට හේතු වශයෙන් දක්වා තිබුණි. මෙම වත්කම් භාවිතයට ගෙන තිබුණ ද, ගිණුම්වල ඒ වෙනුවෙන් ක්ෂය වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(iii) වටිනාකම රු.114,790,004 ක්වූ බාහිර පාර්ශවයන්ගෙන් මණ්ඩලය භාරගත් ඉදි කිරීම් කටයුතු (නැවත අය කළයුතු කාර්යයන්) නිමා කර අදාළ පාර්ශවයන්ට බාර දී තිබුණ ද, එම වටිනාකම ගිණුම්වල ගැලපීමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දිගින් දිගටම දක්වා තිබුණි.

**(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 3,330,055,379 ක් වටිනාකම වූ තොග සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) තොග වාර්තා යාවත්කාලීන කිරීම සතුටුදායක නොවුණ අතර 2010 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ තොග වෙනස්වීම් වලට අදාළ වූ පිළිවෙලින් හර හා බැර වටිනාකම් රු. 550,362,242 ක් හා රු. 521,486,532 ක් ඔක්තොම්බර් තොග සත්‍යාක්ෂනය කිරීමෙන් පසු ලෙජරයට ගැලපුම් සිදු කර තිබුණි.

(ii) තොග වෙනස්කම් හඳුනාගෙන වාර්ෂිකව වෙනම ම ගිණුමකට මාරු කර තිබූ නමුත්, මේ සම්බන්ධයෙන් වග කිව යුතු නිළධාරීන් වෙත වගකීම් පැවරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂය රු. 29,028,765 ක් විය.

(iii) ප්‍රධාන ගබඩාවෙහි පරිගණක ගත තොග කළමණාකරන පද්ධතිය රු. මිලියන 03 ක පිරිවැයක් දරමින් ස්ථාපිත කර තිබූ නමුත්, එම පද්ධතිය මගින් ප්‍රමාණවත් තොරතුරු ජනනය නොවීමේ හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. ප්‍රධාන ගබඩාවේ ලෙජර ශේෂයෙහි හා පරිගණක ගත කරන ලද ඉන්වෙන්ට්‍රි පද්ධතියේ දැක්වෙන වටිනාකම් අතර රු. 35,860,672 ක වෙනසක් පවතින බව තව දුරටත් නිරීක්ෂණය විය. මණ්ඩලයේ සභාපතිවරයාට අනුව වර්තමානයේ නව පරිගණක ගත කළ පද්ධතියක් ක්‍රියාත්මක කර තිබුණි.

(iv) වටිනාකම රු. 1,144,232 ක් වූ මාර්ගස්ථ තොග වර්ෂ 05 කට වැඩි කාලයක් ගැලපීමකින් තොරව ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(v) සමස්ථ තොග වටිනාකමින් 16% ක් නියෝජනය වූ රු. 507,626,012 ක් වටිනා ප්‍රයෝජනයට ගත නොහැකි හා චලනය නොවන තොග දීර්ඝ කාලයක් තිස්සේ ගබඩාවල රඳවාගෙන තිබුණි.

(vi) අඹතලේ ගබඩාවේ භෞතික තොග සත්‍යාපනය සිදු කර තිබූ නමුත්, සත්‍යාපනය කළ තොග ශේෂය වෙනුවට ලෙජර් ශේෂය ගිණුම්ගත කිරීමේ හේතුවෙන් තොග ශේෂය රු. 3,350,532 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(vii) විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති මගින් ලද රු. 7,635,325 ක් වටිනා තොග ගිණුම්ගත කර නොතිබුණු අතර රසායනික ද්‍රව්‍ය අයිතම 933 ක් ද අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ) එකතු කළ අගය මත බදු (එ.අ.බ.) සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රතික්ෂේප කර තිබූ දේශීය මිලදී ගැනීම්වලට අදාළ අය කර ගත යුතු එකතු කළ අගය මත බදු රු. 28,533,669 ක් සඳහා ගිණුම්වල ගැලපීම් සිදු නොකර මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කමක් ලෙස දිගින් දිගටම දක්වා තිබුණි.

(ii) දෙවන නගර හා ග්‍රාමීය ජල සැපයුම් සහ සනීපාරක්ෂක ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවෙකු විසින් ජා.ජ. සහ ජ.ම. වෙනුවෙන් රු. 151,585,173 ක එකතු කළ අගය මත බදු මුදලක් ගෙවා තිබුණි. මෙම මුදල පසුකාලීනව කොන්ත්‍රාත් -කරු වෙත අදාළ ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. මේ අනුව ව්‍යාපෘති ගිණුම්වල එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර ජල සම්පාදන මණ්ඩලයේ ගිණුම්වල ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණේ රු.72,917,861ක් පමණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එ.අ.බ. යෙදවුම් ගිණුම් රු. 78,667,312 කින් අඩු වී තිබූ අතර ලැබිය යුතු එ.අ.බ. රු. 151,585,173 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**(ඈ) විදේශ ණය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) සමාලෝචිත වර්ෂය සඳහා විදේශ ණය මත ගෙවිය යුතු පොලිය රු. 3,706,802 වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ඉකුත් විගණන වාර්තාවලින් පෙන්නුම් කළ ද, 1999 වර්ෂයේ සිට දීර්ඝ කාලීන වගකීම් ලෙස දැක් වූ ගෙවිය යුතු වූ හිඟ ණය පොලී මුදල රු. 494,735,575 ක් නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ඉ) බැංකු ගිණුම් පවත්වා ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.**

(i) හඳුනා නොගත් හර හා බැර ශේෂයන් එකතුව පිළිවෙලින් රු. 1,999,466 ක් හා රු. 630,744 ක් වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනැවිත් තිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව අනාවරණය විය.

(ii) එකතුව රු. 480,498 ක් වූ මුදල් සහ චෙක් තැන්පතු අඛණ්ඩව දීර්ඝ කාලයක් තුල උපලබ්ධි වී නොතිබුණු අතර හඳුනා ගැනීමෙන් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(iii) රු. 469,424 ක් වූ මාර්ගස්ථ මුදල් 1997 වර්ෂයේ සිට උපලබ්ධි නොවී පැවතුණි.

**(ඊ) මණ්ඩලය සතු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා 2005 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුවට භාර දී තිබූ අතර 2007 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රත්‍යාගණන වටිනාකම වර්ෂ 05 කට පසුව ගිණුම්ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) උතුරු නැගෙනහිර පළාතේ වූ රු. 8,663,620,800 ක දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යගණනය කර නොතිබූ බැවින් ගිණුම්වල පෙන්නුම් කෙරෙන සංඛ්‍යාවල නිරවද්‍යතාව සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වාහන 29 ක් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අස්ථාන ගතවී තිබූ අතර ඉන් වාහන 26 ක වටිනාකම රු. 63,633,473 ක් විය. මෙම වාහනවල පිරිවැය පරීක්ෂාවකින් තොරව ප්‍රත්‍යාගණන අලාභයක් ලෙස පොත්වලින් ඉවත් කර තිබුණි.

(iii) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණ පිරිවැය රු. 1,594,655,643 කින් අඩුවෙන් දක්වා තිබූ බව නිරික්ෂණය විය.

**2.2.3 නොසැසඳු පාලන ගිණුම්**

(i) පාලන ගිණුම්වල වූ පහත දැක්වෙන ශේෂ 2010 දෙසැම්බර් 31 දිනට අනුරූපී උපයෝගී වාර්තා උපලේඛණ ආදිය සමග සැසඳුම් කර නොතිබුණි.

| පාලන ගිණුම් විස්තරය | පාලන ගිණුම් අනුව වටිනාකම රු. | උපයෝගී වාර්තා රු. | වෙනස රු. |
|---|---|---|---|
| ජල ණයගැතියෝ (ප්‍රධාන කාර්යාලය) | 2,721,022,814 | 2,637,440,000 | 83,582,814 |
| ගෙවිය යුතු එ.අ.බ. (12,500) | 539,437 | නැත | 539,437 |
| ගෙවිය යුතු එ.අ.බ. නව සම්බන්ධතා | 4,409,605 | 291,123 | 4,700,728 |
| ගෙවිය යුතු එ.අ.බ. ජල බිල්ගත කිරීම | 115,798 | 7,967,615 | 7,851,817 |
| ගෙවිය යුතු එ.අ.බ. ජල බිල්ගත කිරීම් බියගම | 6,227,151 | 2,738,827 | 8,965,978 |
| ගෙවිය යුතු එ.අ.බ. (12,518) | 4,722,762 | 2,357,177 | 2,365,584 |
| ජල ණයගැතියෝ (3100) | 63,370,100 | 64,142,256 | 772,156 |
| උත්සව අත්තිකාරම් | 10,749,904 | 10,642,756 | 107,148 |
| ආපදා ණය (ප්‍රධාන කාර්යාලය) | 1,235,866,508 | 1,235,610,664 | 255,844 |
| ණයගැති පාලන ගිණුම | 231,404,538 | 179,436,794 | 51,967,744 |
| ආපදා ණය (මහ කොළඹ) | 126,076,510 | 120,298,883 | 5,777,627 |

(ii) ණය ගැතියන්ගේ අයකර ගැනීමේ පාලන ගිණුමේ ශේෂය සමග කේවල ශේෂ සැසඳුම් සඳහා නිසි ක්‍රියා පද්ධතියක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොතිබුණි. එම නිසා ගිණුම් 05 ක රු. 209,642,090 ක මුදලක් හර ශේෂ වශයෙන් ද ගිණුම් 04 ක රු. 153,977,666 ක මුදලක් බැර ශේෂ වශයෙන් ද, සැසඳුම් කිරීමකින් තොරව දක්වා තිබූ අතර මෙය ප්‍රධාන පද්ධති දුර්වලතාවයක් ලෙස හඳුනා ගත හැකි ය. කරන ලද සෝදිසි පරීක්ෂාවට අනුව බැර සහ හර ශේෂ පිළිවෙලින් රු. 6,893,441 ක් සහ රු. 3,670,621,512 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟහිට පැවති බව නියැදි පරීක්ෂණයේදී අනාවරණය කෙරුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම්**

**(අ) ක්‍රියාත්මක නොවන ශේෂයන්**

1994 වර්ෂයේ සිට හඳුනා නොගත් හා සැසඳුම් නොකළ ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු. 602,537,737 ක් හා රු. 577,155,279 ක් වූ අතර නිසි සුපරීක්ෂණයක් නොවීම හා දුර්වල අභ්‍යන්තර පාලනය නිසා මෙම ශේෂ ඇතිවීමට හේතු වී තිබුණි. මෙම ශේෂයන් සැසඳු කිරීමකින් තොරව දිගින් දිගටම පවත්වා ගැනීම වංචනික ගණුදෙනු මගින් මණ්ඩලයට අලාභයන් සිදුවීමට ඉඩ සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) දිරි දීමනා පදනම මත මණ්ඩලයේ සේවකයන් මගින් එම සැසඳුම් කිරීමට උත්සාහ කළ ද එය අසාර්ථක විය.

(ii) මෙම ගිණුම් සැසඳු කිරීමට රු. 1,035,000 පිරිවැයකට ගණකාධිකාරි සමාගමක සේවය ලබාගෙන තිබුණ ද, එම වාර්ථාව මගින් කරන ලද යෝජනා, මණ්ඩලය පිළි නොගැනීමෙන් එය අසාර්ථක වියදමක් විය.

(iii) රහස්‍යතා ලිපි ලේඛණ ආරක්ෂිතව ගබඩා කර තැබීමට කටයුතු කර නොතිබීම නිසා සැලකිය යුතු ලේඛණ ප්‍රමාණයක් අස්ථාන ගතවී තිබුණි.

(iv) දැනටමත් අක්‍රිය ශේෂ ලෙස නම් කර ඇති ශේෂවලට අතිරේකව තවදුරටත් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 119,846,220 ක හඳුනා නොගත් ශේෂ පැවතුණි.

**(ආ) නැවත අයකර ගත හැකි වැඩ**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) බාහිර ආයතන වෙනුවෙන් ඉටු කිරීම සඳහා බාර ගත් කොන්ත්‍රාත් 50 කට අදාළව රු. මිලියන 222.9 අත්තිකාරම් වර්ෂ 03 කට පෙර ලබාගෙන තිබුණ නමුත්, එම වැඩ නිමා කළ බවට හෝ ඒ සම්බන්ධ වර්තමාන තත්ත්වයක් පෙන්නුම් කෙරෙන වාර්ථා මණ්ඩලය විසින් පවත්වා නොතිබුණි.

(ii) මෙසේ ලබා ගත් අත්තිකාරම් වලින් රු. 7,117,911 ක් හඳුනා නොගත් ශේෂ ලෙස පැවතුණි. රු. 40,412,951 ක් වූ ව්‍යාපෘති 19 ක් නිම කර තිබූ නමුත් එම ශේෂ නිරවුල් කර අදාල වූ පාර්ශවයන් වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත් කටයුතු ක්‍රියාත්මක නොකිරීම නිසා අවස්ථා 03 කදී ලබාගත් රු. 9,614,817 ක මුදලක් දීර්ඝ කාලයක සිට නොපියවා රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛණ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. මිලියන 1,892 ක් වූ ජල ණයගැතියන්, මලාපවහන ණය ගැතියන් සහ කොළඹ මහ නගර සභා ණයගැතියන්ගෙන් රු. මිලියන 660 හෙවත් 35% ක් අවුරුදු 3 කට වඩා වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි. මණ්ඩලය විසින් වර්ෂ 3 කට වඩා හිඟ හිටි ශේෂ වෙනුවෙන් වයස් විශ්ලේශණයක් පිළියෙල කර නොතිබුණි.

(ii) කොළඹ මහ නගර සභාවේ (කො.ම.ස) මලාපවහන හා වෙනත් ණය ගැතියන් එකතුව රු. මිලියන 79.6 ක් ශේෂ පත්‍ර දිනට වර්ෂ 03 ක කාලයක් ඉක්මවා හිඟ හිට පැවති අතර හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි.

**2.2.6 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයට අයත් සේවකයින් දොළොස් දෙනෙකු හා මෝටර් වාහන 5 ක් වෙනත් ආයතන හා අමාත්‍යාංශ වෙත මුදා හැර තිබුණි. 2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී. / 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව එම නිලධාරීන් වෙනුවෙන් රු. 3,434,862 ක පාරිශ්‍රමික ගෙවා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

### 2.2.7 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| විෂය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| වෙනත් ණයගැතියෝ | 47,984,264 | විස්තරාත්මක උපලේඛණ හා වයස් විශ්ලේෂණය |
| සැපයුම් අත්තිකාරම් | 631,463 | |
| ලැබිය යුතු පොළී | 4,424,718 | |
| වෙළඳ ණය ගැතියෝ | 1,000,918,724 | |
| කොළඹ මහ නගර සභා ණය ගැතියෝ | 16,257,771 | |
| ගමන් වියදම් අත්තිකාරම් | 261,032 | |
| අඩු කළයුතු දිරි දීමනා | 25,033,581 | |
| කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් | 837,849 | |
| කෙටි කාලීන තැන්පතු | 71,615,320 | |
| නව සම්බන්ධතා වාරික ණය ගැතියන් | 11,678,324 | |
| අමාත්‍යාශයට ලබා දුන් මුදල් අත්තිකාරම් | 6,450,000 | |
| සුළු මුදලින් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් | 120,290 | |
| සේවක ආරක්ෂක තැන්පතු | 1,817,713 | |
| මලාපවහන ණය ගැතියෝ | 6,317,419 | |
| ලැබිය යුතු එකතු කළ අගය මත බදු | 283,150 | |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රු. මිලියන 5955 ක ශුද්ධ අලාභයක වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී ශුද්ධ අලාභය රු. මිලියන 1425 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 4530 ක අලාභයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණු අතර ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණිත අලාභය ආදායමට එරෙහිව ලියා හැරීම හේතුවී තිබුණි. විවිධ අදියරයන්හි මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ | |
|---|---|---|
| | 2010 | 2009 |
| | රු. මිලියන | රු. මිලියන |
| පොදු කාර්ය වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් අයකිරීමට පෙර ලාභය | 3,682 | 3,348 |
| මෙහෙයුම් කටයුතුවලින් ලාභ / (අලාභ) | (4,528) | 184 |
| බදුවලට පෙර වර්ෂය සඳහා ශුද්ධ අලාභය අලාභය | (5,850) | (1,336) |
| බදුවලට පසු වර්ෂය සඳහා ශුද්ධ අලාභය | (5,955) | (1,425) |
| සමුච්චිත අලාභය | (15,588) | (9,560) |

එක් එක් නිෂ්පාදන ඒකකයන්ට අදාළව පසුගිය වර්ෂ 5 තුළ මණ්ඩලය ලාභ උපයා තිබුණ ද, ඉහළ පොදුකාර්ය පිරිවැය හේතුවෙන් ශුද්ධ අලාභයේ නොකඩවා වැඩිවීම පහත සටහනෙහි දැක්වේ.






### 3.2 මූල්‍ය වංචා

මණ්ඩලයේ ත්‍රිකුණාමලය, කැලණිය, අම්පාර යන ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් කීප දෙනෙකු විසින් පිළිවෙලින් රු. මිලියන 171.94 ක්, රු. මිලියන 52.46 ක්, රු. මිලියන 21.38 ක් හා රු. මිලියන 1.8 ක් මූල්‍ය වංචාවන් සිදු කර තිබුණි. දුර්වල මූල්‍ය පාලනය, අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් නොවීම, හඳුන්වා දී ඇති ක්‍රම ක්‍රියාත්මක නොවීම හා සුපරීක්ෂණය දුර්වල වීම යන හේතූන් නිසා මෙම වංචාවන් සිදු කිරීමට හැකි වාතාවරණයක් මණ්ඩලය විසින් ඇති කර තිබුණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරගෙන යනු ලැබේ. කෙසේ වුවද, අදාළ නිලධාරීන් විසින් කැලණිය ප්‍රාදේශීය කාර්යාලයේ සිදුවූ වංචාව වෙනුවෙන් රු. මිලියන 1.075 ක් ආපසු ගෙවා තිබුණි. වර්තමානයේ මෙම තත්ත්වයන් වැළැක්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත් පහත දුර්වලතා පවතින බැවින් අභ්‍යන්තර පාලනය තව දුරටත් දුර්වල බවක් පෙන්නුම් කෙරේ.

(i) ජර්නල් වවුචර්වල අනුමත කිරීම හා වලංගුතාවය සම්බන්ධ පාලනය ඉතා දුර්වල අතර වටිනාකම් අනුව සහතික කිරීමේ බලය නොසලකා වලංගු කිරීම්, ජර්නල් වවුචර් සඳහා උපකාරක ලේඛණ අමුණා නොතිබීම හා ජර්නල් වවුචර් සඳහා විස්තර නොදීම සිදුකර තිබුණි. මේ අනුව, වංචනිකව වෙනස් කෙරෙන සංඛ්‍යාවක් හෝ ව්‍යාජ වවුචර් සඳහා වලංගුතාවය ලැබීම සිදුනොවේ යැයි සිතිය නොහැක.

(ii) බැංකු සැසඳුම් පිළියෙල කිරීම පිළිබඳ සුපරීක්ෂණය දුර්වල මට්ටමක පවතී.

(iii) පාලන ගිණුම් කාලීනව සැසඳුම් නොකිරීම හා එම ශේෂ එකතු වී තිබීමට ඉඩ සැලසී ඇත .

### 3.3 මෙහෙයුම් සමාලෝචනය

#### 3.3.1 ආදායම් නොලබන ජලය (ආ.නො.ජ)

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) ආදායම් නොලබන ජල ප්‍රමාණය නිසා ඇතිවන අලාභය මණ්ඩලය විසින් වෙන්ව හඳුනා නොගත් අතර එය සාමාන්‍ය මෙහෙයුම් අලාභයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|
| ජල නිෂ්පාදන (කියු.මී) | 469.0 | 449.0 | 440.2 | 424.0 |
| ජල පරිභෝජනය (කියු.මී) | 321.5 | 309.6 | 300.9 | 285.3 |
| ආදායම් නොලබන ජලය (කියු.මී) | 146.2 | 139.4 | 139.3 | 138.7 |
| ආදායම් නොලබන ජල අනුපාතිකය (%) | 31.17 | 31.04 | 31.64 | 32.71 |

(ආ) පහත දැක්වෙන පරිදි කොළඹ නගරයට අදාළ ආදායම් නොලබන ජල අනුපාතිකය සංයුක්ත සැලැස්මේ දැක්වෙන පරිදි ඉලක්කයන් ළඟා කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

| වර්ෂය | කොළඹ නගර සීමාව සංයුක්ත සැලැස්ම අනුව ඉලක්කය % | තථ්‍ය % |
|---|---|---|
| 2007 | 50 | 53.19 |
| 2008 | 49 | 53.96 |
| 2009 | 48 | 53.05 |
| 2010 | 47 | 52.03 |

අනෙකුත් ආසියාතික නගර සමඟ සැසඳීමේ දී කොළඹ නගරය ඉහළ ආදායම් නොලබන ජල අනුපාතයක් පැවති දෙවන නගරය බව පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කෙරෙන අතර ප්‍රස්ථාරයේ සඳහන් කොළඹ නගරය හැර සෑම අනෙකුත් ප්‍රධාන නගර ආදායම් නොලබන ජල අනුපාතිකය අඩු කර ගැනීමට කළමනාකරණය කර ඇති නමුත්, කොළඹ මෙම අනුපාතිකය පසුගිය අවුරුදු 12 ඇතුළත ස්ථාවර මට්ටමක පවතින බවත් පෙන්නුම් කෙරේ.




**ප්‍රභවය - ආසියානු සංවර්ධන බැංකුව 2009 වර්ෂයේ කරන ලද සමීක්ෂණය**

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.**

(i) ආදායම් නොලබන ජල අනුපාතිකය ඉහළ යාමට ජල කාන්දු වීම්, නීති විරෝධී සම්බන්ධතා, පරිපාලනමය අඩු පාඩු හා වතු නිවාස සහ පොදු ජල කණු සඳහා ලබා දෙන ජලය හේතු වී තිබුණි.

(ii) නිෂ්පාදිත ජල ප්‍රමාණය ගණනය කිරීම තොග ජල මනු මඟින් සිදු කළ ද, එයින් සැලකිය යුතු සංඛ්‍යාවක් අක්‍රිය වීම නිසා ඇස්තමේන්තු මත නිෂ්පාදනය ගණනය කර තිබුණි. ඒ අනුව, මෙම දත්තවල නිරවද්‍යතාවය ප්‍රශ්නකාරී වේ. මෑත කාලය තුළ තොග නව මනු කියවීම් සවි කර තිබුණ ද, ප්‍රධාන ජල මනු සවි කළ යුතු සමහර ප්‍රදේශ කිහිපයකට අවශ්‍ය මනු ස්ථානගත කර නොතිබුණි.

(iii) කොළඹ නගරයේ පවතින ජල නළ පද්ධතියෙන් 77% ක ප්‍රමාණයක් වර්ෂ 55 කට පෙර සවි කරන ලද සහ බෙදා හැරීම් පද්ධතියේ 97% ක් පැරණි යකඩ නළ වලින් යුක්ත වීම නිසා කාන්දුවීම් වැඩිවීමට හේතු වී තිබුණි. නව ජල නළ එලීමේ අවශ්‍යතාවය දැඩිව තිබුණ ද, මණ්ඩලය මහා පරිමාණ ව්‍යාපෘතීන් ආරම්භ කළ නමුත්, මේ සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කර කටයුතු කර නොතිබුණි.

(iv) ජල පාරිභෝගිකයන්ට ඔවුන් පරිභෝජනය කරන සෑම ජල ඒකකයක් වෙනුවෙන් ම 2010 වර්ෂයේදී, රු. 13.14ක අතිරේක වියදමක් දැරීමට සිදුවන අතර 2006 වර්ෂයේ දී එය රු. 9.27 ක් වූයෙන් ඉකුත් වර්ෂ 04 තුළ එහි 41% ක වැඩිවීමක් පෙන්නුම් කෙරෙන බව නිරීක්ෂණය විය.

#### 3.3.2.විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති

විදේශීය ප්‍රදාන ආයතනයන්ගේ අරමුදල් සැපයුමෙන් විශාල පරිමාණයේ ව්‍යාපෘතීන් 26 ක් හා සුනාමි ව්‍යාපෘති 06 ක් ශේෂ පත්‍ර දිනට ක්‍රියාත්මක කරමින් පැවතිණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මණ්ඩලය විසින් මහා පරිමාණ ව්‍යාපෘති ගණනාවක් නිමා කර ඇති නමුත් ඒ ඒ ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ පවත්නා තත්ත්වයන් මත ලැබුණේ ද යන්න මැනීම සඳහා ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රමවේදයක් මණ්ඩලය විසින් සකස් කර නොතිබුණි.

(ආ) මහා පරිමාණ විදේශ ව්‍යාපෘතීන් ආරම්භයේදී වූ නිම කිරීමේ අපේක්ෂිත කාලය තුළ සිදු නොවී ඇති අතර විශාල වශයෙන් ව්‍යාපෘති කාලයන් දිර්ඝ කිරීම් සිදු කිරීම නිසා අතිරේක වැඩ මිල වැඩිවීම් වෙනුවෙන් පසුකාලීනව පිරිවැය ද, විශාල ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කෙරේ.

(ඇ) නිශ්චිතව හඳුනාගත් ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලද රු. මිලියන 42 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය හා අදාළ ප්‍රදාන ආයතනයේ අනුමැතියකින් තොරව වෙනත් ව්‍යාපෘතීන් සඳහා යොදවා තිබුණි.

(ඈ) දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘතීන් කිහිපයක් සම්බන්ධයෙන් වෙනම පොත් හා ගිණුම් පද්ධතියක් පවත්වා නොගැනීම තුලින් ඒ පිළිබඳ විගණනයේ ද පුළුල් පරීක්ෂාවක් කිරීම අපහසු වී තිබුණි.

### 3.3.3 දේශීය අරමුදල් සම්පාදිත කුඩා පරිමාණ ව්‍යාපෘති

කුඩා පරිමාණ ව්‍යාපෘති 16 ක් වර්ෂ ගණනාවකට පෙර ආරම්භ කර ඇති නමුත් අවුරුදු 10 කට වඩා වැඩි කාලයක් ගත වීමෙන් පසුත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. වැය කරන ලද මුළු වියදම හා සාපේක්ෂව බලන විට එවැනි කාලයක් සාධාරණ නොවන බව නිරීක්ෂණය විය.

### 3.3.4 විදේශ ණය

ශේෂ පත්‍ර දිනට නොගෙවන ලද සමුච්චිත විදේශ ණය ශේෂය රු.මිලියන 25,434 ක් වූ අතර විදේශ ණය ශේෂ මුළු වත්කම් වලින් 15.8% ක් නියෝජනය විය. සමාලෝචිත වර්ෂය සඳහා විදේශ ණය මත වූ පොලිය රු. මිලියන 1,867.5 ක් වූ අතර එය මණ්ඩලයේ මුළු ආදායමෙන් 15% ක් නියෝජනය විය. රජය විසින් 2009 වර්ෂයේ සිට සහනදායී පොලී ප්‍රතිශතයක් ලබාදී තිබුණ ද, අරමුදල් හිඟකම හේතුවෙන් ගෙවිය යුතුව තිබූ ණය වාරික හා පොලී මුදල් විශාල ප්‍රමාණයක් ගෙවීමට නොහැකි තත්ත්වයකට පත් වී තිබුණි. ඉකුත් වර්ෂ දෙක හා සැසඳීමේ දී 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ප්‍රමාණයන් පහත දැක්වේ.

| වර්ෂය | ණය වාරික රු. මිලියන | පොලිය රු. මිලියන | මුළු මුදල රු. මිලියන |
|---|---|---|---|
| 2008 | 235.0 | 235.4 | 470.4 |
| 2009 | 330.5 | 1060.6 | 1391.1 |
| 2010 | 840.1 | 1861.0 | 2701.1 |
| එකතුව | 1405.6 | 3157.0 | 4562.6 |

### 3.4 පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදා හැරීම

දැනට ක්‍රියාත්මක වන රජයේ වර්ෂ 10 ක සංවර්ධන සැලැස්මට අනුව 2009 වර්ෂය වන විට ජනගහනයෙන් 80% කට, 2013 වර්ෂය වන විට 85% කට හා 2016 වර්ෂය වන විට 90% කට ප්‍රමාණවත් ජලය සැපයීමට අපේක්ෂිත විය.

2010 වර්ෂය තුළද මණ්ඩලය විසින් පිරිසිදු ජලය ඝන මීටර් මිලියන 469 ක් නිපදවා තිබුණි. මෙම නිෂ්පාදනය 2009 වර්ෂය හා සැසඳීමේදී, 4% ක වැඩිවීමක් වූ අතර 2008 වර්ෂය හා සැසඳීමේදී 2% ක වැඩිවීමකි. 2010 වර්ෂය අවසානයට ජල සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව 1,353,573 ක් වූ අතර එය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 6% ක වැඩිවීමකි. 2009 වර්ෂය අවසානයට වැඩිවීම 6.6% ක් විය.

නළ ජලය සඳහා ඇති විශාල ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ජල සම්බන්ධතා සඳහා පාරිභෝගිකයන්ට දීර්ඝ කාලයක් බලා සිටීමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන නළ ජල යෝජනා ක්‍රම මඟින් වර්තමානයේ ජනගහනයෙන් 39.2% ක් ආවරණය වන අතර 2015 වර්ෂය වන විට එය 45% දක්වා වැඩිකිරීමට අපේක්ෂිත ය. නළ ජල සැපයුම පිළිබඳ මණ්ඩලය විසින් දත්ත පිළියෙල කර තිබුණ ද, සමස්ථ ජල සැපයුම රජයේ දශ වර්ෂ සංවර්ධන සැලැස්මට අනුකූල ද යන්න තහවුරු කර ගැනීමට නිවැරදි දත්ත රැස් කිරීමට හා පිළියෙල කිරීමට විධිමත් පරිපාටියක් නොවී ය.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී, පද්ධති හා පාලන සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) පාලන ගිණුම් සැසඳීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) තොග
(ඈ) ගිණුම්කරණය
(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඊ) සම්පූර්ණ කළ ජල සම්පාදන ව්‍යාපෘති ප්‍රාග්ධන ගත කිරීම
(උ) අභ්‍යන්තර විගණනය



එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ආ. ස.බැ. | - | ආසියානු සංවර්ධන බැංකුව |
| ස.සා. | - | සහකාර සාමාන්‍යාධිකාරී |
| ප්‍ර.බි. | - | ප්‍රමාණන බිල්පත |
| ආ.ම. | - | ආයෝජන මණ්ඩලය |
| අ. ම.ප.ක. | - | අමාත්‍ය මණ්ඩලය පත්කළ කමිටුව |
| ප්‍ර.මූ. ස. | - | ප්‍රජා මූලික සංවිධානය |
| කො.ම. ස. | - | කොළඹ මහ නගර සභාව |
| සා.සැ. | - | සාමූහික සැලසුම් |
| ඝ.මී. | - | ඝන මීටර් |
| ඩෙ.ජා.ස.නි.ආ | - | ඩෙන්මාර්ක් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය |
| සං. | - | සංවර්ධනය |
| නි.සා. | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| මෘ.ය. | - | මෘදු යකඩ |
| ප්‍රා.ලේ. කා. | - | ප්‍රදේශීය ලේකම් කාර්යාලය |
| වි.ස. දෙ. | - | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| වි.අ. ව්‍යා. | - | විදේශ අරමුදල් ව්‍යාපෘතිය |
| උ.ඉ.ජා.ස.ස. | - | උපදේශක ඉංජිනේරුවරුන්ගේ ජාත්‍යන්තර සමිති සම්මේලනය |
| සා. | - | සාමාන්‍යාධිකාරී |
| ග්‍රා.නි. | - | ග්‍රාම නිලධාරී |
| ශ්‍රී:ලං:ර: | - | ශ්‍රී ලංකා රජය |
| භූ.ජ | - | භූගත ජලය |
| හො.ෂැ.බැ.කො. | - | හොංකොං සහ ෂැන්හායි බැන්කින් කෝපරේෂන් |
| අ.වි. | - | අභ්‍යන්තර විගණනය |
| අ.අ.පු. | - | අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් |
| ජා.ර.කු.ස. | - | ජාත්‍යන්ර රතුකුරුස සංවිධානය |
| තො.තා. | - | තොරතුරු තාක්ෂණය |
| ජා.ස.ජ.බැ. | - | ජාත්‍යන්තර සහයෝගතාවය පිළිබඳ ජපන් බැංකුව |
| ජ.ජා.ස.නි.ආ. | - | ජපන් ජාත්‍යන්ර සහයෝගිතා නියෝජිත ආයතනය |
| ප්‍ර.ණ. | - | ප්‍රතිසංස්කරණ සඳහා ණය |
| ම.ම.ස. | - | මහනුවර මහ නගර සභාව |
| කි.මී. | - | කිලෝ මීටර |
| යා.හා.ඉ. | - | යාන්ත්‍රික හා ඉංජිනේරු |
| ම.න.ස. | - | මහ නගර සභාව |
| මි.ස.පු. | - | මිනිස් බල සංවර්ධන හා පුහුණු |
| මි.ග්‍රෑ/ලී | - | මිලිග්‍රෑම් / ලීටර් |
| දි.ගැ.මි. | - | දිනකට ගැලුම් මිලියන |
| ක.තො.ප. | - | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| මි.මී. | - | මිලි මීටර් |
| අ.ගි. | - | අවබෝධතා ගිවිසුම |
| උ/මැ | - | උතුරුමැද |
| ජ.නි.ස.අ. | - | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| ජ.සැ.දෙ | - | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| අ.නො.ජ. | - | ආදායම් නොලබන ජලය |
| ජා.ජ. හා ජ.ම. | - | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| මෙ.හ.න. | - | මෙහෙයුම් හා නඩත්තුව |
| කා.භා.නි | - | කාර්ය භාර නිලධාරී |
| පි.හා.පා. | - | පිරිස් හා පාලන |
| ක්‍ර.හා.සැ. | - | ක්‍රම සම්පාදන හා සැලසුම් |
| ව්‍යා.ඇ.ක | - | ව්‍යාපෘති ඇගයුම් කමිටුව |
| ව්‍යා.අ. | - | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| ප්‍රා.ස. | - | ප්‍රාදේශිය සභාව |
| ව්‍යා.මෙ.ක. | - | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව |
| ප.හා.ස. | - | පර්යේෂණ හා සංවර්ධන |
| මා.ස.අ. | - | මාර්ග සංවර්ධන අධිකාරිය |
| ප්‍රා.ස.සේ.මා. | - | ප්‍රාදේශිය සභය සේවා මධ්‍යස්ථානය |
| ග්‍රා.ජ.ස. | - | ග්‍රාමීය ජල සම්පාදනය |
| ද/නැ | - | දකුණ නැගෙනහිර |
| ස.ද.අ.ස. | - | සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු සමුලුව |
| අ.පා.හා.ද.ළ. | - | අධික්ෂණ පාලන හා දත්ත ලබා ගැනීම |
| ස්.ජා.ස.නි.ආ. | - | ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනය |
| ශ්‍රී.ලං.ප්‍ර. | - | ශ්‍රී ලංකා ප්‍රමිතින් |
| කෙ.ප.සේ. | - | කෙටි පණිවුඩ සේවාව |
| ටෙ.හා කො. | - | ටෙන්ඩර් හා කොන්ත්‍රාත්තු |
| තා.ස. | - | තාක්ෂණ සභය |
| මූ.පි.ඇ. | - | මූලු පිරිවැය ඇස්තමේන්තුව |
| කො.නැ.න. | - | කොළඹින් නැගෙනහිර නගර |
| කො.උ.න. | - | කොළඹින් උතුරු නගර |
| කො.ද.න. | - | කොළඹින් දකුණු නගර |
| න.ස. | - | නගර සභාව |
| නා.ස.අ. | - | නාගරික සංවර්ධන අධිකාරිය |
| ග.නො.ජ. | - | ගණන් නොබැලූ ජලය |
| එ.ජා.ජා.ළ.අ. | - | එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල |
| ප්.නො.පො.වි.ක්. | - | ප්ලාස්ටික් නොවන පොලි විනිල් ක්ලෝරයිඩ් |
| ඇ.එ.ජ. | - | ඇමරිකා එක්සත් ජනපදය |
| ජා.ස.ඇ.එ.නි.ආ. | - | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ නියෝජිත ආයතනය |
| ජ.හා.ස. | - | ජලය හා සනීපාරක්ෂාව |
| ලෝ.සෞ.සං. | - | ලෝක සෞඛ්‍ය සංවිධානය |
| ජ.ස. | - | ජල සම්පාදනය |
| ජ.ස.හා.ස. | - | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව |
| ජ.ස.ව්‍යා. | - | ජල සම්පාදන ව්‍යාපෘතිය |
| ජ.ස.ක්‍ර. | - | ජල සම්පාදන ක්‍රමය |
| ජ.පි.ය. | - | ජල පිරියම් යන්ත්‍රාගාරය |

# සාමූහික තොරතුරු

**ආයතනයේ නම**
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**නීතිමය පදනම**
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

**ස්ථාපිත කළ දිනය**
1974.03.01 පනතකින්
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත
පනත 1992.03.11 දින සංශෝධනය කරන ලදි.
1992 අංක : 13 ජාතික ජල සම්පාදන හා
ජලාපවහන මණ්ඩල පනත (සංශෝධිත)

**ආදායම් බදු අංකය**
4090 31820

**වැට් බදු ලියාපදිංචි අංකය**
4090 31820 7000

**ප්‍රධාන කාර්යාලය**
ගාලුපාර,
රත්මලාන.
දුරකතන අංක : +94 11 2638999
+94 112637194, + 94 112611589
ෆැක්ස් අංක : +94 11 2636449
ඊමේල් : gm@waterboard.lk
වෙබ් අඩවිය : www.waterboard.lk

**රේඛීය අමාත්‍යාංශය**
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය

**ඇමතුම් මධ්‍යස්ථානය**
1939 (පැය 24 පුරා)

**පාරිභෝගික සේවා ඒකකය, ප්‍රධාන කාර්යාලය**
+94 11 2623623 (කාර්යාලීය වේලාවන් තුළ)

**බැංකුකරු**
ලංකා බැංකුව

**විගණකවරු**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
රජයේ විගණන අංශය

**මණ්ඩලීය ලේකම්**
කේ. කේ. චන්ද්‍රසිරි

**අධ්‍යක්ෂ මණ්ඩලය**

ඉංජිනේරු කරුණාසේන හෙට්ටිආරච්චි මහතා - සභාපති
කේ. ඩී. ගාමිණී ගුණරත්න මහතා - උප සභාපති
එන්. පී. තිබ්බටුමුණුව මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
වෛද්‍ය නිහාල් ජයතිලක මහතා - ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
වෛද්‍ය පී. පී. මහීපාල මහතා - අතිරේක ලේකම් (වෛද්‍ය සේවා), සෞඛ්‍ය අමාත්‍යාංශය
ඒ. කේ. සෙනෙවිරත්න මහතා - අධ්‍යක්ෂ, ජාතික අය වැය දෙපාර්තමේන්තුව
ඉංජිනේරු සනත් පනාවැන්නගේ මහතා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය

**ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය**

ඉංජිනේරු කේ. එල්. එල්. ප්‍රේමනාත් මහතා - සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු එස්. කේ. විජේතුංග මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (බටහිර)
ඉංජිනේරු බී. ඩබ්. ආර්. බාලසූරිය මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන ව්‍යාපෘති)
ඉංජිනේරු පී. ඒ. කුමාරරත්න මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මලාපවහන)
ඉංජිනේරු පී. එස්. මුණසිංහ මහත්මිය - අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා)
ඉංජිනේරු ටී. පී. ලමාබදුසූරිය මහත්මිය - අතිරේක සාමාන්‍යාධිකාරී (දකුණු/නැගෙනහිර)
ඉංජිනේරු ඩී. එන්. ජේ. ෆර්ඩිනැන්ඩු මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (ප්‍රතිපත්ති සහ සැළසුම්)
ඉංජිනේරු පී. එන්. එස්. යාපා මහත්මිය - අතිරේක සාමාන්‍යාධිකාරී (උතුරු/මධ්‍යම)

**අංශභාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු**

ඉංජිනේරු කේ. ටී. පී. ප්‍රනාන්දු මහත්මිය (ව්‍යාපෘති සම්බන්ධීකරණ)
ඩී. තොටවත්ත මහතා (මුදල්)
එච්. ආරියසේන මහතා (පිරිස් හා පාලන)
ඉංජිනේරු ඒ. ඩබ්. ගුණසේකර මහතා (වාණිජ)
ඉංජිනේරු එන්. එම්. එස්. කාලිංග (යාන්ත්‍රික හා විදුලි)
ඉංජිනේරු කේ. ටී. කරුණාදාස මහතා (තොරතුරු තාක්ෂණය)
ඉංජිනේරු පී. කේ. ශ්‍රීමාල් මහතා (සංවර්ධන)
ඉංජිනේරු ඩී. එස්. ඩී. ජයසිරිවර්ධන මහතා (ක්‍රම සම්පාදන හා සැළසුම්)
ඉංජිනේරු ආර්. එස්. සී. ජෝර්ජ් මහතා (සාමූහික සැළසුම්)
ඩබ්. ඒ. ජේ. වීරසිංහ මහතා (අභ්‍යන්තර විගණන)

**පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරු**

ඉංජිනේරු ඩබ්. බී. පී. ප්‍රනාන්දු මහතා (බටහිර - මධ්‍යම)
ඉංජිනේරු කේ. ආර්. දේවසුරේන්ද්‍ර මහතා (බටහිර - දකුණ)
ඉංජිනේරු එම්. කේ. බණ්ඩාර මහත්මිය (බටහිර - උතුර)
ඉංජිනේරු එම්. ඒ. එම්. එස්. එල්. අත්තනායක මහතා (මධ්‍යම)
ඉංජිනේරු ඩබ්. ඒ. එන්. වික්‍රමතුංග මහතා (සබරගමුව/ඌව)
ඉංජිනේරු එල්. එල්. ඒ. පීරිස් මහතා (උතුරු මැද)
ඉංජිනේරු ඩී. යු. සුමනසේකර මහතා (වයඹ)
ඉංජිනේරු ටී. ඩබ්. එස්. පෙරේරා මහතා (දකුණ - වැඩබලන)
ඉංජිනේරු එම්. කේ. හපුආරච්චි මහතා (නැගෙනහිර)
ඉංජිනේරු ඩී. එෆ්. එස්. ද එෆ්. ගුණවර්ධන මහතා (උතුර)

**ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ලෙස සේවය කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්**

ඉංජිනේරු සී. ජේ. ඩී. පෙරේරා මහත්මිය (කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය I පියවර II අදියර)
ඉංජිනේරු ජේ. ආර්. බී. නැඳුරණ මහතා (ආසියානු සංවර්ධන බැංකු 5 වන ව්‍යාපෘතිය)